# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## ශ්‍රී ලංකාව

## තිස් පස්වැනි වාර්ෂික වාර්තාව

# 2013

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 1 |
| | සභාපතිතුමියගේ කාර්ය සාධන සමාලෝචනය | 2 |
| 1. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කළමනාකරණය | 7 |
| 2. | විශ්වවිද්‍යාල කළමණාකරණය | 8 |
| 3. | ආයතන | 11 |
| 4. | විශ්වවිද්‍යාල ප්‍රවේශය | 14 |
| 5. | අධ්‍යයන සංවර්ධනය සහ අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම | 25 |
| 6. | මූල්‍ය පරිපාලනය | 43 |
| 7. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලීය සේවක සංඛ්‍යාව | 52 |
| 8. | මානව සම්පත් ප්‍රගතිය | 54 |
| 9. | යටිතල පහසුකම් සංවර්ධනය | 60 |
| 10. | තොරතුරු තාක්ෂණ සංවර්ධනය | 62 |
| 11. | උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතික | 63 |
| 12. | ශිෂ්‍ය ප්‍රජාව සම්බන්ධ කටයුතු | 64 |
| 13. | විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍ය ආධාර ලබා දීම | 64 |
| 14. | අතිගරු ජනාධිපතිතුමාගේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සංචාරය | 66 |
| 15. | ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 67 |
| 16. | ජාතික ආයතන සහ සංවිධාන සඳහා සපයන ලද සහයෝගය | 68 |
| 17. | නෛතික කටයුතු | 69 |
| 18. | විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය | 70 |
| 19. | මූල්‍ය කළමනාකරණය සහ මධ්‍යම අභ්‍යන්තර විගණනය වැඩි දියුණු කිරීම | 71 |
| 20. | සමීක්ෂණ, ප්‍රකාශන සහ පර්යේෂණ අධ්‍යයන | 71 |
| 21. | විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල | 72 |
| 22. | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 73 |

| | | |
|---|---|---|
| 23. | 2013 වර්ෂයේ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතනික චක්‍රලේඛ ලිපි | 74 |
| 24. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | 77 |
| 25. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව | 81 |
| 26. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු | 87 |
| 27. | විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2013දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | 116 |
| 28. | විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව | 120 |
| 29. | විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු | 124 |
| 30. | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | 126 |
| 31. | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව | 130 |
| 32. | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු | 135 |

# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## හැඳින්වීම

විශ්වවිද්‍යාල පද්ධතියේ ප්‍රධාන ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 1978 දෙසැම්බර් මස 22 වන දින පිහිටුවන ලදී. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, උසස් අධ්‍යාපන ආයතන වලට අරමුදල් වෙන්කිරීම, අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම, උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලන නියාමක සහ උසස් අධ්‍යාපන ආයතනවලට ශිෂ්‍යයින් ඇතුළත් කිරීමේ නියාමක තීරණය කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යයන් වේ.

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම

**වසර 2020 වන විට ශ්‍රී ලංකාව කලාපීය දැනුම් මූලස්ථානය බවට පත් කිරීම සහ ආසියාවේ උසස් අධ්‍යාපනයේ නියමුවකු බවට පත් කිරීම**

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙහෙවර

ජාතික සංවර්ධනයට සමාන්තරව ගුණාත්මක ඉගැන්වීම් ඉගෙනුම්, උසස් තත්වයේ පර්යේෂණ, නව ව්‍යවසායකත්වය, ව්‍යුහාත්මක ප්‍රජා සහභාගීත්වය, සාමය හා සමඟිය සහ ක්‍රමෝපායශීලී ජාත්‍යන්තර සහයෝගීතාවට කැපවූ ස්ථිර, පුළුල් පිළිගැනීමක් සහ වැඩි ඉඩ ප්‍රස්තා සහිත උසස් අධ්‍යාපන පද්ධතියක් යහපාලනය සහ කළමනාකරණය මගින් මගපෙන්වීම, ස්ථාපනය කිරීම සහ සංවර්ධනය කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙහෙවරයි.

## සභාපතිතුමියගේ කාර්ය සාධන සමාලෝචනය

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියෙහි කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී මඟපෙන්වීමට සහ එම කාර්යයන් සම්බන්ධීකරණය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එම පද්ධතියේ මූලස්ථානයේ පිහිටුවීමට 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් විධිවිධාන සලසන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම් වනුයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා අරමුදල් වෙන් කිරීම, අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම, උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ශිෂ්‍යයින් ඇතුළත් කිරීමේ නියාමක තීරණය කිරීම සහ කොමිෂන් සභාව යටතේ පවතින සියලුම ආයතනයන්හි ප්‍රගතිය සහ සංවර්ධනය උදෙසා සහයෝගය දැක්වීම වේ .

2013 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉටුකරන ලද කාර්යයන් මෙම වාර්ෂික වාර්තාව මගින් සමාලෝචනය කෙරේ. වර්ෂය තුළ දී ශිෂ්‍යයින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය, ශිෂ්‍ය කටයුතු, කාර්ය මණ්ඩල සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තොරතුරු තාක්ෂණ සංවර්ධනය, තත්ත්ව සහතික, මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය සහ විදේශ විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන සහ පර්යේෂණ සහයෝගීතාව යන ක්ෂේත්‍රයන්හි ඉහළ ප්‍රගතියක් සහ දියුණුවක් දක්නට ලැබී තිබේ.

## විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලට ශිෂ්‍යයින් ඇතුළත් කිරීම

විෂය නිර්දේශ දෙකක් යටතේ පැවති 2011 අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිට සමත් ශිෂ්‍යයින් විශ්වවිද්‍යාල සඳහා තෝරාගැනීමේ නිර්ණායක, ශිෂ්‍යයින් අධිකරණ ක්‍රියාමාර්ගයන්ට එළඹීම හේතුවෙන් අභියෝගයට ලක් වූ බැවින් ඔවුන්ව විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම 2012 වර්ෂ අවසානය වන තෙක් ප්‍රමාද වූ අතර ගොනුගත කළ අංක 29/2012 හා 418/2012 දරන මූලික අයිතිවාසිකම් නඩු සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදෙන ලද නියෝග අනුව 2013 වර්ෂය මුලදී විශ්වවිද්‍යාලවලට එම ශිෂ්‍යයින් ඇතුළත් කර ගන්නා ලදී. මීට අමතරව 2012 අගෝස්තු මස පැවති අ.පො.ස උසස් පෙළ විභාග ප්‍රතිඵල මත 2012/2013 අධ්‍යයන වර්ෂයට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ශිෂ්‍යයින් තෝරා ගැනීම ද 2013 වර්ෂය තුළදී සිදු කෙරිණි.

මේ අනුව 2011 අගෝස්තු සහ 2012 අගෝස්තු පැවැත්වුණු අ.පො.ස (උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් තෝරා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සිදුවීම හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් 2013 වර්ෂය සුවිශේෂී විය.

2011/2012 අධ්‍යයන වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කරුවන් 141,411 ක් සුදුසුකම් ලැබූ අතර සාමාන්‍ය හා විශේෂ විධිවිධාන යටතේ එයින් 28,908 දෙනෙක් සඳහා උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීමේ අවස්ථා හිමි විය. මෙය පසුගිය අධ්‍යයන වර්ෂය සමඟ සැසඳීමේ දී සාමාන්‍ය හා විශේෂ විධිවිධාන යටතේ 6,892 ක ඉහළ යාමක් දක්නට ලැබේ. එම ඉහළ යාම ප්‍රධාන වශයෙන් තොරතුරු තාක්ෂණය, ව්‍යවහාරික විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන ආදී ක්ෂේත්‍රවල පවතින වෘත්තීය පාඨමාලාවන්හි දක්නට ලැබිණි.

2012/2013 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කරුවන් 144,816 ක් සුදුසුකම් ලැබූහ. එම වර්ෂය සඳහා උපයෝගී කරගත් නිර්ණායක අනුව සාමාන්‍ය ප්‍රවේශය යටතේ ඔවුන්ගෙන් 22,943 උසස් අධ්‍යාපන ආයතන සඳහා ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ අතර 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා විශේෂ විධිවිධාන යටතේ තෝරා ගැනීම පිළිබඳව 2013 වර්ෂ අවසානය දක්වා අවසන් තීරණයකට එළඹී නොතිබුණි.

## අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය

පසුගිය වර්ෂය හඳුන්වා දුන් එක් ප්‍රථම උපාධි පාඨමාලාවට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ හඳුන්වා දෙන ලද ප්‍රථම උපාධි පාඨමාලා සංඛ්‍යාව 12 කි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යයන සංවර්ධනය වෙනුවෙන් ගනු ලැබූ වැදගත් පියවරක් වශයෙන් භාෂා පරිවර්තන උපාධිධාරී හිඟයට විසඳුමක් වශයෙන් කැළණිය, යාපනය සහ සබරගමුව යන විශ්වවිද්‍යාල තුනෙහි ආරම්භ කිරීමට නියමිත භාෂා පරිවර්තන විශේෂවේදී උපාධි පාඨමාලාව සඳහා ආදර්ශ විෂයමාලාවක් හඳුන්වාදීම හඳුන්වා දිය හැකිය. එමෙන්ම, පසුගිය වර්ෂය තුළදී අනුමත කරන ලද පශ්චාත් උපාධි පාඨමාලා 6 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී උසස් / වැඩිදුර අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවීම සඳහා නව පශ්චාත් උපාධි පාඨමාලා 28 ක් ද හඳුන්වා දීමට අනුමැතිය ලබාදෙන ලදී. මේ සඳහා මාස තුනකට වඩා අඩු කාලයක් තුළ අනුමැතිය ලබාදීම සඳහා විධිමත් පරීක්ෂාවක් සහ සමාලෝචන යාන්ත්‍රණයක් අනුගමනය කොට තිබිණි.

විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා හඳුන්වා දීමට නියමිත තාක්ෂණ විද්‍යා පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට, තාක්ෂණ විෂයන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට උපදෙස් දීම සඳහා විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ නව ස්ථාවර කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිහිටුවන ලදී. මෙය ප්‍රධාන ලෙසම අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් අලුතින් හඳුන්වාදෙන ලද තාක්ෂණ විෂය ධාරාව යටතේ අ.පො.ස. (උසස් පෙළ) සඳහා පෙනී සිටින අයදුම්කරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට අත්‍යවශ්‍ය වේ. 2015 අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත 2016 වර්ෂයේ දී තාක්ෂණික විෂය ධාරාව සඳහා අවම වශයෙන් ශිෂ්‍යයින් 1500 ක ගෙන් සමන්විත ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායමක් බඳවා ගැනීමට යෝජනා වී තිබේ.

උසස් අධ්‍යාපන ආයතනයන්හි පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීමෙහිලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු කාර්යභාරයේ එක අංගයක් වශයෙන් කලාපීය සහ ජාතික සංවර්ධනයට අදාළ නව්‍යකරණ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නව පර්යේෂණ ප්‍රදාන ක්‍රමයක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ආරම්භ කරන ලදී. මෙම කාර්යයේ දී රු.මිලියන 53 ක් වූ මුදල සම්පාදනය කර ගැනීම සඳහා අතිරේක අරමුදල් වෙන් කළ අතර, පර්යේෂණ කාර්යය සඳහා උපදෙස් දීම සහ උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි පර්යේෂණ උපදේශක කමිටුවක් පිහිටුවන ලදී. විදේශ විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන සහ පර්යේෂණ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා අවස්ථාව සැලසීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී. එබඳු විදේශ විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් කිහිපයක් අත්සන් කළ අතර ඉන්දියාවේ ජේන් විශ්වවිද්‍යාලය (Jain University India) සමඟ ඇති කර ගත් පර්යේෂණ සහයෝගීතාව යටතේ සම්බන්ධ කටයුතු මේ වන විටත් ආරම්භ කර තිබීම වැදගත් සන්ධිස්ථානයක් ලෙස දක්නට හැකිය.

මෙම වර්ෂය තුළ දී අතිගරු ජනාධිපතිතුමාගේ, වෙනත් ශ්‍රේෂ්ඨ උගතුන්ගේ සහ විවිධ ක්ෂේත්‍රයන්හි නියැලෙන විශේෂ පුද්ගලයින්ගේ ද සහභාගීත්වයෙන් ජාතික වැදගත්කමින් යුත් කරුණු පිළිබඳව ජාතික / අන්තර්ජාතික මට්ටමේ සමුළු කිහිපයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙහෙයවන ලදී.

සංවර්ධනය විය යුතු විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්තිමය ගැටළු, අවස්ථා සහ ආයතනික, තාක්ෂණික සහ යටිතල පහසුකම් සම්බන්ධ ගැටළු හඳුනාගැනීම සහ නිදන්ගත වකුගඩු රෝගය වැනි උසස් පර්යේෂණ ප්‍රමුඛතාව ලබාදිය යුතු අංශ හඳුනාගැනීම සහ අධ්‍යයන ක්ෂේත්‍රය සහ අදාළ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ ශක්තිමත් සම්බන්ධතා ගොඩනඟා ගැනීමේ අරමුණින් උසස් ඉගෙනුම් සඳහා වන අග්නිදිග ආසියාතික සංගමය (Association of Southeast Asian Institutions of Higher Learning) , ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය (Petroleum Resource Development Secretariat), ජෝන් කීල්ස් සමාගම (John Keels Company) සහ මයික් ෆ්ලෝරා පුද්ගලික සමාගම [Mike Flora (Pvt.) Ltd] ආදී රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටු විසින් තවත් වැඩමුළු කීපයක් සංවිධානය කරන ලදී.

## ශිෂ්‍ය කටයුතු

රාජ්‍ය විශ්වවිද්‍යාලවලට එහි ප්‍රධාන කාර්යය ඉටුකිරීම සහ ආයතනයේ මූලික වටිනාකම් සහ මූලධර්ම ආරක්ෂා කරගැනීම සහ පවත්වාගෙන යාම සඳහා සහයෝගය දැක්වීමට අවස්ථාව සැලසීම සඳහා සහයෝගය දැක්වීමට සහ දායකත්වය සැපයීමට ශිෂ්‍යයින් උනන්දු කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2013 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තියක් නිකුත් කරන ලදී.

සියලුම ශිෂ්‍ය ප්‍රජාවන් අතර සමගිය ඇති කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපනය (HETC) ව්‍යාපෘතිය සමඟ ඒකාබද්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද විශ්වවිද්‍යාල සංස්කෘතික උළෙල 2013 ජූනි මස පවත්වන ලදී. එමෙන්ම ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ ආගමික නායකයින්ගේ සහ සිවිල් සමාජයේ ශ්‍රේෂ්ඨ පුද්ගලයින්ගේ සාමාජිකත්වයෙන් යුතු විශ්වවිද්‍යාල අතර සමගිය පිළිබඳ උපදේශක කමිටුවක් සහ මෙහෙයුම් කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි පිහිටුවන ලදී.

"සාම අධ්‍යයනය" සියලු උපාධි පාඨමාලාවන් වල අනිවාර්ය පාඨමාලා ඒකකයක් විය යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී තීරණය කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසන ලෙස විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන දැනුවත්කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ දී මහපොළ ශිෂ්‍යත්වලාභී ශිෂ්‍ය සංඛ්‍යාව 39,471 වූහ. එසේම ශිෂ්‍යාධාර ලාභී ශිෂ්‍ය සංඛ්‍යාව 28,983 ක්ද පරිත්‍යාග ශිෂ්‍යාධාර / වෙනත් ශිෂ්‍යත්වලාභී ශිෂ්‍ය සංඛ්‍යාව 55 ක් වූහ. පසුගිය වර්ෂය සමඟ සැසඳීමේ දී ශිෂ්‍යාධාර ලාභීන් සංඛ්‍යාව ප්‍රතිශතයක් වශයෙන් 24% කින් වර්ධනය වූ අතර ඊට අනුරූපව මහපොළ ශිෂ්‍යත්වලාභීන් වර්ධනය වී ඇත්තේ 19% කින් පමණි.

## කාර්ය මණ්ඩල සංවර්ධනය

විශ්වවිද්‍යාල පද්ධතියේ අනුමත මුළු සේවක සංඛ්‍යාව 21,656 දක්වා වර්ධනය කරමින් මහා භාණ්ඩාගාරය විසින් 2013 වර්ෂයේ දී නව සේවක තනතුරු 613 ක් අනුමත කරන ලදී. අනුමත කරන ලද නව සේවක තනතුරු අතුරින් තනතුරු 218 ක් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහාය.

පරිපාලන හා මූල්‍ය අංශයේ නිලධාරී ශ්‍රේණිවලට අලුතින් ඇතුළත් වූ සියලුම නිලධාරීන් සඳහා නිර්මාණය කර ඇති, "විශ්වවිද්‍යාල සේවයේ පරිපාලන හා මූල්‍ය අංශ නිලධාරී සේවා සමාරම්භක පුහුණු පාඨමාලාව" 2013 වර්ෂයේ මැයි මස ආරම්භ විය. එය තෙමසක් තුළ අඛණ්ඩව (මසකට එක් සතියක් බැගින්) පුහුණු සැසි තුනක් වශයෙන් පැවැත්විණි. අදාල ක්ෂේත්‍රවල විශේෂඥ දැනුම ඇති පුද්ගලයින් විසින් මේ සඳහා අවශ්‍ය වන පුහුණු අත්පොත් සකස් කරන ලදී.

මීට අමතරව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කාර්ය සමාරම්භක පුහුණු පාඨමාලා කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන පහළොවේ දී විධිමත්ව පැවැත්වුණු අතර අධ්‍යයන, පරිපාලන, මූල්‍ය, විධායක, කාර්මික, අනධ්‍යයන, ලිපිකරු හා සුළු සේවක යන කාණ්ඩ සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන්, වැඩමුළු, බාහිර පුහුණු පැවැත්විණි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආසන්න වශයෙන් රු. මිලියන 50 ක් කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන වෙනුවෙන් වෙන්කර ඇති අතර ප්‍රථම වතාවන් දෙකක දී ලබා දෙන ලද අරමුදල් වලින් ආරම්භ කරන ලද කාර්යය / වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහාත්, නව කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමට සහ ආරම්භ කිරීමට එක් එක් මධ්‍යස්ථාන සඳහා රු.මිලියන 2 බැගින් රු.මිලියන 30ක් 2013 වර්ෂයේ දී වෙන් කරන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රතිපත්තියට අනුව අධ්‍යයන කටයුතු පරිපාලනයේ සැපයීමේ විශිෂ්ටතම ආයතනය පත්වීමේ ඉලක්කයට ළඟාවීම සඳහා නව පශ්චාත් උපාධි පර්යේෂණ ප්‍රදාන ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීමට,

ජාතික ප්‍රතිපත්ති අනුගමනය කරමින් කලාපීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා කලාපීය අවශ්‍යතා හා ගැටළු පිළිබඳව සළකා බැලිය හැකි ආකාරයේ පශ්චාත් උපාධි පර්යේෂණවල යෙදීම සඳහා රු. මිලියන 35.0 ක මුදලක් ප්‍රදානය කරන ලදී. මීට අමතරව දේශීය පර්යේෂණ ප්‍රදාන ක්‍රමය යටතේ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත රු.මිලියන 8.8 ක් වටිනා ප්‍රදාන ලබා දෙන ලදී. එමෙන්ම එයින් රු.මිලියන 6.8 ක මුදලක් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා විදේශ රටවලට ගොස් පශ්චාත් උපාධි ලබා ගැනීමට අවශ්‍ය වන ගුවන් ගමන් ගාස්තු සඳහා ප්‍රදානය කෙරිණි.

## යටිතල පහසුකම් සංවර්ධනය

මහා භාණ්ඩාගාරය විසින් පනවන ලද නොයෙකුත් සීමාවන්ගෙන් අනතුරුව වර්ෂය අවසාන වනවිට 2012 වර්ෂයේ දි ලද රු.මිලියන 5,504 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල නව ඉදිකිරීම් සහ ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත්පත් කරගැනීම් සහ 2013 ශිෂ්‍ය ශක්‍යතා සංවර්ධන වැඩසටහන් ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා රු: මිලියන 5,590 ක මුදලක් ලැබිණි. වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැඩි පරීක්ෂාවට සහ ඇගයීමට ලක් කිරීමෙන් අනතුරුව නව ඉදිකිරීම් ව්‍යාපෘති 39 ක් අනුමත කරන ලදී. 2013 වර්ෂයේ දී ව්‍යාපෘති 26 ක් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ භෞතික වශයෙන් ආරම්භ කළ අතර රු. මිලියන 10,201.92 ක් වටිනා ව්‍යාපෘති 48 ක් සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ ක්‍රියාවලියේ විවිධ මට්ටම්වල පැවතිණි. සම්පූර්ණ ඇස්තමේන්තු ගත වියදම වන රු.මිලියන 1551.5 ක් වටිනා ව්‍යාපෘති 13ක් (පසුගිය වසර සමඟ සමානව ) සම්පූර්ණ කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දී ඇත.

තවද 2013 වර්ෂයේ නේවාසිකාගාර ඉදිකිරීමේ කඩිනම් ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 13,860 ක් වටිනා නේවාසිකාගාර 30ක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබිණ.

## තොරතුරු තාක්‍ෂණ සංවර්ධනය

පසුගිය වසරේ වැය කරන ලද රු. මිලියන 50 සමඟ සැසඳීමේ දී 2013 වර්ෂයේදී රු.මිලියන 11,397 කට ආසන්න මුදලක් විශ්වවිද්‍යාල පද්ධතියේ තොරතුරු තාක්‍ෂණ පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කරන ලදී.

## තත්ත්ව සහතික සහ ප්‍රතීතන

විශ්වවිද්‍යාලයෙහි අභ්‍යන්තර තත්ත්ව සහතික කටයුතු ශක්තිමත් කිරීමේ අරමුණින් අභ්‍යන්තර තත්ත්ව සහතික පිළිබඳ අත් පොතක් සැකසූ අතර ප්‍රතීතන ක්‍රියාවලිය ආරම්භ කිරීම සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි (රාජ්‍ය සහ පෞද්ගලික) ප්‍රතීතන කටයුතු සඳහා සහයෝගය දැක්වීමට ප්‍රතීතන සඳහා අත්පොතක් නිර්මාණය කිරීමට ප්‍රතීතන වැඩසටහන යටතේ වැඩමුළු තුනක් පවත්වන ලදී.

තත්ත්ව සහතික නව නිපැයුම් කාණ්ඩය යටතේ "බාහිර තත්ත්ව ඇගයීම සඳහා වෙබ් අඩවි පදනම් කරගත් නිරීක්ෂණ හා ඇගයුම් ක්‍රමය" සඳහා තරඟකරුවන් 46 ක් අතුරින් නවෝත්පාදන තත්ත්ව සහතික සඳහා වූ ජාත්‍යන්තර සම්මාන හිමිකර ගැනීමට තත්ත්ව සහතික ප්‍රතීතන කවුන්සිලය සමත් වූ අතර 2013 තායිවානයේ තයිපෙයි හි දී පැවැත්වුණු ආසියානු පැසිෆික් තත්ත්ව ජාල (APQN) වාර්ෂික සමුළුවේදී ප්‍රථම තත්ත්ව සහතික ප්‍රතීතන නියෝජිත ආයතනය ලෙස පිළිගන්නා ලදී.

## මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඇස්තමේන්තු ගත කළ පරිදි 2013 වර්ෂය සඳහා රු. මිලියන 36,107 ක් ඉල්ලුම් කළ අතර මහා භාණ්ඩාගාරය විසින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 26,841 ක් මූලිකව අනුමත කරන ලදී.

අතිරේක ශිෂ්‍ය කණ්ඩායමක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම හේතුවෙන් වූ වියදම් දැරීම සඳහා වර්ෂය තුළ දී පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා පරිපූරක වෙන් කිරීම වශයෙන් පිළිවෙලින් රු.මිලියන 1,192 ක් හා රු.මිලියන 1,159 ක් වන ප්‍රදාන මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරනු ලැබිණි. පසුගිය වර්ෂය සමඟ සැසඳීමේ දී 2013 වර්ෂයේ දී පුනරාවර්තන ප්‍රදාන හා ප්‍රාග්ධන ප්‍රදාන සඳහා වෙන් කිරීමේ වැඩිවීමක් දක්නට ලැබුණු අතර එය පිළිවෙලින් 24% සහ 47% ක් ලෙස විය. අතිරේක ශිෂ්‍ය කණ්ඩායමක් බඳවා ගැනීමත් සමඟ විශ්වවිද්‍යාල පද්ධතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අවශ්‍ය වූ බැවින් ප්‍රාග්ධන ප්‍රදාන ඉහළ ප්‍රතිශතයකින් වර්ධනය කරන ලදී.

2013 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා විගණන කමිටුව සිව් වතාවක් රැස් වූ අතර විගණන කාර්ය සහ නිරීක්ෂණ කමිටුව මූල්‍ය කළමනාකරණ සඳහා සහයෝගය දැක්වීමට මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වා දෙන ලද යහපාලනය සහ කළමනාකරණ ක්‍රියාකාරීත්වය අනුව විශ්වවිද්‍යාල 15 කට සහ උසස් අධ්‍යාපන ආයතන 18 කට අදාළ කරුණු පරීක්ෂා කරන ලදී.

ඉදිරි වර්ෂවල දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල විධිමත් ක්‍රියාකාරීත්වය සහතික කරනු වස් උසස් අධ්‍යාපනයේ ඉහළම උපදේශක නියාමන ආයතනය වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමාලෝචිත වර්ෂය තුළ දී කොමිෂන් සභා චක්‍රලේඛ 14 ක් සහ ආයතන චක්‍රලේඛ 20 ක් නිකුත් කරන ලදී.

## 01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කළමනාකරණය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති, උප සභාපති සහ සාමාජිකයින් පහත පරිදි වේ;

**සභාපති**

**මහාචාර්ය එස්.වී.ඩී.ජී. සමරනායක** (2013.02.01.දක්වා)
බී.ඒ. (පේරාදෙණිය), එම්.ඒ (පේරාදෙණිය), පී.එච්.ඩී. ( ශා.ඇන්ඩෘස් - ස්කොට්ලන්තය)
දේශපාලන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

**මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම** (2013.02.01.සිට)
බී.එස්.සී (ගෞරව) - කොළඹ, එම්. ෆිල්, පී.එච්.ඩී.(ලුවේන්)
ශාක විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය.

**උප සභාපති**

**මහාචාර්ය රංජිත් සේනාරත්න**
බී.එස්.සී., එම්.ෆිල්, පී.එච්.ඩී. (වියානා), පී.එච්. ඩී. එච්.සී. (ඩර්හැම්)
කෘෂිබෝග විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, රුහුණු විශ්වවිද්‍යාලය.

**සාමාජිකයින්**

**මහාචාර්ය එච්. අබේගුණවර්ධන**
බී.එස්.සී (පේරාදෙණිය), එම්.එස්.සී සහ පී.එච්. ඩී. (ඉලිනොයිස්, ඇමරිකා එක්සත් ජනපදය)
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

**මහාචාර්ය එස්. මෝහන්දාස්**
බී.එස්.සී. (ගෞරව) - කොළඹ, පී.එච්. ඩී. (ඇඩිලේඩ්) එෆ්.අයි. රසායන, සී. රසායන
විශ්‍රාමලත් උප කුලපති, යාපනය විශ්වවිද්‍යාලය.

**මහාචාර්ය මල්කාන්ති චන්ද්‍රසේකර**
බී.ඩී.එස්. (ලංකා) පී.එච්.ඩී. (නිව් කාසල්, එක්සත් රාජධානිය)
කාය විච්ඡේද පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, රුහුණු විශ්වවිද්‍යාලය.

**විජය මලලසේකර මහතා**
එම්.ඒ(කැන්ටබරි), අධිනීතිඥ (ඉනර් ටෙම්පල්) නීතිඥ .

**මහාචාර්ය සම්පත් අමරතුංග**
බී.ඒ. ආර්ථික විද්‍යාව (විශේෂ) (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය), එම්.ඒ. ආර්ථික විද්‍යාව (කොළඹ), එම්.එස්.සී. ග්‍රාමීය සංවර්ධන ආර්ථික විද්‍යාව (සාගා), පී.එච්.ඩී. (කගොෂිමා)
ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**මහා භාණ්ඩාගාර නියෝජිත**

**පී.ඒ. අබේසේකර මහතා (2013.02.08 දක්වා)**
බී.ඒ. (ලංකා) (පේරාදෙණිය), රාජ්‍ය පරිපාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව ( ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ) ,ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව – එන්.අයි.ආර්.ඩී. (ඉන්දියා) නියෝජ්‍ය ලේකම්, මහා භාණ්ඩාගාරය.

**පුෂ්පා වෙල්ලප්පුලි මහත්මිය** (2013.03.01 සිට 2013.05.04 දක්වා)
බී.එස්.සී.( ගෞරව),එල්.එල්බී., එල්.එල්.එම්.
නියෝජ්‍ය ලේකම් මහා භාණ්ඩාගාරය.

**එස්.ආර්. ආටිගල මහතා** (2013.05.09 සිට)
බී.එස්.සී. (ගෞරව) - කොළඹ, එම්.එස්.සී. ආර්ථික විද්‍යාව (වාවික් කවෙන්ට්‍රි විශ්වවිද්‍යාලය එක්සත් රාජධානිය)
නියෝජ්‍ය ලේකම් මහා භාණ්ඩාගාරය.

**ලේකම්**

**කේ.ජී.ටී.එල් නන්දසේන මහතා**
බී.කොම් (විශේෂ) , එම්.බී.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

## 2. විශ්වවිද්‍යාල කළමනාකරණය

### 2.1 කොළඹ විශ්වවිද්‍යාලය

**කුලපති**
අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් අගරදගුරු හිමිපාණන්,

**උප කුලපති**
මහාචාර්ය ක්‍ෂණිකා හිරිඹුරේගම (2013.01.31 දක්වා)
මහාචාර්ය ටී.ආර්. ආරියරත්න (වැඩ බලන) (2013.02.01 සිට 2013.05. 21 දක්වා)
ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම (2013.05.22 සිට)

**නියෝජ්‍ය උප කුලපති**
මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා (2013.01.31 සිට)

**ලේකඛාධිකාරී**
ටී.එල්.ආර්. සිල්වා මහතා (වැඩ බලන) (2013.01.01. සිට 2013.01.31 දක්වා)
කේ.ඒ.එස්. එඩ්වඩ් මහතා (2013.02.01 සිට)

### 2.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**කුලපති**
මහාචාර්ය පී.ඩබ්. ඇපාසිංහ

**උප කුලපති**
මහාචාර්ය ඒ. සේනාරත්න

**නියෝජ්‍ය උප කුලපති**
මහාචාර්ය එච්.එම්.එස්.කේ හෙන්නායක

**ලේකඛාධිකාරී**
ආචාර්ය එම්.එන්. ජයවර්ධන

### 2.3 කැළණිය විශ්වවිද්‍යාලය

**කුලපති**
ගෞරවාචාර්ය වැලමිටියාවේ ධර්මකීර්ති ශ්‍රී කුසලධම්ම හිමි

**උප කුලපති**
මහාචාර්ය සරත් අමුණුගම

**ලේකඛාධිකාරී**
ඩබ්.එම්. කරුණාරත්න මහතා

### 2.4 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**කුලපති**
ගෞරවාචාර්ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමි

**උප කුලපති**
ආචාර්ය එන්.එල්.ඒ. කරුණාරත්න

**ලේකඛාධිකාරී**
කේ.ජී. බ්‍රිටෝ මහතා

**2.5 මොරටුව විශ්වවිද්‍යාලය**

**කුලපති**
දේශමාන්‍ය ආචාර්ය එස්. රෝලන්ඩ් සිල්වා (2013.04.07 දක්වා)
මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්. පෙරේරා (2013.04.08 සිට)

**උප කුලපති**
මහාචාර්ය ඒ.කේ.ඩබ්. ජයවර්ධන

**නියෝජ්‍ය උප කුලපති**
මහාචාර්ය ආර්.ඒ. අත්තලගේ

**ලේකබාධිකාරී**
ඒ.එල්. ජවුෆර් සාදික් මහතා (2013.01.01. සිට 2013.06.02)
ඩබ්.එල්. වින්ද්‍යා ජයසේන මහත්මිය (වැඩ බලන) (2013.06.03 සිට 2013.12.31 දක්වා)

**2.6 යාපනය විශ්වවිද්‍යාලය**

**කුලපති**
මහාචාර්ය එම්. සිවසූරිය

**උප කුලපති**
මහාචාර්ය වසන්ති අර්සරත්නම් මහත්මිය

**ලේකබාධිකාරී**
වී. කන්දීපන් මහතා

**2.7 රුහුණු විශ්වවිද්‍යාලය**

**කුලපති**
ගෞරවාචාර්ය රාජකීය පණ්ඩිත පල්ලත්තර සුමණජෝති නායක හිමි.

**උප කුලපති**
මහාචාර්ය ඒ.එල්.එස්. මෙන්ඩිස් (2013.03.08 දක්වා)
මහාචාර්ය ගාමිණී සේනානායක (2013.03.09 සිට)

**නියෝජ්‍ය උප කුලපති**
මහාචාර්ය ගාමිණී සේනානායක (2013.03.08 දක්වා)
ආචාර්ය ඒ.එම්.එන්. අලගියවන්න (2013.04.11 සිට)

**ලේකබාධිකාරී**
පී.එස්. කළුගම මිය

**2.8 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**කුලපති**
සැම්.එස්. විජේසිංහ මහතා

**උප කුලපති**
ආචාර්ය විජිත නානායක්කාර

**නියෝජ්‍ය උප කුලපති**
ආචාර්ය ජේ. ලියනගම

**ලේකබාධිකාරී**
ඩබ්.එල්. වින්ධ්‍යා ජයසේන මිය (2013.06.02 දක්වා)
ඒ.එල්. ජවුෆර් සදික් මහතා (වැඩ බලන) (2013.06.03 සිට 2013.12.31 දක්වා)

**2.9 ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය**

**කුලපති**
මහාචාර්ය යෝගා රාසනායගම්

**උප කුලපති**
**ආචාර්ය** කේ. කෝබින්දරාජා

**ලේකඛාධිකාරී**
කේ. මහේෂන් මහතා

**2.10 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය**

**කුලපති**
මහාචාර්ය ආර් එම්. ඉෂාක්

**උප කුලපති**
ආචාර්ය එස්.එම්.එම්. ස්මයිල්

**ලේකඛාධිකාරී**
එච්.ඒ. සත්තාර් මහතා

**2.11 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**

**කුලපති**
මහාචාර්ය ඒ.වී. සුරවීර

**උප කුලපති**
මහාචාර්ය කේ.එච්. රංජිත් විජයවර්ධන

**ලේකඛාධිකාරී**
ඒ.ජී. කරුණාරත්න මහතා

**2.12 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

**කුලපති**
පූජ්‍ය මහාචාර්ය කඹුරුගමුවේ වජිර හිමි
**උප කුලපති**
මහාචාර්ය එම්.එස්. රූපසිංහ

**ලේකඛාධිකාරී**
එම්.එච්. විමලසිරි මහතා (2013.08.17 දක්වා)
ටී. විජයකුමාර් මහතා (වැඩ බලන) (2013.08.18 සිට 2013.10.31 දක්වා)
එම්.එම්. විමලසිරි මහතා (කොන්ත්‍රාත් පදනම මත) (2013.11.01 සිට 2013.12.31 දක්වා)

**2.13 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය**

**කුලපති**
මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක (2013.01.23 දක්වා)
මහාචාර්ය කේ.ටී. ද සිල්වා (2013.04.08 සිට)

**උප කුලපති**
මහාචාර්ය එස්.ජේ.බී.ඒ. ජයසේකර

**ලේඛකාධිකාරී**
ඊ.එම්.ජී. ඒකනායක මහතා (2013.01.01. සිට 2013.03.31 දක්වා)
ජී. පියරත්න මහතා (2013.04.01 සිට 2013.12.31 දක්වා)

**2.14 ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**

**කුලපති**
පූජ්‍ය ආචාර්ය අළුත්වැව සෝරත හිමි (2013.09.27 දක්වා)
පූජ්‍ය බෙන්ගමුවේ ධම්මදින්න හිමි (2013.10.09 සිට)

**උප කුලපති**
මහාචාර්ය ඩබ්.පී.ආර්.පී ද සිල්වා

**ලේඛකාධිකාරී**
නිල්මිණි දියබෙදනගේ මෙය

**2.15 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**

**කුලපති**
පණ්ඩිත් ආචාර්ය ඩබ්.ඩී. අමරදේව

**උප කුලපති**
මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ

**ලේඛකාධිකාරී**
බී.එම්. දයාවංශ මහතා

**3. ආයතන**

**3.1 කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**අධ්‍යක්ෂ**
මහාචාර්ය කොලින් එන්. පීරිස්

**3.2 පාලි සහ බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය**

**අධ්‍යක්ෂ**
මහාචාර්ය සුමනපාල ගල්මන්ගොඩ (2013.10.14 දක්වා)
පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි (2013.10.15 සිට)

**3.3 දේශීය වෛද්‍ය ආයතනය**

**අධ්‍යක්ෂ**
සුනිමල් සේනාරත්න මහතා (2013.08.09 දක්වා)
මහාචාර්ය කේ.කේ.ඩී.එස්. රණවීර (වැඩ බලන) (2013.08.10 සිට 2013.10.14 දක්වා)
ආචාර්ය එම්.ඩබ්.එස්.ජේ. කුමාරි මිය (වැඩ බලන) (2013.10.15 සිට)

**3.4 මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**අධ්‍යක්ෂ**
ආචාර්ය රෝහන් පී. පෙරේරා

**3.5 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**අධ්‍යක්ෂ**
මහාචාර්ය ජයන්ත ජයවර්ධන

**3.6 පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**අධ්‍යක්ෂ**
මහාචාර්ය ජගත් වීරසිංහ

**3.7 කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය**

**අධ්‍යක්ෂ**
ආචාර්ය උදිත පී. ලියනගේ (2013.08.31 දක්වා)
මහාචාර්ය කේ.බී.එම්. ෆොන්සේකා (2013.09.01 සිට)

**3.8 කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනය**

**අධ්‍යක්ෂ**
මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක

**3.9 ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය**

**අධ්‍යක්ෂ**
මහාචාර්ය ජේ.ඒ. ලියනගේ මිය.

**3.10 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**අධ්‍යක්ෂ**
මහාචාර්ය බී.එස්.බී. කරුණාරත්න (2013.03.24 දක්වා)
මහාචාර්ය එච්.එම්.ඩී.එන්. ප්‍රියන්ත (2013.03.25 සිට)

**3.11 ජාතික පුස්තකාල සහ විඥාපන අධ්‍යයන ආයතනය**

**අධ්‍යක්ෂ**
එම්.එස්.යූ. අමරසිරි මහතා

**3.12 මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණ විද්‍යා ආයතනය**

**අධ්‍යක්ෂ**
ආචාර්ය ටී.ඒ.ජී. ගුණසේකර (2013.09.05 දක්වා)
එම්.එම්.පී.ඩී. සමරසේකර මිය (2013.09.06 සිට)

**3.13 ජෛව රසායන, අණුක ජෛව විද්‍යා සහ ජෛව තාක්‍ෂණ ආයතනය.**

**අධ්‍යක්ෂ**
මහාචාර්ය කේ.එච් තෙන්නකෝන් (වැඩබලන) (2013.01.01සිට 2013.03.31 දක්වා)
මහාචාර්ය රිස්වි ෂෙරීෆ් (වැඩ බලන) (2013.04.01 සිට)

**3.14 ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයනායතනය**

**අධ්‍යක්ෂ**
ආචාර්ය කේ.ප්‍රේමකුමාර්

**3.15 ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය**

**අධ්‍යක්ෂ**
ආචාර්ය එච්.වී.එම්. රත්වත්තේ මිය

**3.16 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය**

**අධ්‍යක්ෂ**
ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක (වැඩ බලන)

**3.17 කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය**

**අධ්‍යක්ෂ**
ආචාර්ය නිශාන්ත පෙරේරා (වැඩ බලන) (2013.05.19 දක්වා)
එම්.පී. පියතිලක මහතා (2013.05.20 සිට)

## 4. විශ්වවිද්‍යාල ප්‍රවේශය

විෂය නිර්දේශ දෙකක් යටතේ පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට සමත් ශිෂ්‍යයින් අධිකරණ ක්‍රියාමාර්ගයන්ට එළඹීම හේතුවෙන් විශ්වවිද්‍යාල සඳහා තෝරා ගැනීමේ නිර්ණායක අභියෝගයට ලක් වූ බැවින් ඔවුන්ව විශ්වවිද්‍යාල වලට ඇතුළත් කිරීම 2012 වර්ෂ අවසානය වන තෙක් ප්‍රමාද වූ අතර ගොනුගත කළ අංක 29/2012 හා 418/2012 දරන මූලික අයිතිවාසිකම් නඩු සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද නියෝග අනුව 2013 වර්ෂය මුල දී විශ්වවිද්‍යාලවලට එම ශිෂ්‍යයින් ඇතුළත් කර ගන්නා ලදී.

එමෙන්ම 2012 අගෝස්තු මස පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත 2012/2013 අධ්‍යයන වර්ෂයට අදාල විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ශිෂ්‍යයින් තෝරා ගැනීම ද 2013 වර්ෂය තුළදී සිදු කෙරිණි.

මේ අනුව 2011 වර්ෂයේ අගෝස්තු මස පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත 2011/2012 අධ්‍යයන වර්ෂයට සහ 2012 අගෝස්තු මස පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත 2012/2013 අධ්‍යයන වර්ෂයට අදාලව එක් එක් උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම සඳහා කඩඉම් ලකුණු නිකුත් කිරීමට සිදුවූ බැවින් 2013 වර්ෂය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සුවිශේෂී වසරක් විය.

### 4.1 2011/2012 සහ 2012/2013 අධ්‍යයන වර්ෂ සඳහා විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කර ගැනීම.

(1) 2011/2012 අධ්‍යයන වර්ෂයට අදාල ශිෂ්‍ය ප්‍රවේශ ප්‍රතිපත්තිය පහත සඳහන් පරිදි වේ.

ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් නඩු තීන්දු අංක 418/2012 හි පළමු ඡේදයට අනුව 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් තෝරා ගැනීමට පදනම් කරගනු ලැබුවේ පැරණි නිර්දේශය සහ නව නිර්දේශය යටතේ විභාගයට පෙනී සිටි සිසුන් එකිනෙකට වෙනස් විශේෂ ජනගහන කණ්ඩායම් 2ක් ලෙස සළකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2012.09.06 දින නිකුත් කරන ලද නව **Z** ලකුණු අනුව වේ. විශේෂ ප්‍රවේශය ද ඇතුළත්ව 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා වන සියලු ප්‍රවේශ මඟින් රජයේ විශ්වවිද්‍යාල සඳහා තෝරා ගත යුතු ශිෂ්‍ය අනුපාත පදනම පහත සඳහන් පරිදි විය ;

(අ) 2006 සිට 2010 දක්වා පස් වසර තුළ උසස් පෙළ විභාගයට ප්‍රථමවරට පෙනී සිටි සිසුන්ගෙන් වැඩිම සිසුන් ප්‍රමාණයක් දීප ව්‍යාප්ත ලකුණු පදනම හා දිස්ත්‍රික් ලකුණු පදනම මත එක් එක් උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල වලට ඇතුළත් කර ගන්නා ලද ශිෂ්‍ය අනුපාතය 2011 සිට නව විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් විශ්වවිද්‍යාල සඳහා තෝරා ගැනීමේ පදනම විය.

(ආ) 2006 සිට 2010 දක්වා පස් වසර තුළ දීප ව්‍යාප්ත ලකුණු පදනම හා දිස්ත්‍රික් ලකුණු පදනම මත වැඩිම සිසුන් ප්‍රමාණයක් එක් එක් උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කරගන්නා ලද ශිෂ්‍ය අනුපාතය අනුව 2011 වර්ෂයේ පැරණි නිර්දේශය යටතේ අ.පො.ස (උසස් පෙළ) විභාගයට දෙවන හා තෙවන වරට පෙනීසිටි සිසුන් විශ්වවිද්‍යාල සඳහා තෝරා ගැනීම සඳහා වූ පදනම විය.

(2) 2012/2013 වර්ෂය සඳහා වූ ප්‍රවේශ ප්‍රතිපත්තිය පහත සඳහන් පරිදි වේ.

(අ) 2012 වර්ෂයේ දී අ.පො.ස (උසස් පෙළ) විභාගයට නව නිර්දේශය හා පැරණි නිර්දේශය යටතේ විභාගයට පෙනී සිටි සිසුන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශයේ දී එකිනෙකට වෙනස් වූ ශිෂ්‍ය ජනගහන කණ්ඩායම් දෙකක් වශයෙන් සලකන ලදී.

(ආ) විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීම තීරණය කරනු ලැබුවේ එක් එක් උපාධි පාඨමාලා සඳහා දීප ව්‍යාප්ත කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කුසලතා පදනම මත 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වසර පහක කාලය තුළ දී පළමුවර හා දෙවනවර අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් එක්ව ද තෙවනවර විභාගයට පෙනී සිටි සිසුන් වෙන් වශයෙන්ද ලෙස විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ සිසුන්ගේ සංයුක්ත මධ්‍යකය මත පදනම්ව විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබූ 2012 වර්ෂයේ පවත්වන ලද අ.පො.ස (උසස් පෙළ) විභාගයේ විෂය නිර්දේශ දෙකම මත විභාග අපේක්ෂකයන් ලබාගත්නා ලද Z ලකුණු මධ්‍යකයේ කුසලතා අනුපිළිවෙල මතය.

(3) 2011/2012 සහ 2012/2013 අධ්‍යයන වර්ෂ සඳහා කලා අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම දීපව්‍යාප්ත ලකුණු පදනම මත දිස්ත්‍රික් අතර අධ්‍යාපන පහසුකම්වල අසමානතාවන් අඩු යැයි සළකා සමස්ත දිවයිනටම පොදු වශයෙන් සකස් කරන ලද ලකුණු පදනම මත සිදුකරන ලදී. නමුත් 1993/1994 සහ 2002/2003 අධ්‍යයන වර්ෂයන් වල දී ඒ ඒ පාඨමාලා වලට ඇතුළත් කර ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාවෙහි උපරිමයට වඩා අඩු නොවන පරිදි එය සිදු කරන ලදී.

(4) කලා අධ්‍යයන පාඨමාලාව හැර අනෙකුත් සියලුම අධ්‍යයන පාඨමාලා සඳහා එක් එක් පාඨාලාව සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40% ක් දක්වා දීපව්‍යාප්ත ලකුණු පදනම මතද ඉතිරි 60% ක් පහත දක්වා ඇති ආකාරයට දිස්ත්‍රික් පදනම මතද සම්පූර්ණ කරන ලදී.

(අ) එක් එක් අධ්‍යයන පාඨමාලාව සඳහා වෙන්වූ ස්ථාන සංඛ්‍යාවෙන් 55% ක් දක්වා පරිපාලන දිස්ත්‍රික්ක 25 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව එනම් දිවයිනේ මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා අනුපාතයට අනුව බෙදන ලදී.

(ආ) එක් එක් අධ්‍යයන පාඨමාලාව සඳහා වෙන් වූ ස්ථාන සංඛ්‍යාවෙන් 5% ක් අඩු අධ්‍යාපනික පහසුකම් සහිත පහත සඳහන් දිස්ත්‍රික් 16 අතර එම සමස්ත ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා අනුපාතයට අනුව බෙදන ලදී.

| | |
|---|---|
| නුවරඑළිය | මඩකලපුව |
| හම්බන්තොට | අම්පාර |
| යාපනය | පුත්තලම |
| කිළිනොච්චි | අනුරාධපුර |
| මන්නාරම | පොළොන්නරුව |
| මුලතිව් | බදුල්ල |
| වව්නියා | මොණරාගල |
| ත්‍රිකුණාමලය | රත්නපුර |

කලා අධ්‍යයන පාඨමාලාව මෙන්ම අනෙකුත් පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී ද දිස්ත්‍රික් පදනම මත වෙන් කරන ලද පංගු ප්‍රමාණය 1993/1994 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂයන් දෙකෙන් ඒ ඒ පාඨමාලා වලට ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙහි උපරිමයට අඩු නොවන පරිදි සිදු විය.

ඒ අනුව 2011/2012 සහ 2012/2013 අධ්‍යයන වර්ෂ සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට සිසුන් තෝරා ගැනීම ඉහත ප්‍රතිපත්තිය අනුකූලව සිදු කරන ලදී.

(5) (අ) 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට 141,411 ක ශිෂ්‍ය සංඛ්‍යාවක් සුදුසුකම් ලද අතර ඉන් සිසුන් 28,908 කට ඉහත සඳහන් නිර්ණායක පදනම් කරගනිමින් එම අධ්‍යයන වර්ෂය සඳහා සාමාන්‍ය හා විශේෂ විධිවිධාන යටතේ උසස් අධ්‍යාපන ආයතන විශ්වවිද්‍යාල ප්‍රවේශය ප්‍රදානය කරන ලදී. පසුගිය අධ්‍යයන වර්ෂය සමඟ සැසඳීමේ දී එම වර්ෂයට වඩා තෝරා ගන්නා සිසුන් 6,892 කුගේ වැඩි වීමක් සාමාන්‍ය හා විශේෂ විධිවිධාන යටතේ දක්නට ලැබේ. තොරතුරු තාක්ෂණය, ව්‍යවහාරික විද්‍යා හා කළමනාකරණ අධ්‍යයනය වැනි වෘත්තීය පාඨමාලාවන් හි ප්‍රධාන වශයෙන් මෙම වැඩිවීම පෙන්නුම් කරන ලදී.

(ආ) 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා නව සහ පැරණි නිර්දේශ යටතේ විභාගයට පෙනීසිටි සිසුන්ගෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට සිසුන් 144,816 ක් සුදුසුකම් ලබා තිබූ අතර ඉහත සඳහන් කළ 2012/2013 වර්ෂය සඳහා උපයෝගී කරගන්නා ලද නිර්ණායක පදනම් කර ගනිමින් 22,943 ක ශිෂ්‍ය සංඛ්‍යාවකට උසස් අධ්‍යාපන ආයතන සඳහා සාමාන්‍ය විධිවිධාන යටතේ ප්‍රවේශ ප්‍රදානය කරන ලදී.

පසුගිය වර්ෂවලට සාපේක්ෂව 2011/2012 සහ 2012/2013 අධ්‍යයන වර්ෂ වලදී සාමාන්‍ය විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය ලද ශිෂ්‍ය සංඛ්‍යාවේ සංසන්දනාත්මක වගුව පහත පරිදි වේ.

| අනු අංකය | අධ්‍යයන පාඨමාලාව | 2012 / 2013 | | | 2011 / 2012 | | | 2010 / 2011 | 2009 / 2010 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | නව නිර්දේශය | පැරණි නිර්දේශය | තෝරා ගත් සංඛ්‍යාව | නව නිර්දේශය | පැරණි නිර්දේශය | තෝරා ගත් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව |
| 1 | වෛද්‍ය විද්‍යාව | 945 | 262 | 1,207 | 470 | 845 | 1,315 | 1,147 | 1,147 |
| 2 | දන්ත ශල්‍ය විද්‍යාව | 60 | 31 | 91 | 44 | 71 | 115 | 77 | 77 |
| 3 | පශු වෛද්‍ය විද්‍යාව | 74 | 35 | 109 | 55 | 91 | 146 | 102 | 100 |
| 4 | කෘෂිකර්මය | 396 | 129 | 525 | 187 | 450 | 637 | 678 | 701 |
| 5 | ආහාර විද්‍යාව හා පෝෂණය | 89 | 33 | 122 | 62 | 96 | 158 | 100 | 100 |
| 6 | ජෛවීය විද්‍යාව | 951 | 292 | 1,243 | 435 | 959 | 1,394 | 1,101 | 1,103 |
| 7 | ව්‍යවහාරික විද්‍යාව (ජෛවීය විද්‍යා) | 147 | 40 | 187 | 88 | 140 | 228 | 176 | 212 |
| 8 | ඉංජිනේරු විද්‍යාව | 1,334 | 118 | 1,452 | 790 | 772 | 1,562 | 1,247 | 1,223 |
| 9 | ඉංජිනේරු විද්‍යාව (ඊඑම්) | 46 | 26 | 72 | 39 | 45 | 84 | 50 | 49 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | ඉංජිනේරු විද්‍යාව (ටීඑම්) | 46 | 26 | 72 | 38 | 49 | 87 | 50 | 49 |
| 11 | ප්‍රමාණ සමීක්ෂණය | 87 | 26 | 113 | 63 | 84 | 147 | 100 | 98 |
| 12 | පරිගණක විද්‍යාව | 227 | 33 | 260 | 133 | 184 | 317 | 237 | 263 |
| 13 | භෞතිය විද්‍යාව | 1,543 | 244 | 1,787 | 780 | 1,174 | 1,954 | 1,650 | 1,715 |
| 14 | මැනුම් විද්‍යාව | 49 | 24 | 73 | 48 | 54 | 102 | 62 | 67 |
| 15 | ව්‍යවහාරික විද්‍යාව (භෞතිය විද්‍යා) | 320 | 61 | 381 | 157 | 269 | 426 | 320 | 344 |
| 16 | කළමනාකරණ අධ්‍යයන | 3,331 | 161 | 3,492 | 2,713 | 1,287 | 4,000 | 3,287 | 3,270 |
| 17 | දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය | 57 | 24 | 81 | 49 | 45 | 94 | 61 | 60 |
| 18 | වාණිජ්‍යය | 489 | 43 | 532 | 378 | 281 | 659 | 468 | 472 |
| 19 | කලා | 3,972 | 364 | 4,336 | 3,491 | 2,454 | 5,945 | 3,806 | 3,802 |
| 20 | කලා (එස්පී) | 131 | 15 | 146 | 93 | 80 | 173 | 150 | 146 |
| 21 | කලා (එස්ඒබී) | 183 | 15 | 198 | 123 | 110 | 233 | 198 | 198 |
| 22 | කළමනාකරණ අධ්‍යයන (ටී.වී) | 138 | 52 | 190 | 145 | 148 | 293 | 184 | 157 |
| 23 | වාස්තු විද්‍යාව | 42 | 12 | 54 | 46 | 46 | 92 | 54 | 55 |
| 24 | මෝස්තර නිර්මාණ ශිල්පය (වාස්තු විද්‍යා) | 42 | 6 | 48 | 13 | 23 | 46 | 49 | 50 |
| 25 | නීතිය | 328 | 33 | 361 | 319 | 126 | 445 | 348 | 346 |
| 26 | තොරතුරු තාක්ෂණය | 148 | 53 | 201 | 64 | 137 | 201 | 149 | 98 |
| 27 | කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය | 38 | 22 | 60 | 29 | 46 | 75 | 49 | 49 |
| 28 | රාජ්‍ය කළමනාකරණය | 70 | 25 | 95 | 67 | 51 | 118 | 75 | 75 |
| 29 | සන්නිවේදන අධ්‍යයනය | 43 | 5 | 48 | 34 | 27 | 61 | 50 | 48 |
| 30 | නගර හා ග්‍රාම නිර්මාණය | 48 | 24 | 72 | 46 | 39 | 85 | 51 | 50 |
| 31 | සාමය හා ගැටුම් නිරාකරණය | 30 | 3 | 33 | 25 | 16 | 41 | 34 | 36 |
| 32 | අයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 202 | 68 | 270 | 77 | 208 | 285 | 277 | 289 |
| 33 | යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 49 | 24 | 73 | 27 | 38 | 65 | 54 | 55 |
| 34 | විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | 32 | 6 | 38 | 25 | 19 | 44 | 39 | 39 |
| 35 | ආහාර විද්‍යාව හා තාක්ෂණය | 71 | 34 | 105 | 48 | 85 | 133 | 91 | 87 |
| 36 | සිද්ධ වෛද්‍ය විද්‍යාව | 58 | 14 | 72 | 34 | 46 | 80 | 71 | 70 |
| 37 | හෙද | 135 | 68 | 203 | 70 | 188 | 258 | 206 | 203 |
| 38 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 116 | 32 | 148 | 73 | 125 | 198 | 230 | 228 |
| 39 | කෘෂි තාක්ෂණය හා කළමනාකරණය | 142 | 60 | 202 | 75 | 178 | 253 | 203 | 210 |
| 40 | සෞඛ්‍ය ප්‍රවර්ධනය | 38 | 27 | 65 | 30 | 49 | 79 | 51 | 49 |
| 41 | ඖෂධ විද්‍යාව | 72 | 40 | 112 | 50 | 98 | 148 | 102 | 103 |
| 42 | වෛද්‍ය රසායනාගාර විද්‍යා | 63 | 44 | 107 | 44 | 98 | 142 | 100 | 99 |
| 43 | විකිරණ ශිල්පය | 31 | 24 | 55 | 32 | 40 | 72 | 36 | 34 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 44 | භෞත චිකිත්සාව | 42 | 34 | 76 | 31 | 59 | 90 | 60 | 59 |
| 45 | පරිසර සංරක්ෂණය හා කළමනාකරණය | 37 | 28 | 65 | 29 | 49 | 78 | 51 | 49 |
| 46 | පහසුකම් කළමනාකරණය | 47 | 22 | 69 | 42 | 42 | 84 | 51 | 49 |
| 47 | ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය | 45 | 24 | 69 | 32 | 47 | 79 | 51 | 49 |
| 48 | අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව | 49 | 29 | 78 | 40 | 53 | 93 | 60 | 59 |
| 49 | කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය | 77 | 24 | 101 | 37 | 54 | 91 | 60 | 58 |
| 50 | සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ | 42 | 21 | 63 | 34 | 48 | 82 | 51 | 49 |
| 51 | පරිගණනය සහ කළමනාකරණය | 47 | 25 | 72 | 46 | 37 | 83 | 51 | 50 |
| 52 | ධීවර සහ සාගර විද්‍යාව | 43 | 25 | 68 | 35 | 58 | 93 | 60 | 61 |
| 53 | ඉස්ලාම් අධ්‍යයනය | 194 | 4 | 198 | 123 | 50 | 173 | 150 | 98 |
| 54 | විද්‍යාව හා තාක්‍ෂණය | 39 | 23 | 62 | 20 | 51 | 71 | 50 | 49 |
| 55 | පරිගණක විද්‍යාව හා තාක්‍ෂණය | 40 | 25 | 65 | 30 | 49 | 79 | 49 | 49 |
| 56 | ව්‍යවසායකත්වය සහ කළමනාකරණ අධ්‍යයනය | 49 | 17 | 66 | 24 | 48 | 72 | 51 | 49 |
| 57 | සත්ත්ව පාලන විද්‍යාව | 35 | 25 | 60 | 10 | 49 | 59 | 50 | 49 |
| 58 | සංගීතය | 338 | 26 | 364 | 234 | 128 | 362 | 307 | 319 |
| 59 | නැටුම් | 295 | 32 | 327 | 221 | 109 | 330 | 293 | 288 |
| 60 | චිත්‍ර සහ නිර්මාණ | 25 | 3 | 28 | 14 | 4 | 18 | 29 | 29 |
| 61 | නාට්‍ය හා රංග කලා | 74 | 12 | 86 | 60 | 46 | 106 | 68 | 70 |
| 62 | දෘශ්‍ය හා තාක්ෂණික කලා | 45 | 5 | 50 | 36 | 21 | 57 | 50 | 50 |
| 63 | අපනයන කෘෂිකර්මය | 32 | 24 | 56 | 4 | 50 | 54 | 49 | 49 |
| 64 | තේ තාක්‍ෂණය සහ අගය වැඩි කිරීම | 33 | 23 | 56 | 6 | 40 | 46 | 50 | 49 |
| 65 | කර්මාන්ත තොරතුරු තාක්‍ෂණය | 47 | 16 | 63 | 18 | 44 | 62 | 51 | 49 |
| 66 | ඛනිජ සම්පත් සහ තාක්‍ෂණය | 33 | 20 | 53 | 13 | 39 | 52 | 50 | 49 |
| 67 | ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) | 46 | 24 | 70 | 45 | 36 | 81 | 51 | 50 |
| 68 | කළමනාකරණය සහ තොරතුරු තාක්‍ෂණය (නැගෙනහිර වි.වි) | 84 | 27 | 111 | 71 | 56 | 127 | 81 | 81 |
| 69 | ආගණනය හා තොරතුරු පද්ධති | 57 | 21 | 78 | 7 | 42 | 49 | 80 | 80 |
| 70 | ශාරීරික අධ්‍යාපනය | 41 | 16 | 57 | 7 | 11 | 18 | 35 | 37 |
| 71 | ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය | 63 | 20 | 83 | 34 | 38 | 72 | 35 | 37 |
| 72 | කථන හා ශ්‍රවන විද්‍යාව | 38 | 31 | 69 | 38 | 48 | 86 | 51 | 49 |
| 73 | අරාබි භාෂාව | 145 | 3 | 148 | 93 | 12 | 105 | 100 | 75 |
| 74 | දෘශ්‍ය කලා (මීට පෙර චිත්‍ර සහ මූර්ති කලා) | 86 | 12 | 98 | 55 | 39 | 94 | 67 | 58 |
| 75 | සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව | 37 | 29 | 66 | 29 | 49 | 78 | 51 | 49 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 76 | ආහාර නිෂ්පාදනය සහ තොරතුරු කළමනාකරණය | 45 | 29 | 74 | 36 | 56 | 92 | 60 | 59 |
| 77 | ජලජ සම්පත් තාක්ෂණය | 30 | 26 | 56 | 2 | 50 | 52 | 50 | 49 |
| 78 | තාල සහ ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම | 31 | 22 | 53 | 10 | 28 | 38 | 49 | 49 |
| 79 | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | 46 | 11 | 57 | 22 | 44 | 66 | 50 | 49 |
| 80 | තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | 88 | 27 | 115 | 36 | 43 | 79 | 51 | 34 |
| 81 | සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය (2010/2011 සඳහා නව පාඨමාලාවකි) | 90 | 31 | 121 | 56 | 64 | 120 | 101 | ප්‍රවේශ නැත |
| 82 | කෘෂි සම්පත් කළමනාකරණය සහ තාක්ෂණය (කෘෂිකර්මය ලෙස රුහුණු වි. පැවතිණි.) | 111 | 41 | 152 | 54 | 125 | 179 | ප්‍රවේශ නැත | ප්‍රවේශ නැත |
| 83 | කෘෂි ව්‍යාපාර කළමනාකරණය (2011/2012 සඳහා නව පාඨමාලාවකි) | 39 | 25 | 64 | 29 | 44 | 73 | ප්‍රවේශ නැත | ප්‍රවේශ නැත |
| 84 | හරිත තාක්ෂණය (2011/2012 සඳහා නව පාඨමාලාවකි) | 40 | 25 | 65 | 29 | 45 | 74 | ප්‍රවේශ නැත | ප්‍රවේශ නැත |
| 85 | තොරතුරු පද්ධති (කොළඹ වි.පරිගණක ආයතනයේ තොරතුරු සහ සන්. තාක්ෂණ වශයෙන් පැවති ) | 60 | 18 | 78 | 45 | 68 | 113 | ප්‍රවේශ නැත | ප්‍රවේශ නැත |
| 86 | භූමි නිර්මාණවේදය (2011/2012 සඳහා නව පාඨමාලාවකි) | 34 | 8 | 42 | 24 | 30 | 54 | ප්‍රවේශ නැත | ප්‍රවේශ නැත |
| | **අධ්‍යයන වර්ෂය සඳහා තෝරා ගෙන ඇති මුළු එකතුව** | 19,332 | 3,611 | **22,943** | 13,470 | 13,474 | **26,944** | **20,274** | **20,111** |

### 4.2 නව අධ්‍යයන පාඨමාලා

2011/2012 අධ්‍යයන වර්ෂයේ දී කෘෂි වෙළඳ කළමනාකරණය හා හරිත තාක්ෂණය (ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලය) සහ භූමි නිර්මාණවේදය (මොරටුව විශ්වවිද්‍යාලය) යන නව අධ්‍යයන පාඨමාලා 3ක් විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන පාඨමාලා ලැයිස්තුවට අලුතින් එකතු කරන ලදී.

### 4.3 විශේෂ විධිවිධාන යටතේ ප්‍රවේශය

ඉහත සඳහන් කළ සාමාන්‍ය විධිවිධාන යටතේ තෝරාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවට අමතරව පෙර වර්ෂවල දී මෙන්ම විශේෂ විධිවිධාන යටතේ පහත සඳහන් කාණ්ඩ යටතේ සිසුන් තෝරා ගන්නා ලදී. 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා එක් එක්

පාඨමාලා සඳහා විශේෂ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය ප්‍රදානය කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ. නමුත් 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා විශේෂ විධිවිධාන යටතේ ප්‍රවේශය ප්‍රදානය කරනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 2013 වර්ෂය අවසාන වන තෙක්ම තීරණය කර නොතිබිණි.

**(අ) අධ්‍යයන කටයුතු හැර ජාතික/ ජාත්‍යන්තර වශයෙන් අධ්‍යයන ක්ෂේත්‍රය හැර වෙනත් ක්ෂේත්‍රයන් හි විශිෂ්ටතා ඇති සිසුන්**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් පිරිනමන පාඨමාලා හැර අනෙකුත් සියලු පාඨමාලා සඳහා ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 0.5% හෝ එක් ස්ථානයක් යන දෙකෙන් වැඩි සංඛ්‍යාව මෙම විධිවිධාන යටතේ වෙන් කරන ලදී.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය සඳහා ඇතුළත් කර ගැනීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් මෙම කාණ්ඩය යටතේ සිසුන් ඇතුළත් කර ගැනීමට එහි තිබෙන සෑම පාඨමාලාවක් සඳහාම 4% දක්වා ස්ථාන වෙන් කර තිබුණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු ක්‍රමයක් මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද තේරීම් කමිටුවක් මගින් මෙම තේරීම් කටයුතු සිදුකරන ලදී. පසුගිය වර්ෂ සමඟ සැසඳීමේ දී 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා පහත ශිෂ්‍ය සංඛ්‍යා තෝරා ගන්නා ලදී:

| අනු අංකය | අධ්‍යයන පාඨමාලාව | 2011/2012 | | | 2010/2011 | 2009/2010 |
|---|---|---|---|---|---|---|
| | | පැරණි නිර්දේශය | නව නිර්දේශය | තෝරාගත් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව |
| 1. | වෛද්‍ය විද්‍යාව | 03 | 03 | 06 | 06 | 06 |
| 2. | දන්ත ශල්‍ය විද්‍යාව | 01 | 01 | 02 | 01 | 01 |
| 3. | පශු වෛද්‍ය විද්‍යාව | 01 | - | 01 | 01 | 01 |
| 4. | කෘෂිකර්මය | 02 | 01 | 03 | 03 | 04 |
| 5. | ආහාර විද්‍යාව හා පෝෂණවේදය | - | - | - | 01 | 01 |
| 6. | ජෛවීය විද්‍යාව | 04 | 02 | 06 | 05 | 05 |
| 7. | ව්‍යවහාරික විද්‍යාව (ජෛවීය විද්‍යා) | - | - | - | 01 | 01 |
| 8. | ඉංජිනේරු විද්‍යාව | 03 | 05 | 08 | 06 | 06 |
| 9. | ඉංජිනේරු විද්‍යාව (ඊ.එම්) | 01 | 01 | 02 | 01 | 01 |
| 10. | ඉංජිනේරු විද්‍යාව (ටී.එම්) | 01 | - | 01 | 01 | 01 |
| 11. | ප්‍රමාණ සමීක්ෂණය | 01 | 01 | 02 | 01 | 01 |
| 12. | පරිගණක විද්‍යාව | 01 | 01 | 02 | 01 | 01 |
| 13. | භෞතික විද්‍යාව | 03 | 04 | 07 | 08 | 09 |
| 14. | මැනුම් විද්‍යාව | - | - | - | 01 | 01 |
| 15. | ව්‍යවහාරික විද්‍යාව (භෞතික විද්‍යාව) | 01 | 01 | 02 | 02 | 02 |
| 16. | කළමනාකරණ අධ්‍යයන | 02 | 11 | 13 | 17 | 17 |
| 17. | දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය | 01 | 01 | 02 | 01 | 01 |
| 18. | වාණිජ්‍යය | 01 | 01 | 02 | 02 | 02 |
| 19. | කලා | 13 | 18 | 31 | 19 | 18 |
| 20. | කලා (එස්පී) | - | 02 | 02 | 02 | 02 |
| 21. | කලා (එස්ජීබී) | 01 | 02 | 03 | 02 | 02 |
| 22. | කළමනාකරණ අධ්‍යයන (ටී.වී) | 01 | 01 | 02 | 02 | 02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23. | වාස්තු විද්‍යාව | - | - | - | - | 01 |
| 24. | නීතිය | 02 | 01 | 03 | 02 | 02 |
| 25. | තොරතුරු තාක්ෂණය | - | 01 | 01 | 01 | 01 |
| 26. | කළමනාකරණ හා තොරතුරු තාක්ෂණය | 01 | - | 01 | 01 | 01 |
| 27. | රාජ්‍ය කළමනාකරණය | - | 01 | 01 | 01 | 01 |
| 28. | සන්නිවේදන අධ්‍යයනය | - | 01 | 01 | 01 | 01 |
| 29. | නගර හා ග්‍රාම නිර්මාණය | 01 | 01 | 02 | 01 | 01 |
| 30. | සාම හා ගැටුම් නිරාකරණය | - | - | - | 01 | 01 |
| 31. | අයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | - | - | - | - | 01 |
| 32. | යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | - | - | - | - | 01 |
| 33. | විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | - | - | - | 01 | |
| 34. | ආහාර විද්‍යාව හා තාක්ෂණය | 01 | - | 01 | 01 | 01 |
| 35. | සිද්ධ වෛද්‍ය විද්‍යාව | 01 | - | 01 | - | 01 |
| 36. | හෙද | 01 | - | 01 | - | |
| 37. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | - | - | - | 01 | 01 |
| 38. | කෘෂි තාක්ෂණය හා කළමනාකරණය | - | - | - | 01 | 01 |
| 39. | නැටුම් | - | 01 | 01 | | - |
| 40. | නැටුම් (සෞන්දර්ය කලා විවි) | 03 | 05 | 08 | 07 | - |
| 41. | සංගීතය (සෞන්දර්ය කලා විවි) | 02 | 05 | 07 | 06 | - |
| 42. | නාට්‍ය හා රංගකලාව(සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය) | - | 01 | 01 | 01 | - |
| 43. | සෞඛ්‍ය ප්‍රවර්ධනය | 01 | - | 01 | - | - |
| 44. | ඖෂධ විද්‍යාව | 01 | - | 01 | 01 | 01 |
| 45. | වෛද්‍ය රසායනාගාර විද්‍යාව | 01 | 01 | 02 | - | 01 |
| 46. | භෞත චිකිත්සක | 01 | - | 01 | - | 01 |
| 47. | පරිසර සංරක්ෂණය හා කළමනාකරණය | 01 | 01 | 02 | 01 | 01 |
| 48. | පහසුකම් කළමනාකරණය | - | 01 | 01 | 01 | 01 |
| 49. | ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය | 01 | 01 | 02 | 01 | 01 |
| 50. | අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව | 01 | 01 | 02 | 01 | 01 |
| 51. | කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය | 01 | - | 01 | 01 | 01 |
| 52. | සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ | - | - | - | 01 | 01 |
| 53. | පරිගණනය සහ කළමනාකරණය | - | 01 | 01 | 01 | 01 |
| 54. | ධීවර සහ සාගර විද්‍යාව | - | 01 | 01 | - | 01 |
| 55. | ඉස්ලාම් අධ්‍යයනය | - | - | - | - | 01 |
| 56. | විද්‍යාව හා තාක්ෂණය | - | - | - | 01 | 01 |
| 57. | පරිගණක විද්‍යාව හා තාක්ෂණය | - | - | - | - | 01 |
| 58. | ව්‍යවසායකත්වය සහ කළමනාකරණ අධ්‍යයනය | - | - | - | 01 | 01 |
| 59. | සත්ත්ව පාලන විද්‍යාව | - | - | - | 01 | - |
| 60. | නැටුම් (ශ්‍රී ජපුර විවි) | - | - | - | - | 01 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 61. | නැටුම් (සෞන්දර්ය කලා විවි) | - | - | - | - | 07 |
| 62. | සංගීතය (සෞන්දර්ය කලා විවි) | - | - | - | - | 06 |
| 63. | නාට්‍ය හා රංගකලාව (ස්වාමි විපු.සෞ.ආ) | 01 | 01 | 02 | 01 | 01 |
| 64. | අපනයන කෘෂිකර්මය | - | - | - | 01 | 01 |
| 65. | තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම | - | - | - | 01 | 01 |
| 66. | කර්මාන්ත තොරතුරු තාක්ෂණය | - | - | - | 01 | 01 |
| 67. | ඛනිජ සම්පත් සහ තාක්ෂණය | - | - | - | 01 | 01 |
| 68. | ව්‍යාපාර තොරතුරු පද්ධතිය (විශේෂ) | - | - | - | 01 | 01 |
| 69. | කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (එස්.ඊ.යූ.එස්.එල්) | - | 01 | 01 | 01 | 01 |
| 70. | ආගණනය හා තොරතුරු පද්ධති | - | - | - | 01 | 01 |
| 71. | ශාරීරික අධ්‍යාපනය | - | - | - | 01 | 01 |
| 72. | ක්‍රීඩා විද්‍යාව සහ  කළමනාකරණය | - | - | - | 01 | 01 |
| 73. | කථන හා ශ්‍රවණ විද්‍යාව | 01 | 01 | 02 | 01 | 01 |
| 74. | දෘශ්‍ය කලා (චිත්‍ර සහ මූර්ති කලා ලෙස පැවති) | - | - | - | - | 02 |
| 75. | සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව | - | 01 | 01 | 01 | - |
| 76. | ආහාර නිෂ්පාදනය සහ තොරතුරු කළමනාකරණය | - | - | - | 01 | - |
| 77. | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | - | - | - | 01 | 01 |
| 78. | තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | 01 | - | 01 | 01 | 01 |
| 79. | සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය(2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා වන නව පාඨමාලාවකි) | - | 01 | 01 | 01 | ප්‍රවේශ නැත |
| 80. | කෘෂි සම්පත් කළමනාකරණය සහ තාක්ෂණය (කෘෂිකර්මය ලෙස රුහුණු විශ්වවිද්‍යාලයෙහි පැවති) | 01 | 01 | 02 | ප්‍රවේශ නැත | ප්‍රවේශ නැත |
| 81. | කෘෂි ව්‍යාපාර කළමනාකරණය (2011/2012 සඳහා නව පාඨමාලාවකි) | 01 | 01 | 02 | ප්‍රවේශ නැත | ප්‍රවේශ නැත |
| 82. | හරිත තාක්ෂණය (2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා නව පාඨමාලාවකි) | 01 | - | 01 | ප්‍රවේශ නැත | ප්‍රවේශ නැත |
| 83. | තොරතුරු පද්ධති (කොළඹ වි.වි පරිගණක ආයතනයෙහි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව වශයෙන් පැවතිණි) | 01 | - | 01 | ප්‍රවේශ නැත | ප්‍රවේශ නැත |
| | **අධ්‍යයන වර්ෂය සඳහා තෝරාගත් මුළු සංඛ්‍යාව** | **69** | **87** | **156** | **138** | **144** |

**(ආ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා විදේශ සුදුසුකම් ලත් සිසුන් ඇතුළත් කර ගැනීම.**

සමාලෝචිත වර්ෂයේදී පවත්නා නීති රීති අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විදේශ සුදුසුකම් සහිත සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශ අත් පොතෙහි නියම කර ඇති කොන්දේසි ප්‍රකාර පවත්නා සෑම අධ්‍යයන පාඨමාලාවල සම්පූර්ණ සංඛ්‍යාවෙන් 0.5% දක්වා ස්ථාන වෙන් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවෙන්

**(ආ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා විදේශ සුදුසුකම් ලත් සිසුන් ඇතුළත් කර ගැනීම.**

සමාලෝචිත වර්ෂයේදී පවත්නා නීති රීති අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විදේශ සුදුසුකම් සහිත සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශ අත් පොතෙහි නියම කර ඇති කොන්දේසි ප්‍රකාර පවත්නා සෑම අධ්‍යයන පාඨමාලාවල සම්පූර්ණ සංඛ්‍යාවෙන් 0.5% දක්වා ස්ථාන වෙන් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වන ලද ශ්‍රී ලංකාවේ අ.පො.ස (උසස් පෙළ) විභාගයට සමාන ලෙස සළකන විදේශ විභාග වලදී කැපී පෙනෙන ප්‍රතිඵල ලබාගන්නා ලද අයදුම්කරුවෝ මෙම කාණ්ඩය යටතේ සුදුසුකම් ලබන අතර පහත සඳහන් සංඛ්‍යාවන් තෝරා ගන්නා ලදී.

| අනු අංකය | අධ්‍යයන පාඨමාලාව | තෝරාගත් සංඛ්‍යාව 2011/2012 | තෝරාගත් සංඛ්‍යාව 2010/2011 | තෝරාගත් සංඛ්‍යාව 2009/2010 |
|---|---|---|---|---|
| 1. | වෛද්‍ය විද්‍යාව | 06 | 06 | 07 |
| 2. | දන්ත ශල්‍ය විද්‍යාව | 01 | - | 01 |
| 3. | පශු වෛද්‍ය විද්‍යාව | 01 | - | - |
| 4. | ඉංජිනේරු විද්‍යාව | 04 | 01 | 02 |
| 5. | ශාරීරික විද්‍යාව | 02 | - | - |
| 6. | කළමනාකරණ අධ්‍යයන | **-** | **-** | **01** |
| 7. | පරිගණක විද්‍යාව | - | 01 | - |
| 8. | ජෛවීය විද්‍යාව | - | 01 | - |
| | **එකතුව** | **14** | **09** | **11** |

මීට අමතරව 2011 වර්ෂයේ සිට සෑම අධ්‍යයන පාඨමාලාවක් වෙනුවෙන්ම යෝජිත ප්‍රවේශ සංඛ්‍යාවට වඩා 4.5% ඉඩ කඩ ප්‍රමාණයක් ගෙවීමේ පදනම යටතේ විදේශ සුදුසුකම් ලත් විදේශ සිසුන් සහ ශ්‍රී ලාංකීය සිසුන් සඳහා වෙන් කරන ලදී. තෝරා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

| අධ්‍යයන පාඨමාලාව | තෝරාගත් සංඛ්‍යාව 2011/2012 | තෝරාගත් සංඛ්‍යාව 2010/2012 |
|---|---|---|
| වෛද්‍ය විද්‍යාව | 36 | 12 |
| දන්ත ශල්‍ය විද්‍යාව | 03 | 4 |
| ඉංජිනේරු විද්‍යාව | 02 | - |
| **එකතුව** | **41** | **16** |

**(ඇ) සන්නද්ධ සේවා නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම.**

මෙම විධිවිධාන යටතේ හමුදා සේවයේ, පොලිස් සේවයේ ස්ථිර සේවයේ නියුක්ත සන්නද්ධ සේවා නිත්‍ය නිලධාරීන් සහ මෙහෙයුම් ප්‍රදේශයන්හි සේවයේ නිරත විශේෂ කාර්ය බලකායේ නිත්‍ය නිලධාරීන් වෛද්‍ය විද්‍යාව, දන්ත ශල්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව සඳහා 0.5% ක් හෝ එක් ස්ථානයක් යන දෙකෙන් වැඩි සංඛ්‍යාව වෙන් කරන ලදී. මෙම කාණ්ඩය යටතේ සමාලෝචිත වර්ෂය තුළ ප්‍රවේශය ලද ශිෂ්‍ය සංඛ්‍යාව පහත පරිදි වේ.

| අධ්‍යයන පාඨමාලාව | 2011/2012 | | | තෝරාගත් සංඛ්‍යාව 2010/2011 | තෝරාගත් සංඛ්‍යාව 2009/2010 |
|---|---|---|---|---|---|
| | පැරණි නිර්දේශය | නව නිර්දේශය | තෝරාගත් සංඛ්‍යාව | | |
| වෛද්‍ය විද්‍යාව | 02 | 06 | 08 | 06 | 06 |
| දන්ත ශල්‍ය විද්‍යාව | 01 | - | 01 | 01 | 01 |
| ඉංජිනේරු විද්‍යාව | 04 | 04 | 08 | 06 | 06 |
| **එකතුව** | **07** | **10** | **17** | **13** | **13** |

**(ඇ) විශේෂ විෂයන් සඳහා අතිරේක ප්‍රවේශය.**

පහත සඳහන් විෂයන් අධ්‍යයනය උනන්දු කරවීමේ අරමුණින් 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 1563 ක් ඇතුළත් කර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විශේෂ විධිවිධාන යොදන ලදී;

අරාබි
පුරා විද්‍යා
බෞද්ධ අධ්‍යයනය
බෞද්ධ ශිෂ්ටාචාරය
ව්‍යාපාර සංඛ්‍යානය
චීන
ක්‍රිස්තියානි ධර්මය
ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය
තුළනාත්මක ආගම්
නැටුම්
ආර්ථික විද්‍යාව
භූගෝල විද්‍යාව
අධ්‍යාපනය හා ළමා ආරක්ෂණය
ඉංග්‍රීසි
ලලිත කලා (කලා)
ප්‍රංශ
ලලිත කලා (සංගීතය, නැටුම් හා චිත්‍ර )
දෙමළ
සමාජ විද්‍යාව
ජර්මන්
බටහිර සම්භාව්‍ය සංස්කෘතිය
හිංදි
හින්දු ධර්මය
ඉතිහාසය
ගෘහ ආර්ථික විද්‍යාව
හින්දු ශිෂ්ටාචාරය
ඉස්ලාම්
ඉස්ලාම් ශිෂ්ටාචාරය
ජපන්
වාග් විද්‍යාව
සාහිත්‍ය විචාරය
පාලි
රුසියානු
සංස්කෘත
සංගීතය
දර්ශනය
දේශපාලන විද්‍යාව
සිංහල
දෘශ්‍ය කලා

**(ඉ) අන්ධ සහ ශාරීරික අශක්නුතාවන් සහිත සිසුන් ඇතුළත් කර ගැනීම**

2011/ 2012 අධ්‍යයන වර්ෂය සඳහා පහත කාණ්ඩ යටතේද සිසුන් ඇතුළත් කර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විධිවිධාන යොදන ලදී .

| අධ්‍යයන පාඨමාලාව | 2011/2012 | | | තෝරාගත් සංඛ්‍යාව 2010/2011 | තෝරාගත් සංඛ්‍යාව 2009/2010 |
|---|---|---|---|---|---|
| | පැරණි නිර්දේශය | නව නිර්දේශය | තෝරාගත් සංඛ්‍යාව | | |
| අන්ධ ශිෂ්‍යයින් | 06 | 17 | 23 | 20 | 10 |
| කායික අශක්නුතාවන් සහිත ශිෂ්‍යයින් | 22 | 32 | 54 | 44 | 52 |
| **මුළු එකතුව** | **28** | **49** | **77** | **64** | **62** |

**(ඊ) 2007 දී හෝ ඉන් පසු සාමාන්‍ය කලා යෝග්‍යතා විභාගය ඉංග්‍රීසි විෂය සඳහා සාමර්ථයක් සහිතව හෝ සාමාන්‍ය විද්‍යා යෝග්‍යතා විභාගය සමත් ගුරුවරුන්**

2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා මෙම කාණ්ඩ යටතේ ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස ඇතුළත්ව ශාස්ත්‍රවේදී කලා උපාධිය හැදෑරීමට සිසුන් 15 ක් තෝරා ගන්නා ලදී.

| තෝරාගත් සංඛ්‍යාව 2011/2012 | තෝරාගත් සංඛ්‍යාව 2010/2011 | තෝරාගත් සංඛ්‍යාව 2009/2010 |
|---|---|---|
| **15** | **22** | **12** |

### 4.4 විශ්වවිද්‍යාල ප්‍රවේශ සම්බන්ධ අභියාචනා

විශ්වවිද්‍යාල ප්‍රවේශ සම්බන්ධ අභියාචනා සළකා බැලීම සහ පැමිණිලි පරීක්ෂා කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සෑම වර්ෂයකදී ම අභියාචනා කමිටුව පත්කරනු ලබයි. ඒ අනුව මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම (සභාපතිනි / වි.වි.ප්‍ර.කො), මහාචාර්ය රංජිත් සේනාරත්න (උප සභාපති / වි.වි.ප්‍ර.කො), මහාචාර්ය එස්.මොහන්දාස් (සාමාජික / වි.වි.ප්‍ර.කො), මහාචාර්ය මල්කාන්ති චන්ද්‍රසේකර (සාමාජික / වි.වි.ප්‍ර.කො) , මහාචාර්ය සරත් අමුණුගම (උප කුලපති/ කැළණිය වි.වි) සහ ආචාර්ය ප්‍රියන්ත fp්‍රaමකුමාර (අතිරේක ලේකම්/ අධ්‍යයන කටයුතු සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ) යන මහත්ම මහත්මීන් මෙම කමිටුවේ සාමාජිකයින් වශයෙන් පත් කරන ලදී. කමිටුව සඳහා ලැබුණු සමස්ත අභියාචනා සංඛ්‍යාව 2478 කි. ඉන් අයදුම්කරුවන් 900 ක් ඉල්ලා සිටියේ ප්‍රවේශ අවශ්‍යතා සපුරා ඇති වෙනත් පාඨමාලාවකට ලබා දී ඇති අධ්‍යයන පාඨමාලාව වෙනස් කර දෙන ලෙසයි. ඒ අනුව අධ්‍යයන පාඨමාලා වෙනස් කිරීම සඳහා වූ එවැනි අභියාචනා 341 ක් සහ වෙනත් අභියාචනා 155 ක් එවැනි අභියාචනා ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු සළකා බැලීමෙන් අනතුරුව කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

### 4.5 විශ්වවිද්‍යාල ප්‍රවේශ සම්බන්ධයෙන් පොදු ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සංයුක්ත සැලැස්මේ සඳහන් අරමුණු සහ ක්‍රියාකාරකම් පරිදි සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් කීපයක්ම පවත්වන ලදී. මෙම වැඩමුළු පැවැත්වීමේ අරමුණ වූයේ අ.පො.ස (උසස් පෙළ) ගුරුවරුන්, ශිෂ්‍යයින් සහ ඒ සම්බන්ධ අනෙකුත් පාර්ශවයන් විශ්වවිද්‍යාල ප්‍රවේශ පටිපාටිය හා විශ්වවිද්‍යාල අධ්‍යාපන සඳහා ඇති අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමයි.

මෙම වැඩමුළු වසර පුරාම කොළඹ, ගම්පහ සහ කළුතර ආදී පරිපාලන දිස්ත්‍රික්ක කීපයකම ප්‍රධාන පාසල් හි පවත්වන ලදී. විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ නවතම සංවර්ධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මුද්‍රිත මාධ්‍ය හරහා ද සිදු කෙරිණි.

ප්‍රවේශය සම්බන්ධ පහත සඳහන් සංඛ්‍යා ලේඛන මෙම වාර්තාවේ ඇමුණුම් ලෙස දක්වා ඇත;

1. 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා ප්‍රවේශය:දිස්ත්‍රික් සහ පාඨමාලා වශයෙන් වර්ගීකරණය **(*ඇමුණුම I*)**

2. සාමාන්‍ය සහ විශේෂ ප්‍රවේශය යටතේ 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා තෝරා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව **(*ඇමුණුම II*)**

# 5. අධ්‍යයන සංවර්ධනය සහ අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම.

## 5.1 ස්ථාවර කමිටු

සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 4 (2) ඡේදයේ විධිවිධාන අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විවිධ ක්ෂේත්‍ර සඳහා ස්ථාවර කමිටු පත්කර ඇත. අදාල ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට වාර්තා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම එක් එක් ස්ථාවර කමිටුවේ වගකීම වේ. ඒ අනුව 2013 වර්ෂයේ දී විවිධ විෂයන් සම්බන්ධයෙන් ස්ථාවර කමිටු 16 ක් සහ එක් වෙනත් කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ අතර ඒ එක් එක් ස්ථාවර කමිටු විසින් පවත්වන ලද රැස්වීම් වාර ගණන පහත දැක්වේ.

| | ස්ථාවර කමිටුවේ නම | 2013 දී පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | 2012 දී පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | කෘෂි විද්‍යාව, පශු වෛද්‍ය විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව | 04 | 05 |
| 2. | පුස්තකාල සහ විඥාපන විද්‍යාව | 04 | 04 |
| 3. | ඉංග්‍රීසි ඉගැන්වීම | 06 | 06 |
| 4 . | විශ්වවිද්‍යාල වල වෘත්තීය මාර්ගෝපදේශනය සහ ශිෂ්‍ය සුබසාධනය | 09 | 06 |
| 5. | විද්‍යා | 06 | 06 |
| 6. | පශ්චාත් උපාධි අධ්‍යයන සහ පර්යේෂණ | 05 | 04 |
| 7. | මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා සහ අධ්‍යාපනය | 05 | 02 |
| 8 | කළමනාකරණ අධ්‍යයන | 06 | 06 |
| 9. | ඉංජිනේරු හා වාස්තු විද්‍යාව | 05 | 06 |
| 10. | වෛද්‍ය විද්‍යාව සහ දන්ත ශල්‍ය විද්‍යාව | 06 | 05 |
| 11. | ආගණනය (මීට පෙර තොරතුරු තාක්ෂණ සංවර්ධනය ලෙස හැඳින් වූ ) | 07 | 06 |
| 12. | තත්ත්ව සහතික සහ ප්‍රතීතන | 04 | 05 |
| 3. | දේශීය වෛද්‍ය විද්‍යාව | 06 | 06 |
| 14. | බාහිර උපාධි | 03 | 02 |
| 15. | තාක්ෂණ ක්ෂේත්‍රය (2013 වර්ෂයේ දී පිළිගන්නා ලද ස්ථාවර කමිටුවකි.) | 04 | පවත්වා නැත |
| 16. | විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩල සංවර්ධනය | 02 | 03 |

**වෙනත් කමිටු**

| | | | |
|---|---|---|---|
| සුදුසුකම් /උපාධි ප්‍රදාන ආයතන පිළිගැනීම සඳහා වන ඉල්ලීම් අධ්‍යයනය කිරීම සඳහා වන කමිටුව | 02 | 04 |

## 5.2 ප්‍රථම උපාධි අධ්‍යයන පාඨමාලාවන් ආරම්භ කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විවිධ පීඨ / විශ්වවිද්‍යාල මඟින් ඉදිරිපත් කරන ලද යෝජනා සැළකිල්ලට ගෙන සමාලෝචිත වර්ෂය තුළ දී පහත සඳහන් ප්‍රථම උපාධි පාඨමාලා 12 අනුමත කරන ලදී.

1. ශ්‍රී ජයවර්ධපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව

2. බදුල්ල ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ජලජ සම්පත් සහ තාක්‍ෂණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව

3. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ තාල සහ ක්ෂීර තාක්‍ෂණ විද්‍යාවේදී උපාධිය

4. හම්බන්තොට පිහිටි කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්‍ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනයේ කෘෂි තාක්‍ෂණ උපාධිය

5. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ තොරතුරු තාක්‍ෂණ විද්‍යාවේදී උපාධිය

6. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කර්මාන්ත තොරතුරු තාක්‍ෂණ උපාධිය

7. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ රසායන විද්‍යා (විශේෂ) විද්‍යාවේදී උපාධිය

8. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ව්‍යවහාරික ජීව විද්‍යා (විශේෂ) විද්‍යාවේදී උපාධිය

9. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ආගණනය සහ තොරතුරු පද්ධති උපාධිය.

10. යාපනය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී කලා (පරිවර්තන අධ්‍යයන) උපාධිය

11. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ගණිත සහ සංඛ්‍යාන (විශේෂ) උපාධි පාඨමාලාව.

12. කැළණිය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ සබරගමුව විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල තුනෙහි භාෂා පරිවර්තන ශාස්ත්‍රවේදී උපාධිය

## 5.3 පශ්චාත් උපාධි පාඨමාලා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පශ්චාත් උපාධි පාඨමාලා විධිමත් ආකාරයෙන් පරීක්ෂා කිරීමේ සහ සමාලෝචනය කිරීමේ යාන්ත්‍රණයක් අනුගමනය කර පසුගිය වර්ෂයේ හඳුන්වාදෙන ලද පශ්චාත් උපාධි පාඨමාලා 6 ට සාපේක්ෂව 2013 වර්ෂයේ දී පශ්චාත් උපාධි පාඨමාලා 28 ක් අනුමත කරන ලදී.

1. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාය විච්ඡේද පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

2. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කායික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

3. මොරටුව විශ්වවිද්‍යාලයේ වෘත්තීය ආරක්‍ෂණය සහ සෞඛ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

4. කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ ශාස්ත්‍රපති උපාධිය.

5. රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය.

6. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පරපෝෂිත විද්‍යාව සහ කීට විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය.

7. කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ ලලිතකලා ශාස්ත්‍රපති උපාධිය.

8. මොරටුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්‍ෂණ පීඨයේ බහුමාධ්‍ය තාක්‍ෂණය පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

9. මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ තිරසාර කාර්යය සංවර්ධන විද්‍යාපති පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

10. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘෂ්‍ය කලා පීඨයේ ශාස්ත්‍රපති කලා පාඨමාලාව (දෘෂ්‍ය කලා )

11. රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයේ කෘෂිතාක්‍ෂණ හා සංවර්ධන විද්‍යාපති උපාධිය.

12. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මානව පෝෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය.

13. කැලණිය විශ්වවිද්‍යාලයේ වානිජ්‍ය හා කළමනාකරණ පීඨයේ අලෙවිකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව .

14. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පාරිසරික ජෛව තාක්‍ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

15. ඔළුවිල් හි පිහිටි ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ දෙමළ පශ්චාත් උපාධි පාඨමාලාව, දෙමළ ශාස්ත්‍රපති උපාධිය සහ දර්ශනපති උපාධිය.

16. ගම්පහ වික්‍රමාරච්චි අයුර්වේද වෛද්‍ය ආයතනයේ කායචිකිත්සාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

17. ගම්පහ වික්‍රමාරච්චි අයුර්වේද වෛද්‍ය ආයතනයේ පංච කර්ම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

18. ගම්පහ වික්‍රමාරච්චි අයුර්වේද වෛද්‍ය ආයතනයේ කායචිකිත්සාව පිළිබඳ විද්‍යාපති උපාධිය.

19. ගම්පහ වික්‍රමාරච්චි අයුර්වේද වෛද්‍ය ආයතනයේ පංචකර්ම පිළිබඳ විද්‍යාපති උපාධිය

20. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්ව සහ නව ව්‍යාපාර ස්ථාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.(ව්‍යවසායකත්ව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව)

21. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය.

22. කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් වෛද්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලාව.

23. කොළඹ විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය.

24. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනපති උපාධිය.

25. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පරිසර විද්‍යා විද්‍යාපති උපාධිය.

26. කොළඹ විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයනය පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

27. යාපනය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන විද්‍යාපති උපාධියට දිශානුගත වූ කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

28. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ දෙවන බසින් සාහිත්‍ය ඉගැන්වීමේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ දෙවන බසින් සාහිත්‍ය ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධිය

### 5.4 විශ්විද්‍යාලවල බාහිර උපාධි පාඨමාලා ශක්තිමත් කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල මඟින් ක්‍රියාත්මක කරනු ලබන බාහිර උපාධි පාඨමාලා සහ විස්තාරිත පාඨමාලාවල තත්වය ඉහළ නැංවීම අරමුණින් ඒවා නියාමනය කර තිබේ. ඒ අනුව විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මඟින් පිරිනමනු ලබන එවැනි පාඨමාලා සඳහා අවශ්‍ය වන සුදුසුකම් රාමු, තත්ත්ව ප්‍රතීතන සංග්‍රහ ඇතුළත් යහපත් ක්‍රියාමාර්ග සම්බන්ධ අත්පොතක් සියලුම බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා පවත්වා ගෙන යන විශ්වවිද්‍යාල වෙත නිකුත් කර ඇති අතර විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි සියලුම විශ්වවිද්‍යාල දැනට පවතින බාහිර විභාග ඒකක පරිපූර්ණ ''විවෘත හා දුරස්ථ අධ්‍යයන ඒකක'' බවට පත්වන තෙක් වසර පහක කාලයක් සඳහා විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සියුම් අධීක්ෂණයට ලක්වනු ඇත.

ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වන විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතිය මඟින් පාලනය හා කළමනාකරණය, ගුණාත්මකභාවය සහ යෝග්‍යතාව වර්ධනය කිරීමටත් ඉගෙනුම් සම්පත් සහ ඉගෙනුම් උපකාරක සේවා වැඩිදියුණු කිරීම සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන පුහුණු ආයතන සමඟ සහයෝගීතාව ප්‍රවර්ධනය සිදුකිරීමටත් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත.

2012/2013 අධ්‍යයන වර්ෂයේ දී පහත දැක්වෙන බාහිර උපාධි පාඨමාලා 10 ක් සහ බාහිර පාඨමාලා 3 ක් අනුමත කරන ලදී;

1. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය.(සාමාන්‍ය, බාහිර)

2. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (සාමාන්‍ය, බාහිර)

3. රුහුණු විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී කලා (බාහිර) උපාධිය.

4. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා බාහිර උපාධිය. (තුන් අවුරුදු)

5. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජ්‍යයවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය.

6. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය.

7. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණවේදී (රාජ්‍ය) (සාමාන්‍ය) බාහිර උපාධිය.

8. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය. (තුන් අවුරුදු)

9. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිසර සහ සංවර්ධන අධ්‍යයනය පිළිබඳ සමාජ විද්‍යාවේදී (තුන් අවුරුදු) සාමාන්‍ය බාහිර උපාධිය.

10. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය, බාහිර) උපාධිය.

- සංයුක්ත ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමාව
- ඉංග්‍රීසි සහතිකපත් පාඨමාලාව
- තොරතුරු තාක්‍ෂණ සහතිකපත් පාඨමාලාව

(ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය)

**විද්‍යා ප්‍රථම උපාධි පාඨමාලා සඳහා වන අත් පොත**

විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුවේ අදහසක් වශයෙන් විශ්වවිද්‍යාල වල උපාධි පාඨමාලා සංවර්ධනය කිරීමේ උපදෙස් සහිත අත්පොතක් ලෙස විද්‍යා ප්‍රථම උපාධි පාඨමාලා පිළිබඳ අත් පොතක් සකස් කරන ලදී.

## 5.5 නව පීඨ ස්ථාපනය කිරීම

විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ජාතික අභිලාෂයන් සපුරාලීම සඳහා පහත අධ්‍යයන අංශ ස්ථාපිත කිරීමේ දැඩි අවශ්‍යතාව හඳුනාගෙන අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයන්හි අධ්‍යයන කටයුතු පුළුල් කිරීමේ අරමුණින් මෙම කාල පරාසයේදී පහත සඳහන් පරිදි නව අධ්‍යයන අංශ පහක් අනුමත කරන ලදී.

- යාපනය විශ්වවිද්‍යාලය
  කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨයේ වාණිජ්‍යය අධ්‍යයන අංශය

- ශ්‍රී ලංකා රජරටවිශ්වවිද්‍යාලය
  කෘෂි විද්‍යා පීඨයේ සත්ත්ව හා ආහාර විද්‍යා අධ්‍යයන අංශය

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
  සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය

- කැළණිය විශ්වවිද්‍යාලය
  ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය

- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
  හින්දු ශිෂ්ටාචාර අධ්‍යයන අංශය

## 5.6 තාක්ෂණික විෂයන් හඳුන්වාදීම

අධ්‍යාපන අමාත්‍යාංශය ජාතික අධ්‍යාපන ආයතනය සමඟ එක්ව 2015 පැවැත්වීමට නියමිත අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා 2013 වර්ෂයේ දී තාක්ෂණ විෂය ධාරාවක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හඳුන්වා දීමට නියමිත තාක්ෂණ විද්‍යා පාඨමාලා සඳහා ඇතුළත් වීමට අවශ්‍ය වන තාක්ෂණ විෂයන් අනුමත කරන ලද අතර අදාල පීඨවල අධ්‍යයන අංශ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සැපයීමට සහ අනෙකුත් අවශ්‍ය කටයුතු සිදු කිරීමට ද අනුමත කරන ලදී. 2016 වර්ෂයේ දී තාක්ෂණ විෂය ධාරාව සඳහා විශ්වවිද්‍යාල වලට අවම වශයෙන් සිසුන් 1500 කින් සමන්විත ප්‍රථම කණ්ඩායම වශයෙන් ඇතුළත් කර ගැනීමට යෝජනා වී ඇත.

## 5.7 අන්තර් විශ්වවිද්‍යාල සුසංවාදී ව්‍යාපෘතිය

සියලුම ශිෂ්‍ය ප්‍රජාවන් අතර සමඟිය ස්ථාපිත කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ව්‍යාපෘතියක් දියත් කරන ලදී. මේ යටතේ පහත සඳහන් උප ව්‍යාපෘති කීපයක් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලදී ;

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය සමඟ සහයෝගීත්වයෙන් විශ්වවිද්‍යාල සංස්කෘතික උළෙලක් සංවිධානය කරන ලදී. විශ්වවිද්‍යාල සිසුන් අතර වාර්ගික සමඟිය සහ සමාජ ඒකාබද්ධභාවය ශක්තිමත් කිරීමේ සහ ගම සහ විශ්වවිද්‍යාලය අතර ධනාත්මක සම්බන්ධතා වර්ධනය කිරීමේ අරමුණින් මෙම උළෙල 2013 ජූනි මස විසිවන දින රජරට විශ්වවිද්‍යාලයේ දී අවට ප්‍රදේශවල ග්‍රාමීය ජනතාව ඇතුළුව 400 ක් පමණ පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී .

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ''සාම අධ්‍යයනය'' සියලුම උපාධි පාඨමාලාවන්හි අනිවාර්ය අධ්‍යයන ඒකකයක් විය යුතු බව තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන දැනුවත් කර තිබේ.

- ශ්‍රී ලාංකීය ජීවය ශක්තිමත් කිරීමටත් ජාතික ස්ථායිතාව සඳහා දායකත්වය සැපයීමට සියලුම විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනයන්හි ''සුසංවාදී සංගම්'' ස්ථාපනය කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේ.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි උපදේශක කමිටුවක් හා මෙහෙයුම් කමිටුවක් පූජ්‍ය පක්ෂය සහ සිවිල් සමාජයේ විශිෂ්ට පුද්ගලයන්ගේ සාමාජිකත්වයෙන් ස්ථාපනය කර ඇත.

## 5.8 රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතන

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 (අ) වගන්තිය යටතේ උසස් අධ්‍යාපනය නගා සිටුවනු වස් අමාත්‍යවරයාට ඕනෑම ආයතනයක් උපාධි පිරිනමන ආයතනයක් වශයෙන් පිළිගත හැකිය.

2013 වර්ෂයේ සිදුකරන ලද ආයතනික සමාලෝචන සහ එක් එක් උපාධි පාඨමාලාවට අදාල පාඨමාලා සමාලෝචන පැවැත්වීමෙන් අනතුරුව පහත සඳහන් ආයතන යටතේ නම්කර ඇති උපාධි සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා ප්‍රදානය කිරීමට අවශ්‍ය උපාධි

ප්‍රදාන තත්ත්වය ලබාදීමට ගරු උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ ලබා දී ඇත.

1. 2013.03.05 දින සිට ක්‍රියාත්මක වන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව පාසල් සමාගම
    - ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (මානව සම්පත් කළමනාකරණය ) (විශේෂ)
    - ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (සැපයුම් සේවා කළමනාකරණය) (විශේෂ)
    - ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (කර්මාන්ත කළමනාකරණය) (විශේෂ )
    - ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ව්‍යාපෘති කළමනාකරණය) (විශේෂ)
    - ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය තොරතුරු පද්ධති (විශේෂ)
    - ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
    - මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව කර්මාන්ත කළමනාකරණය පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
    - ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.
    - පරිගණක ජාලකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
    - මෘදුකාංග ඉංජිනේරු පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

2. 2013.07.09 සිට ක්‍රියාත්මක වන කොළඹ ජාත්‍යන්තර නාවික සහ ඉංජිනේරු ආයතනය. (CINEC).

    - සාමුද්‍රික විද්‍යා විද්‍යාවේදී උපාධිය (ගෞරව)
    - නාවික ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව (ගෞරව)
    - සැපයුම් සේවා හා ප්‍රවාහන විද්‍යාවේදී පාඨමාලාව (ගෞරව)

**5.9 පුස්තකාල සහ විඥාපන විද්‍යා සංවර්ධන කටයුතු**

(අ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි වෘත්තිකයින්ගේ, පරිපූරක වෘත්තිකයන්ගේ සහ සෙසු කාර්ය මණ්ඩලයේ "නිපුණත්වය වැඩිදියුණු කිරීමේ සහ කුසලතා හැකියාවන් සංවර්ධන කිරීමේ අනාගතයට ඔබින උපක්‍රම යෝජනා කිරීම සඳහා කොමිෂන් සභාව විසින් පුස්තකාල සහ විඥාපන විද්‍යා කාර්ය මණ්ඩල සඳහා "නිපුණත්වය වැඩි දියුණු කිරීම සහ ශක්‍යතා වර්ධනය" පිළිබඳ යෝජනාවක් අනුමත කරන ලදී. මෙහි මූලික අරමුණ වනුයේ කාර්යශූර පුස්තකාල සේවාවක් අධ්‍යයන ප්‍රජාව සඳහා ලබා දීමය.

(ආ) උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිගණක ආශ්‍රිත කාර්ය පරිසරයක් වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ පාලන හා කළමනාකරණ ප්‍රතිපත්තිය නිකුත් කරන ලදී. මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වූයේ ආයතනයන්ට පැවරුණු රාජකාරි වඩාත් උචිත ආකාරයෙන් ඉටු කිරීමට සඳහා අවශ්‍ය සම්පත් හා දත්ත නියමිත ලෙස භාවිත කරන්නේ ද සහ එසේ භාවිතා කිරීම ආයතනික ප්‍රතිපත්ති වලට අනුකූලවන්නේ ද යන්න පිළිබඳව සහතික වීමයි.

(i) **උසස් අධ්‍යාපන ආයතන සඳහා විද්‍යුත් පුස්තකාලයක් ස්ථාපනය කිරීම.**

දිවයිනෙහි පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නියැලෙන පුද්ගලයින්ගෙන් 60% ට වැඩි ප්‍රමාණයක් උසස් අධ්‍යාපන ආයතනයන්හි ආචාර්යවරුන් වන බැවින් විශ්වවිද්‍යාලයන්හි අවශ්‍ය සඟරා තිබීම ඉතා වැදගත් කරුණකි. නමුත් සඟරාවල මිල ගණන් ඉහළ යෑම, ශ්‍රී ලංකා රුපියලේ අගය අඩුවීම සහ යටිතල සහසුකම් සංවර්ධන අවශ්‍යතා වැනි ක්ෂේත්‍රවල තරඟකාරීත්වය සමඟ සළකා බැලීමේ දී අවශ්‍ය සඟරා සඳහා අවශ්‍ය දායක මුදල් අඛණ්ඩව ගෙවීමට විශ්වවිද්‍යාලවලට අරමුදල් නොලැබේ.

ආචාර්යවරුන්ගෙන් සහ වෙනත් පුස්තකාලාධිපතිවරුන්ගෙන් සමන්විත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා ස්ථාවර කමිටුව අධ්‍යාපනික සඟරා අඛණ්ඩව නොලැබීම පර්යේෂණ නිමැවුම (ගුණාත්මක භාවය හා ප්‍රමාණය) කෙරෙහි සහ අධ්‍යාපන ප්‍රමිතීන් හා සම්බන්ධ එහි අනුමිතීන් සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සාපේක්ෂ වශයෙන් ශ්‍රේණිගත කිරීම කෙරෙහි බරපතල ලෙස අයහපත් ප්‍රතිඵල ගෙන දෙන ආකාරය සාකච්ඡා කරන ලදී.

වර්තමානයේ දී, විශ්වවිද්‍යාල විසින් මුද්‍රිත සඟරා 675 ක් පමණ සඳහා දායකත්ව මුදල් සැපයීමට වාර්ෂිකව රු: මිලියන 90 ක පමණ මුදලක් වැය කරනු ලැබේ. නමුත් ඒවා විශ්වවිද්‍යාල අතර හුවමාරු කරගත නොහැකිය. මේ තත්වය යටතේ මූල්‍යමය ඵලදායී අකාරයෙන් අන්තර් විශ්වවිද්‍යාල විද්‍යුත් තොරතුරු ලබා ගැනීමට ප්‍රවේශ වීම සඳහා පුහුණු සහ ලේඛන සැපයීම ආදී පුද්ගලාභිමුඛ සේවා කිහිපයක් ලබාදීමේ අරමුණින් විශ්වවිද්‍යාල පුස්තකාල සංසදයක් ස්ථාපනය කිරීමට පුස්තකාල හා විඥාපන විද්‍යා ස්ථාවර කමිටුව සාකච්ඡා ආරම්භ කරන ලදී. මෙම මූලික පියවරෙහි ප්‍රධාන අරමුණු වන්නේ;

- පිරිවැය ඵලදායී දත්ත පද්ධතියක් තුළ ගොනුකළ සඟරා දහස් ගණනක් ලබා ගැනීමේ හැකියාව ලබා දීම.
- සියලුම විශ්වවිද්‍යාලවලට ඒවායේ විවිධ පර්යේෂණ හා අධ්‍යයන අවශ්‍යතා අනුව දත්ත පද්ධති / ඊ-ජර්නල් වෙත පිවිසීමේ එක් ප්‍රවේශ ලක්ෂ්‍යයක් ලබා දීම.
- දායකත්වය ලබාගෙන ඇති විද්‍යුත් සම්පත් භාවිතය, සංරක්ෂිත ලේඛන භාවිතය සහ ආරක්ෂණය සඳහා ගිවිසුම් ගත රීති මාලාවක් පවත්වා ගැනීම.
- පාවිච්චියේදී ගෙවීයාම, භෞතික වශයෙන් ඉඩ ලබා දීම, රාක්කවල තැන්පත් කිරීම, බැඳීම සහ දුෂ්කර ගෙවීම් ක්‍රම සහ තැපැලේ දී අස්ථානගත වීම ආදි මුද්‍රිත ලේඛන සම්බන්ධ ගැටළු අවම කර ගැනීම.

ඉහත සඳහන් පුස්තකාල සංසදය පිහිටුවීම ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තරකරණය කිරීම සහ ප්‍රවර්ධිත අධ්‍යයන තත්වය සහ පර්යේෂණ නිමැවුම සඳහා අඩිතාලම සකසා තිබේ. මෙමඟින් විදේශ විශ්වවිද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වලට ආකර්ෂණය කර ගැනීමට උපකාර වේ.

## 5.10 වැඩමුළු / ජාතික සමුළු

- **"ශ්‍රී ලංකාවේ නැගී එන තෙල් සහ ගෑස් කර්මාන්තයේ ප්‍රවීණතා වර්ධනය කිරීම සහ ශක්‍යතා වැඩිදියුණු කිරීම පිළිබඳ වැඩමුළුව " ගරු උසස් අධ්‍යාපන අමාත්‍ය එස්.බී දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනවාරි 7-8 දෙදින මීගමුව ජෙට්වින්ග්'ස් බ්ලූ හිදී පැවැත්විණි.**



"ඛනිජ තෙල් කර්මාන්තයේ ගෝලීය අපේක්‍ෂා සහ ජාතික අභිලාෂ" මැයෙන් ඉන්දියාවේ කර්න් ඉන්දියා සමාගමෙහි (Cairn India Ltd) ජෛවීය විද්‍යා අංශයේ ප්‍රධානී මහාචාර්ය ස්ටුවර්ට් බර්ලි ප්‍රධාන දේශනය පවත්වමින්.





ඉහත සඳහන් වැඩමුළුව පහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ඉංජිනේරු සහ වාස්තු විද්‍යා ස්ථාවර කමිටුව හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදී.

i) ගෑස් සහ තෙල් ගවේෂණයේ සහ නිෂ්පාදනයේ ඉහළ, මධ්‍යම, සහ පහළ කොටස්වල වෘත්තීය, කාර්මික, කළමනාකාරීත්ව සහ විද්‍යාත්මක මට්ටමින් මිනිස් බල අවශ්‍යතා (කෙටිකාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන) හඳුනාගැනීම.

ii) ඉහත i හි සඳහන් අවශ්‍යතා අනුව ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා හඳුනා ගැනීම සහ නිර්මාණය කිරීම.

iii) ඉහත i සහ ii අනුව මානව සහ භෞතික සම්පත් දෙකම සළකා ශක්‍යතා වර්ධන අවශ්‍යතා (කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන) හඳුනා ගැනීම සහ ඒ සඳහා මූල්‍ය සපයා ගැනීම.

iv) අදාළ වෘත්තීය සහ අධ්‍යයන පාඨමාලා සංවර්ධනය සහ පිරිනැමීමට සහ විදේශ රටවල ගෑස් සහ තෙල් ගවේෂණය සහ නිෂ්පාදනය සඳහා හැකියාව වැඩිදියුණු කිරීම සම්බන්ධ ක්‍රියාමාර්ග බලාත්මක කිරීම සඳහා උපාය මාර්ගික සම්බන්ධතා හඳුනා ගැනීම.

v) ප්‍රවීණතා වර්ධනය සහ ශක්‍යතා වැඩිදියුණු කිරීමේ "ප්‍රශස්ත ආර්ථික ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සම්පත් කළමනාකරණය" පිළිබඳ නිර්දේශ සකස් කිරීම.

විශ්වවිද්‍යාලවල ඛනිජ තෙල් විද්‍යා සහ තාක්‍ෂණ විෂයෙහි ශක්‍යතා වර්ධනය පිළිබඳ ඉහත වැඩමුළුවේ පසු විපරම් හමුවක් 2013 ඔක්තෝබර් 22 දින කොළඹ පිහිටි ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ පැවැත්වුණු අතර එහි දී විඩම්බන අධ්‍යයනයන්ට අදාළ වටිනා අධිතාක්‍ෂණයෙන් යුත් පරිගණක සහ මෘදුකාංග පැකේජ ඉන්දියාවේ කර්න්

ඉන්දියා සමාගම (Cairn India Ltd) විසින් මොරටුව විශ්වවිද්‍යාලයට පරිත්‍යාග කරන ලදී.



ඉන්දියාවේ කර්න් ඉන්දියා සමාගමෙහි (Cairn India Ltd)හි මයිකල් ක්වින් මහතා විසින් වටිනා අධි තාක්‍ෂණයෙන් යුත් පරිගණක හා මෘදුකාංග පැකේජ මොරටුව විශ්වවිද්‍යාලයට පරිත්‍යාග කරන අවස්ථාව.

- **උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සාමය ගොඩනැගීමේ සහ ප්‍රතිසන්ධාන සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා “ප්‍රතිසන්ධානයේදී උසස් අධ්‍යාපනයේ කාර්යභාරය ” යන මැයෙන් ජාතික සමුළුවක් 2013 ජූනි 13-14 යාපනයේ ග්‍රීන් ග්‍රාස් හෝටලයේදී පැවැත්විණි.**





"සාම අධ්‍යාපනය සඳහා විශ්වයේ අවශ්‍යතාව” මැයෙන් විනිසුරු සී ජී වීරමන්ත්‍රී මහතා ආරම්භක දේශනය පවත්වමින්

"පශ්චාත් අරගල උපක්‍රම: මධ්‍යස්ථභාවය,ඉවසීම, සහජීවනය" පිළිබඳ ආචාර්ය රොහාන් ගුණරත්න ප්‍රධාන දේශනය පවත්වමින් මෙය මහාචාර්ය එස් රාජරත්නම් (ජාත්‍යන්තර අධ්‍යයන පාසල සිංගප්පූරුව) සමඟ පවත්වන ලද ඒකාබද්ධ දේශනයකි.





විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යාපනය විශ්වවිද්‍යාලය සමඟ එක්ව පහත සඳහන් අරමුණු උදෙසා “ප්‍රතිසන්ධානයේදී උසස් අධ්‍යාපනයේ කාර්යභාරය” පිළිබඳ ජාතික සමුළුවට සත්කාරක ආයතන වශයෙන් දායකත්වය සපයන ලදි.

- ප්‍රතිසන්ධානයේ දී විශ්වවිද්‍යාල වල කාර්යභාරය සහ වගකීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් අතර දැනුවත්භාවය හා අවබෝධය ඇති කිරීම.
- නව සහ නව්‍යකරණ අධ්‍යයන, පර්යේෂණ, ක්‍රීඩා, සංස්කෘතික සහ තරඟකාරී වැඩසටහන් මඟින් විශ්වවිද්‍යාල තුළ ප්‍රතිසන්ධානය අභ්‍යන්තර ගත මෙන්ම සහ ආයතනගත කිරීම.
- ප්‍රතිසන්ධානය හා සමාජ සුසංවාදය අභිවර්ධනය කිරීම සඳහා නව ගුරු සිසු පරපුරක් ඇති කිරීම.

- විශ්වවිද්‍යාල මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිසන්ධාන ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.
- ප්‍රතිසන්ධානයේදී හා සමාජ ඒකාබද්ධ භාවයේදී විශ්වවිද්‍යාල මෙහෙයුම් බලයක් මෙන්ම උපක්‍රමශීලී හවුල්කරුවකු බවට පත් කිරීම.

දිවයිනේ ප්‍රධාන වාර්ගික සහ ආගමික ප්‍රජාවන් නියෝජනය කරන සමාජ සුසංවාදී සහ ප්‍රතිසන්ධාන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන විද්වත්හු මෙම සමුළුවට සහභාගී වූහ. එසේම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයෙන් සහ සිසුන්ගෙන් කොටසක් ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

- **වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ උපදේශකයින් / අධ්‍යයන වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකයින් පුහුණු කිරීමේ දෙදින වැඩමුළුව**

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයන්හි පුහුණු අංශය ශක්තිමත් කිරීම සහ මනාව ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෘත්තීය මාර්ගෝපදේශන ස්ථාවර කමිටුව විසින් වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ උපදේශකයින් / අධ්‍යයන වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකයින් පුහුණු කිරීමේ දෙදින වැඩමුළුවක් 2013 සැප්තැම්බර් 25 - 26 කොළඹ ජානකී හෝටලයේදි පවත්වන ලදී.

21 වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC) සහ එඩෙක්ස් (EDEX) වෘත්තීය සේවය සමඟ සහයෝගීත්වයෙන් එය මෙහෙයවන ලදී. වැඩමුළුව පූර්ණ සහභාගීත්වයෙන් යුතුව සාර්ථකව අවසන් විණි.

- **ශිෂ්‍යයින්ගේ මෘදු කුසලතා සංවර්ධනය කිරීමේ තෙදින වැඩමුළුව**

වෘත්තීය මාර්ගෝපදේශන ස්ථාවර කමිටුව ශිෂ්‍ය මෘදු කුසලතා වර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ජෝන් කීල්ස් සමාජ සත්කාර ව්‍යාපෘතිය සමඟ සහයෝගීත්වයෙන් අග්නිදිග විශ්වවිද්‍යාලයේ සහ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ දී "මෘදු කුසලතා සංවර්ධනය" පිළිබඳ තෙදින වැඩමුළුවක් පවත්වන ලදී. සුවිශේෂී සම්පත්දායකයින් සහ සියලුම විශ්වවිද්‍යාල නියෝජනය කරමින් ආසන්න වශයෙන් සිසුන් 500 ක් පමණ මේ සඳහා සහභාගී වන ලදී. විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශන ඒකක මඟින් ශිෂ්‍ය සුභසාධන කටයුතු සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් එම වැඩමුළුවම අනෙකුත් විශ්වවිද්‍යාල වලද පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

- **මල් වගා සායනය, ප්‍රදර්ශනය සහ වැඩමුළුව**

ගරු ජනාධිපති ආර්යා ශිරන්ති වික්‍රමසිංහ රාජපක්ෂ මැතිණියගේ ප්‍රධානත්වයෙන් **මල් වගා සායනය, ප්‍රදර්ශනය සහ වැඩමුළුව 2013 ඔක්තෝම්බර් 25 දින කොළඹ 07 පදනම් ආයතනයේදී පැවැත්විණි.**

එය කෘෂිකර්ම, පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා ස්ථාවර කමිටුව විසින් මයික් ෆ්ලෝරා පුද්ගලික සමාගම සමඟ එක්ව සංවිධානය කරන ලදි. වැඩමුළුවේ අරමුණු පහත පරිදි වේ;

- දේශීය හා විදේශීය වෙළඳපොළ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මල් වගා ව්‍යාපාරය ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම සම්බන්ධ ප්‍රතිපත්තිමය ගැටළු සහ ආයතනික, තාක්ෂණික සහ යටිතල පහසුකම් වලට අදාලව පවතින බාධක හඳුනා ගැනීම.
- අපනයන කර්මාන්තයක් වශයෙන් මල් වගාව පිළිබඳ ප්‍රමුඛ අවධානය යොමුකර පර්යේෂණ සිදුකල යුතු අංශ හඳුනා ගැනිම.

- ශක්තිමත් මෙන්ම තරඟකාරී අන්දමින් මල්වගා ව්‍යාපාරය දියුණුකිරීම සඳහා ආචාර්යවරුන් සහ දේශීය සහ විදේශීය රාජ්‍ය සහ පුද්ගලික ආයතන අතර ක්‍රියාකාරී සම්බන්ධතා වර්ධනය කිරීම.
- මල් වගාකරුවන්, ව්‍යාපාරිකයින්, ව්‍යවසායකයින් සහ ස්වකීය නව නව්‍යකරණ ප්‍රභේදයන්, නිෂ්පාදන සහ සේවා ඉදිරිපත් කිරීමට රුචිකත්වයක් දක්වන්නන් සඳහා අවස්ථාවක් සලසා දීම.
- ඉහත කරුණු සම්බන්ධ ගැටළු සහ බාධක ජයගැනීම සඳහා උපායමාර්ග සහ ප්‍රායෝගික නිර්දේශ සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ සහ ආයතන වෙත භාර දීම සඳහා.



විශ්වවිද්‍යාල කොමිෂන් සභාපතිනිය ප්‍රධාන ආරාධිත ශිරන්ති වික්‍රමසිංහ රාජපක්ෂ මැතිණිය පිළිගනිමින්



වැඩමුළුව අතරතුර





සුළු පරිමාණ ප්‍රදර්ශනය විවෘත කරමින්

- **''පොදුරාජ්‍ය මණ්ඩලයේ අනාගතය: ශ්‍රී ලංකාවේ දූරදර්ශී සහ කැපී පෙනෙන නායකත්වය ''පිළිබඳ සමුළුව.**

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉදිරි දෙවර්ෂය සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයේ න්‍යාය පත්‍රය හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳව එහි නිල සභාපති වශයෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් අවධානය යොමු කළ යුතු නිර්දේශ සකස් කිරීමේ අරමුණින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලද සමුළුවක් 2013 නොවැම්බර් 26 වන දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවැත්විණි. විශ්වවිද්‍යාල කුලපතිවරුන්, උප කුලපතිවරුන් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් රැසක් ඇතුළුව 250 කට අධික පිරිසක් මෙම අවස්ථාවට සහභාගි විය.

  මෙම සමුළුව සුදුසුකම්ලත් සියලු පාර්ශවයන්ගෙන් සමන්විත බුද්ධි කලම්භන සැසිවලින් යුක්ත විය; විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිනි මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම විසින් අතිගරු ජනාධිපති වෙත අතුරු

නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් මෙම සමුළුවේ අගය උපරිමත්වයට පත්විණි. මෙහිදී ගරු එස්.බී දිසානායක මහතා විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත සිහිවටනයක් ප්‍රදානය කරමින් සතුට පලකරන ලදී.




- **දකුණු ආසියානු උසස් අධ්‍යාපන ආයතන සංගමය (ASAIHL) ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2013**

උසස් අධ්‍යාපනය සඳහා දකුණු ආසියානු උසස් අධ්‍යාපන ආයතන සංගමය (ASAIHL) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කැළණිය විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීත්වයෙන් සහ සංවිධානයෙන් කරන ලද "සැමට අධ්‍යාපනය : අපේක්ෂා සහ අභියෝග" යන තේමාව යටතේ 2013 දෙසැම්බර් 5 - 6 කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. පර්යේෂකයින් සහ විදේශ වල කැපී පෙනෙන විශ්වවිද්‍යාල ආචාර්යවරුන් 150 කට අධික සංඛ්‍යාවක් මෙම අවස්ථාවට සහභාගීවන ලදී.

ගරු උසස් අධ්‍යාපන අමාත්‍ය එස්. බී දිසානායක මැතිතුමා සහ ගරු විදේශ කටයුතු අමාත්‍ය මහාචාර්ය ජී.එල් පීරිස් මැතිතුමාගේ සහභාගීත්වයෙන් සමුළුව පැවැත්වුණු අතර ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසිනි.

ඊට අමතරව තෝරාගත් ප්‍රකාශන පිළිබඳ ඉදිරිපත් කිරීමක් ලෙස මහාචාර්ය ඩී. විජේසේකර මහතා විසින් දේශනයක් පැවැත් වූ පසු වෙනත් උගත් පුද්ගලයින් විසින් ආරාධිත දේශන පවත්වන ලදී.










- **සම සෞඛ්‍ය කාණ්ඩ වල විෂය මාලා නවීකරණය කිරීම පිළිබඳ වැඩමුළුව**

  සම සෞඛ්‍ය විද්‍යාවන්හි සෑම විෂයකම අවසාන පරීක්ෂණයේදී පෙනී සිටීම සඳහා බහුවරණ ප්‍රශ්ණ පත්‍රයක් ලබාදීමට විෂය මාලාව සමාලෝචන කිරීමට සහ මූලික විෂයමාලාව හඳුනා ගැනීමට "සම සෞඛ්‍ය කාණ්ඩ වල විෂය නිර්දේශය නවීකරණය කිරීම" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. මෙය ප්‍රජා සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සඳහා ධනාත්මක දායකත්වයක් සැපයීමට සිසුන්ට අවස්ථාව සලසන ලදී. හෙද විෂය ධාරාව සඳහා 2013 ජූනි 10 දින ප්‍රථම වැඩමුළුව සාර්ථකව පවත්වන ලදී.

## 5.11 ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය අධ්‍යාපනය ප්‍රමිතිකරණය

වෛද්‍ය අධ්‍යාපනය ප්‍රමිතිකරණයට ලක් කිරීමේ අරමුණින් එහි වර්තමාන තත්වය පරීක්ෂාවට ලක් කිරීම සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සමාලෝචනයට ලක් කිරීම 2013 මැයි 15 වන දින පැවැත්විණි. සමාලෝචනය ක්‍රියාත්මක කරන ලද්දේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි වෛද්‍ය හා දන්ත වෛද්‍ය විද්‍යා ස්ථාවර කමිටුවේ සභාපතිනි මහාචාර්ය මල්කාන්ති චන්ද්‍රසේකර , ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා අංශයේ පීඨාධිපති මහාචාර්ය මොහාන් එන් ද සිල්වා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ජනාදරී විජේසිංහ යන මහත්ම මහත්මීන් විසිනි.

සමාලෝචනයෙන් අනතුරුව සමාලෝචන වාර්තාවේ සඳහන් කරන ලද නිර්දේශ අනුව නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය හා සම්බන්ධ කටයුතු කඩිනම් කිරීමට ප්‍රතිසාධන ක්‍රියා මාර්ග ගන්නා ලදී.

## 5.12 දේශීය වෛද්‍ය සිසුන් සඳහා පොදු බහුවරණ ප්‍රශ්න පත්‍රයක් හඳුන්වාදීම.

දේශීය වෛද්‍ය විෂය ධාරාව නියාමනය කිරීමේ අරමුණින් දේශීය වෛද්‍ය පාඨමාලා හදාරන සිසුන් සඳහා "පොදු බහුවරණ ප්‍රශ්න පත්රයක්" හඳුන්වා දීම සහ පොදු බහුවරණ ප්‍රශ්න පත්‍රය සකස් කිරීම සඳහා සියලු දේශීය වෛද්‍ය ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් දැනුවත් කිරීම සඳහා 2013 අප්‍රේල් 23 සිට ජූනි 27 දක්වා වැඩමුළු පැවැත්විණි.

## 5.13 2013 ජූනි 17 සිට 22 දක්වා යාපනය විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යා පීඨ (තෙවන වසර) සිසුන් සඳහා කර්මාන්ත සංචාරය

ජෝන් කීල්ස් පදනම යාපනය විශ්වවිද්‍යාලයේ ඉල්ලීම මත එම විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යා පීඨ (තෙවන වසර) සිසුන් සඳහා කර්මාන්ත සංචාරයක් සංවිධානය කරන ලදී.

## 5.14 දකුණු ආසියාතික විශ්වවිද්‍යාලය

ඉන්දියාවේ දකුණු ආසියාතික විශ්වවිද්‍යාලයේ 2013 ජූලි ආරම්භ කිරීමට නියමිත එහි සිව්වන අධ්‍යයන සැසිය සඳහා ඇතුළත් කර ගැනීමේ පරීක්ෂණය 2013 මාර්තු 24 වන දින පවත්වමින් එහි සම්බන්ධීකරණ කටයුතු කර ගැනීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැලසීමෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී.

එපමණක් නොව දකුණු ආසියාතික විශ්වවිද්‍යාලයේ පාලක සභා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිනිය 2013

වර්ෂයේදී ඉන්දියාවේ නව දිල්ලි නුවර පවත්වන ලද මාණ්ඩලික රැස්වීමට සහභාගී විය.

### 5.15 විශ්වවිද්‍යාල පද්ධතියට තොරතුරු කළමනාකරණ ඒකක හඳුන්වාදීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාල වල තොරතුරු කළමනාකරණ හැකියාව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාලවල තොරතුරු කළමනාකරණ ඒකක ස්ථාපිත කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි තොරතුරු තාක්ෂණ පද්ධති අංශය ශක්තිමත් කිරීම සියලුම විශ්වවිද්‍යාල සම්බන්ධ කරමින් ජාලයක් නිර්මාණයෙන් කිරීමට තීරණය කරන ලදී. තොරතුරු කළමනාකරණ පද්ධති පිළබඳ ස්ථාවර කමිටුවක් පිහිටුවීමට ද කොමිෂන් සභාව තීරණය කරන ලදී.

### 5.16 ආසියාවේ හොඳම ව්‍යාපාර පාසල් සඳහා වන සිව්වන සම්මානය උළෙලේ අධ්‍යාපන නායකත්ව සම්මානය

2013 ජූලි 31 දින සිංගප්පූරුවේ පෑන් ෆැසිෆික් හි පැවති සිව්වන ආසියාවේ විශිෂ්ඨතම ව්‍යාපාර පාසල් සම්මාන උළෙලෙහි දී **අධ්‍යාපන නායකත්ව සම්මානය** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි සභාපති මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම වෙත ප්‍රදානය කරන ලදී. ආසියානු CMO සහ CMO කවුන්සිලය මෙම විශිෂ්ඨ සම්මානය මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම වෙත පිරිනමන ලද්දේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි වෙනසක් ඇති කිරීම පිළිබඳව ඇගේ දැක්ම ඇගයීමට බඳුන් කරමිනි.

### 5.17 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා / සාක් කලාපයේ සාමාජික රටවල සම ආයතන ප්‍රධානීන්ගේ කමිටුව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා / සාක් කලාපයේ සාමාජික රටවල සම ආයතන ප්‍රධානීන්ගේ කමිටුවේ අටවන හමුව 2013 අප්‍රේල් 17-18 නේපාලයේ කත්මණ්ඩු නුවරදී පැවැත්විණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති එහි සභාපති වෙනුවෙන් සහ විවෘත විශ්වවිද්‍යාලයේ උප කුලපති මෙම අවස්ථාව නියෝජනය කළහ.



සාක් කලාපීය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රධානීන්ගේ හමුවෙහි පසු විපරම් කටයුත්තක් වශයෙන් "MOODLE to transfer web based study materials" පිළිබඳ වැඩමුළුවක් 2013 අගෝස්තු 25-27 දක්වා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයෙහි සාමාජික සාක් රටවල නියෝජිතයින් 20 ක=ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.





## 5.18 විදේශ විශ්වවිද්‍යාලයන් සමඟ අධ්‍යයන සහ පර්යේෂණ සහයෝගීතාව වර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.

පර්යේෂණ සහ ජාත්‍යන්තර සහයෝගීතාව ඒකාබද්ධ කරනු වස් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජාත්‍යන්තර සහයෝගීතා අංශය, පර්යේෂණ සහ ජාත්‍යන්තර සහයෝගීතා අංශය වශයෙන් ප්‍රතිව්‍යුහගත කරන ලදී. මෙම අංශය මඟින් උසස් අධ්‍යාපන ආයතන තුළ සුවිශේෂී පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කර ඒ තුළින් විදේශ විශ්වවිද්‍යාල සමඟ ජාත්‍යන්තර සහයෝගිතාව ප්‍රවර්ධනය කෙරේ.

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ඉන්දියාවේ ජේන් විශ්වවිද්‍යාලය සහ ඇමරිකා එක්සත් ජනපදයේ ජෝර්ජියා රාජ්‍ය විශ්වවිද්‍යාලය අතර 2013 ජූලි 23 දින වීඩියෝ තාක්‍ෂණය උපයෝගී කරගනිමින් පැවති ත්‍රෛපාර්ශවික සහයෝගීතා වැඩමුළුව.**

  ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, ජේන් විශ්වවිද්‍යාලය සහ ජෝර්ජියානු රාජ්‍ය විශ්වවිද්‍යාලය අතර ත්‍රෛයිපාර්ශවික අධ්‍යයන සහ පර්යේෂණ සහයෝගිතාව වර්ධනය කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ඉන්දියාවේ ජේන් විශ්වවිද්‍යාලය සහ ඇමරිකා එක්සත් ජනපදයේ ජෝර්ජියා රාජ්‍ය විශ්වවිද්‍යාලය අතර 2013 ජූලි 23 දින වීඩියෝ තාක්‍ෂණය උපයෝගී කර ගනිමින් වැඩමුළුවක් පවත්වන ලදී.





ඉහත වැඩමුළුවට පසු විපරමක් වශයෙන් 2013 අගෝස්තු 7 - 9 ජේන් විශ්වවිද්‍යාලීය නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකා සංචාරයක නිරත විය. මෙම නියෝජිත කණ්ඩායම ජේන් විශ්වවිද්‍යාලයේ සහ ජේන් ආයතන සමූහයේ ආචාර්යවරුන්ගෙන් සහ පරිපාලන නිලධාරීන්ගෙන් සමන්විත විය. **මෙම සංචාරයේ ප්‍රතිඵලයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජේන් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කෙරිණි.**






2013 සැප්තැම්බර් ශ්‍රී ලාංකික නියෝජිත පිරිසක් ජේන් විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරත විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති මහාචාර්ය රංජිත් සේනාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් එහි පරිපාලන නිලධාරීන් , විශ්වවිද්‍යාල උප කුලපතිවරුන් සහ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් මෙම කණ්ඩායම සමන්විත විය. ඔවුහු ජේන් ආයතන සමූහය යටතේ ඇති විශ්වවිද්‍යාල සහ අධ්‍යාපන ආයතන කීපයක සංචාරයේ යෙදුන අතර පර්යේෂණ සහයෝගීතාව, ආචාර්යවරුන් හා ශිෂ්‍යයින් අතර හුවමාරු සම්බන්ධතා, ඒකාබද්ධ පර්යේෂණ කටයුතු, ඒකාබද්ධ පර්යේෂණ ප්‍රකාශන ආදිය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ජේන් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල සමාජිකයින් සමඟ සාකච්ඡා පැවැත්වූහ.






## 5.19 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයට විදේශ අමුත්තන් පැමිණීම.

චීනය, රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය, ඔස්ට්‍රේලියාව, නවසීලන්තය, ජර්මනිය, තායිලන්තය ආදී රටවල් කීපයක උසස් ගණයේ පුද්ගලයින්ගෙන් සැදුම්ලත් නියෝජිත පිරිස් අන්‍යොන්‍ය අවබෝධතා සම්බන්ධතා ශ්‍රී ලංකීය විශ්වවිද්‍යාල සමඟ ගොඩනඟා ගැනීමේ හැකියාව සොයා බැලීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පැමිණියහ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

- 2013 අගෝස්තු 1 දින චීනයේ ටියැංජින් චෙංජියැන් විශ්වවිද්‍යාලයේ ආචාර්ය ගේ ලියු , ටියැංජින් මැරිටයිම් විද්‍යාලයේ ෂැං කී මහතා, නැංකයි විශ්වවිද්‍යාලයේ ජුලි සන් මහතා සහ ටියැංජින් පොලිටෙක්නික් විශ්වවිද්‍යාලයේ ලූ සියඩොං මහතා - **චීනය**

- 2013 සැප්තැම්බර් 9 වන දින කළමනාකරණ සහ සංගම් විශ්වවිද්‍යාල (Management & Association Universities) සහ කුනේ සැපයුම් සේවා විශ්වවිද්‍යාලයේ පාඨමාලා පීඨාධිපති මහාචාර්ය මැතිස් හුන් මහතා 2013 සැප්තැම්බර් 9 වන දින පැවැත්විණි. - **ජර්මනිය**

- 2013 සැප්තැම්බර් 24 වන දින ලා ට්‍රෝබ් ව්‍යාපාර පාසලෙහි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය උප කුලපති සහ උප සභාපති මහාචාර්ය ජෝන් රොසෙම්බර්ග්, විධායක පීඨාධිපති හා මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය ලේ බ්‍රැක්, මහාචාර්ය ලා ට්‍රෝබ් සහ ව්‍යාපාර පාසලේ අංශ ප්‍රධානී මහාචාර්ය පෝල් මතර්, දකුණු ආසියානු කළමනාකාර අමිත් මල්හෝත්‍රා මහතා, ලා ට්‍රෝබ් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර සංවර්ධන කළමනාකාර ඔස්ට්‍රේලියාව සහ ජාත්‍යන්තර මෙහෙයුම් ඔස්ට්‍රේලියා වෙළඳ කොමිසමේ ඩේවිඩ් සැමුවෙල් මහතා. - **ඔස්ට්‍රේලියාව**

- 2013 ඔක්තෝබර් 1 වන දින ජෝර්ජියා රාජ්‍ය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා මහාචාර්ය උනිල් පෙරේරා. - **ඇට්ලන්ටා**

- 2013 නොවැම්බර් 11 දින මැසේ විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය රොබට් ඩී ඇන්ඩර්සන් සහ ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ අධ්‍යක්ෂ මයිකල් ඕෂවුනෙසී මහතා. **- නවසීලන්තය**

- 2013 දෙසැම්බර් 09 දින එන්පී පුෂ්චිනෝහි ජෛව තාක්ෂණික පර්ෂදයෙහි ආචාර්ය ර්.අයි.රුමියන්ත්සව මහතා. **- රුසියාව**

- 2013 දෙසැම්බර් 17 දින ආසියානු ආපදා සූදානම්කරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ආචාර්ය කරාසේ වනවොංසේ මහතා. **- තායිලන්තය**

## 6. මූල්‍ය පරිපාලනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, පර්යේෂණ හැකියා ශක්තිමත් කිරීම මඟින් විශ්වවිද්‍යාල පද්ධතිය නඟා සිටුවීම සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා මහත් පරිශ්‍රමයක නිරතවී සිටියි. ඒ අනුව 2013 අයවැය මඟින් මුදල් සැපයීමට ප්‍රමුඛ සංවර්ධන කටයුතු 8 ක් යෝජනා කර අනුමැතිය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව විසින් 2012 දෙසැම්බර් මස 09 වන දින අනුමත කළ පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුව විශ්වවිද්‍යාල අතර වියදම් ශීර්ෂ පහත ආකාරයට මුදාහරින ලදී;

**2013 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත අයවැය සහ අනුමත අයවැය සාරාංශය (රු:මිලියන)**

| **කාණ්ඩය /අරමුණ මතෘකාව** | ඇස්තමේන්තු අයවැය **2013** | අනුමත අයවැය **2013** | **අනුමත අයවැය ඇස්තමේන්තු ගත අයවැයෙහි ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | 20,540 | 17,125 | 83% |
| ප්‍රාග්ධන /සංවර්ධන ආධාර | 15,567 | 7,365 | 47% |
| **එකතුව** | **36,107** | **24,490** | **68%** |
| අතිරේක ප්‍රවේශ වලදී පුනරාවර්තන සඳහා අතිරේක වෙන් කිරීම් | - | 1,192 | - |
| අතිරේක ප්‍රවේශ වලදී ප්‍රාග්ධන සඳහා අතිරේක වෙන් කිරීම් | - | 1,159 | - |
| **මුළු ප්‍රදාන** | **36,107** | **26,841** | **-** |
| අභ්‍යන්තර ආදායම | 1,800 | 2,500 | අදාල නොමැත |

**6.1 පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා මහා භාණ්ඩාගාරය ඉහත අනුමත කළ ප්‍රදාන අරමුදල් සැපයීමේ ප්‍රතිපත්තිය අනුව විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන අතර පුනරාවර්තන සාමූහික ප්‍රදාන (RBG) සහ ප්‍රාග්ධන සාමූහික ප්‍රදාන (CBG) වශයෙන් වෙන් කරන ලදී.

**අ) ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා සංවර්ධනය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පවතින යටිතල පහසුකම් නඩත්තු කිරීම නව යටිතල පහසුකම් සකස් කිරීම මෙන්ම වැදගත් බව සළකා බලන ලදී. එහෙයින් ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම සඳහා සමස්ත අයවැයෙන් 11.56% ක් වෙන්කර තිබේ.

**ආ) ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම**

විශ්වවිද්‍යාල වලින් කරන ලද ඉල්ලීම් අනුව සමස්ත අයවැයෙන් 11.41% ක් විශ්වවිද්‍යාල වල ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම සඳහා වෙන් කරන ලදී.

**ඇ) යටිතල පහසුකම් සංවර්ධනය**

ක්‍රියාත්මක වෙමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 113 ට අමතරව 2013 ප්‍රාග්ධන / සංවර්ධන අයවැය යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන 2011/2020 මධ්‍ය කාලීන වැඩසටහන යටතේ නව ඉදිකිරීම් ව්‍යාපෘති 41 ක් සඳහා මූල්‍ය සැපයීමට යෝජනා වී ඇත.

**ඇ) දැනුම ප්‍රවර්ධන සහ ආයතනික සංවර්ධන වැඩසටහන (KEID)**

උසස් අධ්‍යාපනයේ සමස්ත අරමුණ ඉටු කරගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාවේ මෘදු කුසලතා හා හැකියාවන් වැඩිදියුණු කිරීම මඟින් ආයතනික හැකියාව වර්ධනය කිරීමට යෝජනා වී තිබිණි. ඒ අනුව 2013 වර්ෂය සඳහා දැනුම ප්‍රවර්ධන සහ ආයතනික සංවර්ධන වැඩසටහන (KEID) යටතේ පහත ව්‍යාපෘති අනුමත කරන ලදී.

**ව්‍යාපෘති 1:** *පවතින උපාධි පාඨමාලා වෘත්තීය හැකියාව ඇති උපාධිධාරීන් වැඩි වශයෙන් බිහි කරන පාඨමාලා බවට පත් කිරීම*

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ කලා උපාධිධාරීන්ගේ වෘත්තීය හැකියාව වැඩි දියුණු කිරීමයි.ඒ අනුව පහත සඳහන් යෝජනා ඉදිරිපත් විය;

**ආ)** ආසන්න වශයෙන් සාමාන්‍ය ස්ථාන (සාමාන්‍ය උපාධි) 2000 ක් වෙනුවට විශේෂ ස්ථාන (විශේෂ උපාධි) බිහි කිරීම.

**ඇ)** තොරතුරු තාක්ෂණ ආශ්‍රිත පරිසරයක රැකියා පුහුණුව ලබාදීම සහ ඔවුන්ට ස්වකීය නිපුණතා වැඩි දියුණු කිරීමට අවස්ථාව සලසා දීම.

**ඇ)** තොරතුරු තාක්ෂණ උපාධි පිරිනමන විශ්වවිද්‍යාල සහ අධ්‍යාපන ආයතන සමඟ සහයෝගීතා ගිවිසුම් වලට එළඹීම.

**ව්‍යාපෘති 2:** *ප්‍රථම උපාධි පාඨමාලා සිසුන්ගේ ත්‍රෛභාෂා කුසලතා වර්ධනය*

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ජාතික ඒකාබද්ධතාවය සහ සමගිය උදෙසා වන ප්‍රධාන පියවරක් වශයෙන් දිවයිනේ සෑම ප්‍රදේශයකම සිසුන්ගේ ත්‍රෛභාෂා කුසලතා වර්ධනයට සහ ප්‍රවීණතා සඳහා උනන්දු කරවීමයි. ඒ සඳහා පහත යෝජනා ඉදිරිපත් වී තිබිණි;

අ). විශ්වවිද්‍යාල විෂය මාලාවට දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂා ඇතුළත් කිරීම සහ ඒ සඳහා ශාස්ත්‍රීය අගය වෙන් කිරීම.

ආ) විශ්වවිද්‍යාලයෙහි භාෂා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම.

මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් විශ්වවිද්‍යාල වෙත සෘජුවම වෙන් කරන ලදී.

**ව්‍යාපෘති 3:** *ක්‍රීඩා කුසලතා සංවර්ධනය.*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල සහයෝගය සහිතව ප්‍රථම උපාධි පාඨමාලා සිසුන්ගේ ක්‍රීඩා කුසලතා හඳුනා ගැනීම, වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ක්‍රීඩා කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලදී.

2013 වර්ෂයේදි මෙම ව්‍යාපෘතිය සඳහා රු:මිලියන 21.4 ක් වැයකරන ලද අතර ඉන් රු: මිලියන 18.0ක් (ආසන්න වශයෙන්) රුසියාවේ පැවත්වුණු 27 වන ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල සඳහාය.

**ව්‍යාපෘති 4:** *පශ්චාත්උපාධි / ආචාර්ය උපාධි* ව්‍යාපෘති

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලයට පශ්චාත් උපාධි සහ දර්ශනශූරී උපාධි සුදුසුකම් ලබා ගැනීමට මූල්‍යමය සහයෝගය සැපයීමයි.

මෙම ව්‍යාපෘති සඳහා අරමුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / විශ්වවිද්‍යාල සහ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයන ජාතික ආයතනය වෙත ලබා දෙන ලදී. 2013 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියට රු: මිලියන 57.3 ක් වැය විය.

**ව්‍යාපෘති 5:** *ප්‍රවීණතා වැඩි දියුණු කිරීම සහ ශක්‍යතා වර්ධනය.*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මූල්‍ය ප්‍රතිපාදන සපයන ලද මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ගුණාත්මක උසස් අධ්‍යාපනයක් නිර්මාණය කිරීමේ සහ ලබා දීමේ ප්‍රධාන පාර්ශවකරුවන් වශයෙන් කුසලතා පරිපූර්ණ ආචාර්ය මණ්ඩලයක් , යහපත් දැක්මක් ඇති නායකයින්, කුසලතා පූර්ණ කැපවීමෙන් කටයුතු කරන කාර්මික සහ සහායක කාර්ය මණ්ඩලයක් බිහි කිරීමයි.

මෙම ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂය තුළ රු: මිලියන 79.6 ක් වැය කර ඇති අතර එයින් රුපියල් මිලියන 33.0ක් (ආසන්න වශයෙන්) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නායකත්ව සහ සමාරම්භක පුහුණු වැඩසටහන සඳහා ද රු:මිලියන 17.9 ක් කොළඹ විශ්වවිද්‍යාලයේ ශල්‍ය අධ්‍යයන අංශයේ ශල්‍ය උපකරණ සඳහා ද රු:මිලියන 2.6ක් විශ්වවිද්‍යාල සංස්කෘතික උළෙල සඳහා ද රු: මිලියන 1.5 ක් ප්‍රතිසන්ධානයේදී උසස් අධ්‍යාපනයේ කාර්යභාර්ය නම් ජාතික සමුළුවටද රු:මිලියන 5.0ක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කොළඹ කලාපීය මධ්‍යස්ථානයේ පුනරුත්ථාපන කටයුතු සඳහා ද යොදා ගන්නා ලදී.

<u>ව්‍යාපෘති 6: තොරතුරු තාක්ෂණ සංවර්ධනය</u>

2013 වර්ෂයේදී රු:මිලියන 11.3 ක් වැය කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එහි තොරතුරු තාක්ෂණ සංවර්ධන කමිටුවේ සම්බන්ධීකරණය මගින් ඵලදායී තොරතුරු තාක්ෂණ පද්ධතියක් විශ්වවිද්‍යාල පද්ධතිය පුරාම ප්‍රවර්ධනය කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පරිපාලනයේදී, ඉගැන්වීමේදී සහ පර්යේෂණ වලදී විශිෂ්ඨතාව, නවීකරණය, විශිෂ්ඨ ක්‍රියාකාරකම් සහ මුදලට සරිලන අගය ලබා දීම හා ඒ සඳහා සහාය වීම සඳහා තොරතුරු තාක්ෂණ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

**ශිෂ්‍ය කුසලතා සංවර්ධනය (වෘත්තීය මාර්ගෝපදේශනය සහ ශිෂ්‍ය සුභසාධනය)**

ප්‍රථම උපාධි පාඨමාලා සිසුන්ගේ ව්‍යවසායකත්ව කුසලතා හඳුනාගැනීම, වැඩිදියුණු කිරීම හා සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාලවල සහයෝගය සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෘත්තීය මාර්ගෝපදේශන සහ ශිෂ්‍ය සුභසාධන ස්ථාවර කමිටුව නිර්දේශ කරන ලද පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රු: මිලියන 1.67 අතිරේක මුදල් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා වැය කරන ලදී.

**ඉ) පර්යේෂණ ශක්තිමත් කිරීම**

**ව්‍යාපෘති 1** : <u>*ජාත්‍යන්තර සමුළු, පර්යේෂණ හා ප්‍රකාශන*</u>

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලයට ඊට අදාළ ප්‍රකාශන නිකුත් කිරීම සඳහා උනන්දු කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් අත්කර ගැනීම සඳහා ජාත්‍යන්තර සමුළු සංවිධානය කිරීමයි.

**ව්‍යාපෘති 2** : <u>*ජාතික සංවර්ධනය සඳහා පර්යේෂණ හා දැවෙන සමාජ ගැටළු විසඳීම.*</u>

හඳුනාගන්නා ලද පවතින සමාජ ආර්ථික ගැටළු නිරාකරණය වැනි ජාතික ප්‍රශ්න විසඳීම සම්බන්ධ පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ ව්‍යාපෘති යෝජනා සකස් කර අනුමැතිය සඳහා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට විශ්වවිද්‍යාල උනන්දු කෙරේ.

2013 වර්ෂයේ පවතින අරමුදල් අනුව රු: මිලියන 5.0 ට අඩු පර්යේෂණ ව්‍යාපෘති සඳහා මුදල් සැපයීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අවධානය යොමු කරන ලදී. මේ යටතේ කළමනාකරණ හා මූල්‍ය, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා, කෘෂි විද්‍යා, ව්‍යාපාර තොරතුරු, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායික වෛද්‍ය සහ ඖෂධවේදී විද්‍යා සහ රසායනික තාක්‍ෂණ යන විෂය ධාරා යටතේ ජාත්‍යන්තර මට්ටමේ සමුළු 7 ක් පැවැත්වීම සඳහා රු: මිලියන 2.0 ක් වැය කරන ලදී.

**ඊ) විශ්වවිද්‍යාල හයක් ජාත්‍යන්තර මට්ටමට සංවර්ධනය කිරීම**

2011 අය වැය යෝජනා වලදී අතිගරු ජනාධිපතිතුමා විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා වශයෙන් මෙම ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. මෙය විශ්වවිද්‍යාල වල තත්ත්වය සහ සමානාත්මතාව ඉහළ නංවා ගැනීමට සහ ස්වකීය අධ්‍යයන හා පරිපාලන කටයුතු වැඩි දියුණු කිරීමට උනන්දු කරවීමයි.

පේරාදෙණිය, කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, කැලණිය, මොරටුව සහ රුහුණු විශ්වවිද්‍යාල වලට 2011 වර්ෂයේදී අනුමත වූ පරිදි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලෙස දන්වන ලදී. 2013 වාර්ෂික වැය ශීර්ෂ යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් වැය කරන ලදී.

| විශ්වවිද්‍යාලයේ නම | ජාතික ශ්‍රේණිගත කිරීම | | ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම | |
|---|---|---|---|---|
| | **2012 ජූලි** | **2013 ජූලි** | **2012 ජූලි** | **2013 ජූලි** |
| කොළඹ විශ්වවිද්‍යාලය | 1 | 2 | 1682 | 2255 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 2 | 1 | 2011 | 2150 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 3 | 4 | 2467 | 2973 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 6 | 3 | 3294 | 2353 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 4 | 6 | 2759 | 5969 |
| කැළණිය විශ්වවිද්‍යාලය | 5 | 5 | 3048 | 4508 |

*මූලාශ්‍ර: වෙබෝමෙට්‍රික්ස්*

**උ) විශ්වවිද්‍යාල ආශ්‍රිත නගර සංවර්ධන ව්‍යාපෘතිය (UTP)**

විශ්වවිද්‍යාලවල නවෝත්පාදන සහ ඒවායේ පර්යේෂණ ප්‍රවර්ධනය සඳහා විශ්වවිද්‍යාල ආශ්‍රිත නගර සංවර්ධන නව සංකල්පය රජය විසින් ආරම්භ කරන ලදී. මෙම නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි අරමුණ විශ්වවිද්‍යාලයන්හි යටිතල පහසුකම් පුළුල් කිරීම සහ විශ්වවිද්‍යාලය ආශ්‍රිත නාගරික ප්‍රජාව සහ විශ්වවිද්‍යාලය ඒකාබද්ධ කිරීමයි.

විශ්වවිද්‍යාල ආශ්‍රිත නගර සංවර්ධන ව්‍යාපෘතිය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සම්බන්ධීකරණය කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ප්‍රථම අදියරේදී ශ්‍රී ජයවර්ධනපුර, රුහුණු, මොරටුව සහ යාපනය යන විශ්වවිද්‍යාල හඳුනාගෙන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

## 6.2 අරමුදල් බෙදාහැරීමේ ප්‍රතිපත්තිය

### (1) පුනරාවර්තන ප්‍රදාන වෙන් කිරීම (RG)

විශ්වවිද්‍යාල සහ ප්‍රථම උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතන සඳහා පුනරාවර්තන ප්‍රදාන වෙන්කිරීම පහත සඳහන් සූත්‍රය පදනම් කරගෙන කරන ලදී.

| |
|---|
| ***පුනරාවර්තන ප්‍රදාන = ශිෂ්‍යයෙකු සඳහා වන සකස් කරන ලද පිරිවැය X ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව*** |

අ) පහත සඳහන් ප්‍රතිපත්ති සාධක කෙරෙහි අවධානය යොමු කොට ශිෂ්‍යයෙකු සඳහා වන සකස් කරන ලද පිරිවැය ගණනය කරන ලදී;

- එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් සේවකයින්ගේ වාර්ෂික වැටුප් වර්ධක
- වෙනත් පුනරාවර්තන වියදම් සඳහා 10% ක උද්ධමන ගැළපීම
- වෙනත් පුනරාවර්තන වියදම් සඳහා 10% ක ශක්‍යතා පුළුල් කිරීම
- ශිෂ්‍යයෙකු සඳහා වන වියදම ඉහළ යාම

(ආ) පශ්චාත් උපාධි ආයතන සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා පුනරාවර්තන ප්‍රදාන පහත දැක්වෙන අරමුදල් ප්‍රතිපත්තිය මත වෙන් කරන ලදී;

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල සඳහා වන මුළු පුනරාවර්තන ප්‍රදානවලින් 2/3 ක්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලදී.
- පශ්චාත් උපාධි ආයතනවලට ස්වකීය වාර්ෂික අයවැය සඳහා ආයතනයක් ලබා ගන්නා අභ්‍යන්තර ආදායමෙන් සම්පාදනය කර ගැනීමට උනන්දු කරන ලදී. එහෙයින් රජයේ ප්‍රදාන අභ්‍යන්තර ආදායමෙන් පියවා ගැනීමට නොහැකි වියදම් පියවා ගැනීම සඳහා පමණක් විය.

### (2) ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම් (CG)

අ) **ප්‍රමුඛතා අනුව අරමුදල් ලබා දීම.**

ව්‍යාපෘති විමර්ශන හා ඇගයීම් කමිටුව මඟින් නිර්දේශ කරන ලද පරිදි ප්‍රමුඛතා අනුව අරමුදල් සැපයීමේ ප්‍රතිපත්තියට අනුව ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීමේදී පහත සඳහන් නිර්ණායක පහ සළකා බලන ලදී;

**i.** ක්‍රියාත්මක වෙමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති.

**ii.** දස වර්ෂ මධ්‍ය කාලීන ව්‍යාපෘති යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති

**iii.** පිඨ භාරය / පිඨ බර තැබීම, එක් එක් විශ්වවිද්‍යාලයට පුනරුත්ථාපනය සහ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා වෙන් කිරීම්, එක් විෂය ධාරාවක් සඳහා වන සාපේක්ෂ පිරිවැය සාධකය මත විශ්වවිද්‍යාල භාරය ගණනය කරන ලදී.

***යෝජිත සාපේක්ෂ පිරිවැය සාධක***

වෛද්‍ය විද්‍යාව - 5, විද්‍යාව- 2, කළමනාකරණය- 1, නීතිය - 1, කලා - 1, අධ්‍යාපන - 1, ඉංජිනේරු විද්‍යාව - 3, පශු වෛද්‍ය විද්‍යාව- 4, කෘෂි විද්‍යාව - 3, පරිපූරක වෛද්‍ය - 2

**iv.** පහත දක්වෙන වගුවෙහි දක්වා ඇති ස්ථර තුන යටතේ උපරිම සහ අවම ප්‍රාග්ධන ආධාර මට්ටම් හඳුන්වා දෙන ලදී;

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයට විශේෂ කුවේට් ප්‍රදාන යටතේ අරමුදල් සැපයූ බැවින් උතුරු නැගෙනහිර ස්ථරය යටතේ අරමුදල් සැපයීමෙන් වැළකී සිටින ලදී.

**උපරිම සහ අවම ප්‍රාග්ධන ආධාර මට්ටම්**

| ස්ථරය | | විශ්වවිද්‍යාල | උපරිම මට්ටම - *සියුවකු සඳහා ප්‍රාග්ධන ආධාර* | අවම මට්ටම - *විශ්වවිද්‍යාලයක් සඳහා මුළු ප්‍රාග්ධන ආධාර* |
|---|---|---|---|---|
| ටී-1 | ස්ථාපිත විශ්වවිද්‍යාල | පේරාදෙණිය, කොළඹ, කැළණිය, මොරටුව, රුහුණු | රු:45,000/-සිට රු:60,000/- දක්වා | කුඩා විශ්වවිද්‍යාල සඳහා රු.225,000/- අවම වෙන් කිරීමක් සහතික කිරීමට රු. 225,000/ බැගින් එක් විශ්වවිද්‍යාලයකට |
| ටී-2 | උතුරු සහ නැගෙනහිර විශ්වවිද්‍යාල | යාපනය, නැගෙනහිර | රු:125000/-සිට රු:200,000/- දක්වා | |
| ටී-3 | නව විශ්වවිද්‍යාල | රුහුණු, වයඹ, ඌව , සබරගමුව, අග්නිදිග,සෞන්දර්ය කලා, | රු:120,000/-සිට රු:175,000/- දක්වා | |

**v.** ව්‍යාපෘති විමර්ශන සහ ඇගයීම් කමිටුව විසින් අනුමත කළ පරිදි උසස් අධ්‍යාපන ආයතන වල අවශ්‍යතා සහ ප්‍රමුඛතා සාධක පදනම් කරගෙන පශ්චාත් උපාධි ආයතන සහ සියලුම උසස් අධ්‍යාපන ආයතන වෙත අරමුදල් වෙන් කරන ලදී.

(ආ) කාර්ය ඵලය පදනම් කර අරමුදල් සැපයීම.

2013 ජූලි 11 දින එක් ප්‍රගති සමාලෝචන රැස්වීමක් පැවැත්වූ අතර ප්‍රාග්ධන ආධාර උපයෝගීතා කාර්ය සාධනය ඇගයීම සඳහා 2013 සිව්වන කාර්තුවේදී උසස් අධ්‍යාපන ආයතන වලින් ප්‍රගති වාර්තා ලබා ගන්නා ලදී. ඒ අනුව විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල කාර්යක්‍ෂමතාව අනුව අතිරේක අරමුදල් නැවත ප්‍රති වෙන්කිරීම් / වෙන් කිරීම් කරන ලදී.

## 6.3 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතා කිරීම

වර්ෂය තුළ මුළු ප්‍රදාන (අතිරේක ප්‍රදාන ඇතුළුව) සහ මුදාහරින ලද / භාවිතා කරන ලද මුදල් ප්‍රමාණයන් පසුගිය වර්ෂය සමඟ සංසන්දනාත්මකව පහත දැක්වේ.

| ප්‍රදාන | 2012 වර්ෂය | | | | 2013 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|---|
| | මුළු අරමුදල් වෙන්කිරීම් රු:මිලියන | මුදා හරින ලද මුළු මුදල රු:මිලියන | මුදාහැරීම්/ භාවිතා කිරීම් මුළු වෙන්කිරීම් වලින් % ලෙස | | මුළු අරමුදල් වෙන්කිරීම් රු:මිලියන | මුදා හරින ලද මුළු මුදල රු:මිලියන | මුදාහැරීම්/භාවිතා කිරීම් මුළු වෙන්කිරීම් වලින් % ලෙස |
| පුනරාවර්තන ප්‍රදාන | 14,719.0 | 14,611.0 | 99% | | 18,316.5 | 16,932.4 | 92% |
| | | | | | | | |
| ප්‍රාග්ධන ආධාර | 5,778.5 | 4,340.8 | 75% | | 8,524.2 | 5,820.1 | 68% |
| එකතුව | **20,497.5** | **18,951.8** | **92%** | | **26,840.7** | **22,752.5** | **85%** |

පසුගිය වසරට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන සහ ප්‍රාග්ධන ආධාර පිළිවෙලින් 24% කින් සහ 48% කින් ඉහළ ගොස් තිබේ.

ඉහත වගුවේ දක්වා ඇති ආකාරයට අනුව 2013 වර්ෂයේ ප්‍රාග්ධන ආධාර උපයෝගීතාව / මුදාහැරීම මුළු ප්‍රාග්ධන වෙන් කිරීමෙන් 68% පමණ වූ රු. මිලියන 5820.1 ක් වූ අතර එය 2012 වර්ෂයට සාපේක්ෂව 7% ක පහළ යාමකි. නමුත් වියදමට අනුව එය පසුගිය වර්ෂයට වඩා 34% ක ඉහළ යාමකි. (2012 – රු: මිලියන 4,340.8 / 2013 – රු: මිලියන 5,820.1).

2013වර්ෂයේදී ප්‍රාග්ධන ආධාර භාවිතය පහළ අගයක පැවතීමට ප්‍රධාන කරුණ වූයේ වර්ෂයේ තුන්වන සහ හතරවන කාර්තුවලදී ඉල්ලුම් කරන ලද අරමුදල් මහා භාණ්ඩාගාරය විසින් මුදාහැරීමෙන් වැලකී සිටීමයි.

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි 2009 - 2013 දක්වා මූල්‍ය ක්‍රියාකාරීත්වය**

| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| **රාජ්‍ය වෙන්කිරීම්** | | | | | |
| පුනරාවර්තන | 11,107 | 11,415 | 13,161 | 14,719 | 18,317 |
| ප්‍රාග්ධන | 4,520 | 3,500 | 7,100 | 5,779 | 8,524 |
| **වියදම්** | | | | | |
| පුනරාවර්තන | 10,227 | 10,962 | 12,961 | 14,591 | 16,932 |
| ප්‍රාග්ධන | 2,726 | 2,832 | 4,279 | 4,361 | 5,820 |
| **ශිෂ්‍ය මූල්‍ය අධාර** | | | | | |
| මහපොළ | 92 | 93 | 127 | 101 | 94 |
| ශිෂ්‍යාධාර | 297 | 328 | 357 | 283 | 386 |
| සුනාමි සහ පරිත්‍යාග ශිෂ්‍යත්ව | 1 | 2 | 1 | 1 | 0.04 |



**මූල්‍ය පරිපාලනය - 214 ශීර්ෂය**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව , විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන**
**පුනරාවර්තන /ප්‍රාග්ධන ප්‍රදාන වෙන්කිරීම - වර්ෂ 2011 සිට2013 දක්වා (රු:මිලියන)**

| විශ්වවිද්‍යාල/ආයතන | ප්‍රාග්ධන ප්‍රදාන | | | පුනරාවර්තන ප්‍රදාන | | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 |
| පේරාදෙණිය | 464 | 393 | 742 | 2,235 | 2,267 | 2,627 |
| කොළඹ | 400 | 357 | 664 | 1,243 | 1,270 | 1,586 |
| ශ්‍රී ජයවර්ධනපුර | 383 | 354 | 729 | 1,126 | 1,302 | 1,691 |
| කැලණිය | 386 | 350 | 427 | 1,100 | 1,256 | 1,614 |
| මොරටුව | 375 | 289 | 546 | 882 | 942 | 1,165 |
| රුහුණු | 455 | 337 | 568 | 1,153 | 1,223 | 1,475 |
| යාපනය | 545 | 543 | 794 | 786 | 869 | 959 |
| විවෘත | 70 | 67 | 73 | 635 | 663 | 861 |
| නැගෙනහිර | 230 | 422 | 588 | 372 | 427 | 514 |
| රජරට | 1,033 | 575 | 512 | 503 | 624 | 820 |
| සබරගමුව | 387 | 321 | 435 | 431 | 531 | 624 |
| අග්නිදිග | 181 | 244 | 308 | 318 | 338 | 460 |
| වයඹ | 312 | 292 | 556 | 379 | 431 | 622 |
| සෞන්දර්ය කලා | 342 | 194 | 262 | 328 | 379 | 469 |
| ඌව වෙල්ලස්ස | 287 | 207 | 300 | 180 | 234 | 319 |
| කෘෂි විද්‍යා පශ්චාත් උපාධි | 2 | 5 | 9 | 23 | 15 | 19 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි | 1 | 8 | 28 | 80 | 64 | 55 |
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි | 22 | 5 | 9 | 43 | 45 | 49 |
| කළමනාකරණ පශ්චාත් උපාධි | 15 | - | - | - | - | - |
| විද්‍යා පශ්චාත් උපාධි | 6 | 5 | 9 | 19 | 11 | 10 |
| පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි | 1 | 4 | 3 | 11 | 10 | 11 |
| ඉංග්‍රීසි පශ්චාත් උපාධි | 1 | 1 | 4 | 4 | 7 | 10 |
| දේශීය වෛද්‍ය විද්‍යා | 25 | 36 | 74 | 137 | 157 | 195 |
| මානව සම්පත් අභිවර්ධන | 4 | 7 | 11 | 22 | 25 | 33 |
| කො වි.වි පරිගණක අධ්‍යයන | 38 | 25 | 27 | 85 | 93 | 90 |
| ගම්පහ වික්‍රමාරච්චි | 149 | 91 | 146 | 111 | 128 | 144 |
| මොරටුව තාක්‍ෂණ ආයතනය | 5 | 5 | 10 | 77 | 74 | 115 |
| ජාතික පුස්තකාල හා විඥාපන | 2 | 2 | 4 | 8 | 9 | 12 |
| ජෛව රසායන,අනුක ජෛව | 31 | 29 | 18 | 35 | 35 | 48 |
| ස්වාමි විපුලානන්ද | 18 | 18 | 58 | 42 | 58 | 72 |
| මානව. සමාජ,අධ්‍යයන ජාතික | 82 | 68 | 90 | 10 | 11 | 14 |
| ත්‍රිකුණාමලය මණ්ඩපය | 129 | 73 | 203 | 69 | 89 | 132 |
| වව්නියාව | - | - | - | - | - | 133 |
| කෘෂි තාක්ෂණ ග්‍රාමීය විද්‍යා | 21 | 24 | 17 | 7 | 8 | 11 |
| වි.වි. කො.ස | 701 | 427 | 300 | 153 | 151 | 1,292 |
| දකුණු ආසියානු විශ්වවිද්‍යාල | - | - | - | - | - | - |
| **එකතුව** | **7,100** | **5,779** | **8,524** | **12,610** | **13,744** | **18,248** |
| කාර්යසාධන ප්‍රතිපාදන | - | - | - | 551 | 975 | 68 |
| **මුළු එකතුව** | **7,100** | **5,779** | **8,524** | **13,161** | **14,719** | **18,317** |

## 7 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලීය සේවක සංඛ්‍යාව

2013 වර්ෂය වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා විධායක ශ්‍රේණි තනතුරු 63 ක් ද ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි තනතුරු 177 ක් ද වෙනත් කණිෂ්ඨ ශ්‍රේණි තනතුරු 53 ක් ද වශයෙන් තනතුරු 293 කින් සමන්විත සේවක සංඛ්‍යාවක් සඳහා ප්‍රතිපාදන සලසා තිබිණි. එයින් 2013 දෙසැම්බර් 31 දිනට පළමු කාණ්ඩයෙන් 40 ක් ද දෙවන කාණ්ඩයෙන් 119 ක් ද තෙවන කාණ්ඩයෙන් 47 ක්ද පමණක් සේවයේ නියුතු විය.

| | **2013** | | **2012** | | **2011** | |
|---|---|---|---|---|---|---|
| | **සේවක සංඛ්‍යාව** | **2013.12.31 දිනට සේවයේ නිරත** | **සේවක සංඛ්‍යාව** | **2012.12.31 දිනට සේවයේ නිරත** | **සේවක සංඛ්‍යාව** | **2011.12.31 දිනට සේවයේ නිරත** |
| විධායක ශ්‍රේණි | 63 | 40 | 60 | 41 | 52 | 38 |
| ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි | 177 | 119 | 179 | 120 | 159 | 118 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 53 | 47 | 53 | 47 | 57 | 46 |
| **එකතුව** | **293** | **206** | **292** | **208** | **268** | **202** |

### 7.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයින්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථිර කිරීම්, මාරු කිරීම්, විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයට සමාලෝචිත වර්ෂය තුළදී ස්ථිර 27 ක්ද / කොන්ත්‍රාත් පදනම මත / පැවරුම් පදනම මත / දෛනික ගෙවීම් පදනම මත 09 ක්ද වශයෙන් සේවකයින් බඳවා ගන්නා ලදී. ස්ථිර පත්වීම් වලින් 12 ක් විධායක ශ්‍රේණි කාණ්ඩයට අයත් විය.

එම වර්ෂය තුළදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විධායක ඇතුළුව ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි කාණ්ඩවල සේවකයින් සඳහා උසස් වීම් 9ක් ද ස්ථිර කිරීම් 14 ක්ද ලබා දෙන ලදී.

2013 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයේ සේවයේ නියුක්තව සිටි සේවකයින්ගෙන් 12 ක් උසස් අධ්‍යාපන ආයතන වෙත මාරු කරනු ලැබූ අතර උසස් අධ්‍යාපන ආයතන වලින් සේවකයින් තුන් දෙනෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයට මාරුවෙන ලදී.

2013 වර්ෂයේදී සේවකයින් 4 දෙනෙක් විශ්‍රාම ලැබූ අතර සේවකයින් 5 ක් සිය තනතුරු වලින් ඉල්ලා අස් වූහ.

### 7.2 දීර්ඝ කාලීන සේවා තිළිණ

ලේකම් කාර්යාලයේ සේවකයින්ගෙන් තිදෙනෙක් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 678, 696 සහ 893 ප්‍රකාර දීර්ඝ කාලීන සේවා තිළිණ ලැබීමට සුදුසුකම් ලැබූහ. ඔවුන් වෙත විශ්වවිද්‍යාල පද්ධතියට සිදු කරන ලද දීර්ඝ කාලීන සම්මානනීය සේවාව වෙනුවෙන් මුදල් ත්‍යාග ලබා දෙන ලදී.

ඔවුන් තිදෙනාගෙන් එක් අයෙක් වසර තිහක සේවා කාලයක් සම්පූර්ණ කර තිබූ අතර අනෙක් දෙදෙනා වසර 25 ක සේවා කාල සම්පූර්ණ කර තිබිණි.

## 7.3 කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය

සෑම වර්ෂයකම ලේකම් කාර්යාලීය කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සිය නිපුණතා සහ සේවා දැනුම දියුණු කර ගැනීම සඳහා ස්වකීය රාජකාරී වලට අදාළ වැඩමුළු / පුහුණු පාඨමාලාවන්ට සහභාගී වීමට අවස්ථාව ලබාදෙනු ලැබේ. වැඩමුළු / පුහුණු පාඨමාලා රාජ්‍ය මූල්‍ය සංවර්ධන ආයතනය, ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ව්‍යාපාර කළමනාකාරීත්ව ජාතික ආයතනය, 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයන ජාතික ආයතනය, නිපුණතා සංවර්ධන අරමුදල, ශ්‍රී ලංකා පදනම් ආයතනය, බ්‍රිතාන්‍ය කවුන්සිලය ආදී පිළිගත් ආයතන විසින් මෙහෙයවන ලදී.

මීට අමතරව ස්වකීය රැකියා සංවර්ධනයට ආධාර වන විශ්වවිද්‍යාල පද්ධතියට අයත් උසස් අධ්‍යාපන ආයතන මඟින් මෙහෙයවනු ලබන අධ්‍යයන පාඨමාලා හැදෑරීමට අදහස් කරන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මූල්‍ය ආධාර සැපයීමේ ප්‍රතිපාදන ද සලසා තිබේ.

**(1)** සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද විධායක කාර්ය මණ්ඩල සාමාජිකයින් 16 ක් ද විධායක නොවන කාර්ය මණ්ඩල සාමාජිකයින් 20 ක් ද ඔවුන්ගේ කාර්ය ක්ෂේත්‍රයන්ට ඍජුවම අදාළ වන පුහුණු සහ සංවර්ධන පාඨමාලා සඳහා සහභාගී විය.

**(2)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලයේ දෙමළ භාෂා දැනුම වැඩි දියුණු කිරීම සඳහා ජාතික භාෂා අධ්‍යයන ආයතනයේ සහයෝගය සහිතව දෙමළ භාෂා පාඨමාලාවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයේදී ආරම්භ කළ අතර 45 ක සේවක පිරිසක් එය හැදෑරූහ.

**(3)** ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි සහ සුළු ශ්‍රේණි වලට අයත් සේවක කාණ්ඩ කණ්ඩායම් තුනක් සඳහා රැකියා පෞරුෂත්ව සංවර්ධනය සහ සුළු සේවක නිපුණතා සංවර්ධනය / පෞරුෂය හැඩගැන්වීම පිළිබඳ එක් දින පුහුණුවක් පැවැත්විණි.

**(4)** විධායක නිලධාරීන් හය දෙනෙක් සඳහා කෙටි කාලීන විදේශ පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීමට රාජකාරී නිවාඩු ලබා දෙන ලදී.

## 7.4 ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය විසින් සංවිධානය කරන ලද සමස්ත ලංකා ක්‍රීඩා උළෙලට සැපයූ විශේෂ දායකත්වය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලීය සේවකයින් ඉහත සඳහන් 2012/2013 දීපව්‍යාප්ත ක්‍රීඩා උළෙලට ප්‍රථම වරට සහභාගී වූ අතර සහභාගී වූ ක්‍රීඩා ඉසව් විශාල සංඛ්‍යාවකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ජයග්‍රහණ ලබා දීමට ඔවුන් සමත් විය.

### 7.5 සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සියළුම ස්ථිර සේවකයන් සඳහා වඩාත් ඵලදායී සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ දැනට පවතින සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය පුළුල් කරන ලදී.

### 7.6 ඇගයීම සහ පිළිගැනීම

සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභා සේවයෙන් ඉවත්වූ සේවකයින් විසින් ඉටු කරන ලද සේවය අගය කිරීමටත් එම වර්ෂය තුළදී අළුතින් සේවයට එක්වූ සේවකයින් පිළිගැනීමත් කොමිෂන් සභාව වාර්තා කරයි.

## 8. මානව සම්පත් ප්‍රගතිය

### 8.1 සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ සැළකිල්ලට ගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2013 වර්ෂයේ උසස් අධ්‍යාපන ආයතන සඳහා නව කාර්යය මණ්ඩල තනතුරු 613 ක් අනුමත කරන ලදී. විශ්වවිද්‍යාල සේවක සංඛ්‍යාව පසුගිය අවුරුදු 4-5 තුළ ඉහළ ගිය ආකාරය පහත සඳහන් වේ;

| | *2009* | *2010* | *2011* | *2012* | *2013* |
|---|---|---|---|---|---|
| අධ්‍යයන කාර්යමණ්ඩලය | 7,533 | 7,551 | 8,021 | 8,290 | 8,510 |
| අධ්‍යයන සහය කාර්යමණ්ඩලය | 880 | 882 | 882 | 906 | 939 |
| පරිපාලන සහ සමාන්තර කා.ම | 877 | 879 | 898 | 1,023 | 1,075 |
| අනධ්‍යයන, පරිපාලනමය නොවන කා.ම | 10,463 | 10,471 | 10,491 | 10,824 | 11,132 |
| | **19,753** | **19,783** | **20,292** | **21,043** | **21,656** |

* වෛද්‍ය නිලධාරීන් අතුළුව

### 8.2 පරිපාලන ශ්‍රේණි සඳහා පත්කිරීම් / උසස් කිරීම්

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71(2) වගන්තියෙහි සහ 8(1) වගන්තියෙහි (ii) ඡේදය හා (iii) ඡේදය ප්‍රකාර පරිපාලනමය ශ්‍රේණිවල පත් කිරීම් / උසස් කිරීම් කළ යුත්තේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි. 2013 වර්ෂයේදී පහත ආකාරයට පත් කිරීම් / උසස් කිරීම් සිදුකරන ලදී.

**පත්වීම්**

- ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - 12
- ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක -14
- සහකාර ලේකම් තනතුර / ලේඛකාධිකාරී (නීති සහ ලේඛනගත කිරීම්) - 03
- සහකාර ලේඛකාධිකාරී තනතුර (පුස්තකාල සේවා) - 06

**උසස්වීම්**

අ) ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරු U-EX 2(1) වැටුප් පරිමාණයේ තැබීම.

- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - 05
- ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක - 01

ආ) වාර්ෂික කාර්යසාධන ඇගයීම් වාර්තා ක්‍රමය (කොමිෂන් සභා චක්‍රලේඛ අංක 668 ප්‍රකාර) අනුව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරු සඳහා කරන ලද උසස් කිරීම්.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | - 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | - 06 |

ඇ) නියෝජ්‍ය ලේකම් තනතුර / නියෝජ්‍ය ලේඛකාධිකාරී - 13

ඈ) නියෝජ්‍ය ගණකාධිකාරී තනතුර / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක - 06

ඉ) ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර (පුස්තකාල සේවා) 04

8.3 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71(2) (iii) වගන්තිය ප්‍රකාර පරිපාලනමය නොවන අනධ්‍යන ශ්‍රේණි වල පහත සඳහන් පත් කිරීම් සහ උසස් කිරීම්, 2013 වර්ෂයේ දී සිදුකරන ලදී.

i. **පත්වීම්**

| **තනතුර** | **පත්වීම් සංඛ්‍යාව** |
|---|---|
| ඉංජිනේරු (සිවිල්) තුන්වන ශ්‍රේණිය | 03 |
| විදුලි ඉංජිනේරු තුන්වන ශ්‍රේණිය | 01 |
| තොරතුරු පද්ධති කළමනාකරු | 01 |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | 02 |
| දන්ත ශල්‍ය වෛද්‍ය | 01 |
| පාලක (වතු අලංකරණය) III ශ්‍රේණිය | 01 |
| කලාපයේ අධ්‍යාපන සේවයේ සහකාර අධ්‍යක්ෂක | 18 |
| නවාතැන් අධ්‍යක්ෂක | 01 |
| වෛද්‍ය නිලධාරී | 07 |
| වැඩපළ ඉංජිනේරු III ශ්‍රේණිය | 01 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 02 |
| ගොවිපල කළමණාකරු | 01 |

ii. **උසස්වීම්**

| **තනතුර** | **පත්වීම් සංඛ්‍යාව** |
|---|---|
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී –I ශ්‍රේණිය | 03 |
| ප්‍රධාන තාක්ෂණික නිලධාරී | 02 |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණික නිලධාරී (ඉහළ ශ්‍රේණිය) | 01 |
| ජ්‍යෙෂ්ඨ පුද්ගලික ලේකම් | 01 |
| ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික තාක්ෂණික නිලධාරී | 06 |
| වැඩ ඉංජිනේරු II ශ්‍රේණිය | 01 |

iii. U-EX 2(III) වැටුප් පරිමාණයේ සිටි සේවකයින් 11 දෙනෙක් කාර්යක්ෂමතා කඩඉමට ඉහළ U-EX 2(II) වැටුප් පරිමාණයේ තබන ලදී.

**8.4** ***අන්තර් විශ්වවිද්‍යාල මාරු වීම් - 2013***

විශ්වවිද්‍යාල පනතේ 78 වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2013 වර්ෂයේදී පහත සඳහන් මාරුවීම් ක්‍රියාත්මක කරන ලදී.

පරිපාලන ශ්‍රේණි - 26
අනධ්‍යාන, පරිපාලන නොවන කාර්ය මණ්ඩලය - 143

**8.5** **ප්‍රායෝගික පුහුණුව ලබාදීම.**

2007.03.29 දිනැති 3/2007 දරන ආයතන චක්‍රලේඛ ලිපිය මඟින් සංශෝධනය කරන ලද අංක 10/2002 ආයතන චක්‍රලේඛ ලිපිය මඟින් අදාළ කර ගන්නා ලද 2000.07.19 දිනැති අංක 12/2000 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රායෝගික පුහුණු වන්නන් 643 කට උසස් අධ්‍යාපන ආයතනයන්හි පුහුණුව ලැබීමට අනුමැතිය ලබා දෙන ලදී.

| | **2013** | **2012** |
|---|---|---|
| පුහුණුවන්නන් සංඛ්‍යාව | 643 | 930 |

**8.6** **කාර්යමණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්**

- පරිපාලන සහ මූල්‍ය නිලධාරී ශ්‍රේණි වලට අලුතින් බඳවා ගන්නා ලද සියලුම නිලධාරීන් සඳහා සකස් කරන ලද "විශ්වවිද්‍යාල සේවයේ පරිපාලන සහ මූල්‍ය නිලධාරීන් සඳහා වන කාර්ය සමාරම්භක පුහුණු පාඨමාලාව" 2013 මැයි මස ආරම්භ කරන ලදී. එය අඛණ්ඩව මාස 3 ක කාලයක් තුළ පුහුණු සැසි 3 කින් සමන්විත විය. (මසකට සතියක් බැගින්) අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුම ඇති පුද්ගලයින් විසින් ඒ සඳහා අවශ්‍ය වූ පුහුණු අත්පොත් සකස් කරන ලදී.

- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන විසින් විසිඑක් වැනි සියවස සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතිය සහ මානව සම්පත් සංවර්ධන ඒකකය සමඟ ඒකාබද්ධව පරිපාලන ශ්‍රේණි අතුළුව අනධ්‍යන කාර්ය මණ්ඩලයේ සියලු කාණ්ඩ සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ, අග්නිදිග විශ්වවිද්‍යාලයේ සහ නැගෙනහිර විශ්වවිද්‍යාලයේදී "අනධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය මෘදු කුසලතා" පිළිබඳ පුහුණු පාඨමාලා මෙහෙය වන ලදී.

- ශ්‍රී ජයවර්ධනපුර, කැළණිය, කොළඹ සහ රුහුණු විශ්වවිද්‍යාලයන්හි කළමනාකරණ පීඨ වල පීඨාධිපතිවරුන් විසින් නම් කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා "කළමනාකරණ පීඨ සඳහා විෂය මාලා සංවර්ධන වැඩමුළුව" 2013 ජූලි මස පවත්වන ලදී.

- ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලය සතුව යාවජීව නිපුණතා සහ ප්‍රවීණතා ඇත්නම් මිස, ප්‍රථම උපාධිමාලා සිසුන්ට එම නිපුණතා ලබා දීමට ගන්නා ප්‍රයත්නයන් අති සාර්ථක විය නොහැක. මෙම කරුණ පුස්තකාල සහ විඥාපන විද්‍යා ස්ථාවර කමිටුව විසින් අවධානයට යොමු කළ අතර දැනට ක්‍රියාත්මක වන කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහනට මෙම ස්ථාවර කමිටුවේ නිර්දේශ සහිතව තොරතුරු සාක්ෂරතා අධ්‍යයන ඒකකයක් ඒකාබද්ධ කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කරන ලදී.

- අධ්‍යයන කාර්ය මණ්ඩලයට සේවා සමාරම්භක පුහුණු පාඨමාලා සහ අධ්‍යයන, පරිපාලන, මූල්‍ය, විධායක, කාර්මික. අනධ්‍යන, ලිපිකරු සහ සුළු සේවක කාණ්ඩයන්ට අයත් කාර්ය මණ්ඩලයේ සියලුම කාණ්ඩ සඳහා කෙටිකාලීන පුහුණු පාඨමාලා, වැඩමුළු, බාහිර පුහුණු ආදිය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන 15 හිම නිරන්තරයෙන් මෙහෙයවනු ලබයි.

- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන විසින් 2011/2012 වර්ෂවල ප්‍රදානය කරන ලද අරමුදල් කාර්ය මණ්ඩල සංවර්ධන කටයුතු ශක්තිමත් කිරීම සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම සහ විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන වල කාර්ය මණ්ඩලයේ සියලුම කාණ්ඩ සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන පාඨමාලා පැවැත්වීම සඳහා ඵලදායීව භාවිතා කරන ලදී. මේ අනුව 2013 වර්ෂයේදී ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව රු. මිලියන 50 කට ආසන්න මුදලක් කාර්ය මණ්ඩල සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලද අතර ඉන් රු. මිලියන 30 ක් එක් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයකට රු. මිලියන 2 ක බැගින් කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන වෙත ප්‍රදානය කරන ලදී. එම අරමුදල් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන විසින් පළමු වර වට දෙකකදී ලබා දුන් අරමුදල් වලින් මේ වන විට ආරම්භ කර ඇති කටයුතු / පාඨමාලා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා සහ නව කාර්ය මණ්ඩල සංවර්ධන පාඨමාලා සැලසුම් කිරීමට සහ ආරම්භ කිරීමට යොදා ගන්නා ලදී.

## 8.7 විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ශිෂ්‍යත්ව අධි ශිෂ්‍යත්ව පර්යේෂණ ප්‍රතිපාදන සහ අනෙකුත් මූල්‍ය සහය ලබාදීම.

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සහ ශක්තිමත් කිරීම පිණිස දේශීය හෝ විදේශීය වශයෙන් ස්වකීය උසස් අධ්‍යාපනය හැදෑරීමට විශේෂයෙන්ම කණිෂ්ඨ ආචාර්යවරුන්ට අවස්ථාව ලබා දීම සඳහා අධ්‍යයන මණ්ඩලයට පහසුකම් ලබාදීමට හා අනුබල දීමට කැපවූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රතිපත්තියෙහි පිහිටා වඩ වඩාත් අරමුදල් ලබාදීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පසුගිය වසර කිහිපය තුළ මහත් ප්‍රයත්නයක් දරන ලදී. එකී අරමුණු ළඟා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් ප්‍රතිපාදන ලබා දෙන ලදී;

### අ). දර්ශනශූරී පර්යේෂණ උපාධිය සඳහා දේශීය පර්යේෂණ ප්‍රතිපාදන

පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා පවත්නා අවස්ථා වැඩි කරනු වස් පර්යේෂණ උපාධි සඳහා දේශීය පර්යේෂණ ප්‍රතිපාදන යටතේ 2013 වර්ෂයේදී විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 34 ට රුපියල් 8,803,427/05 ක ප්‍රතිපාදන ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

| | ප්‍රදාන ලාභීන් සංඛ්‍යාව | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය රුපියල් | ප්‍රමාණය රුපියල් | ප්‍රමාණය රුපියල් | ප්‍රමාණය රුපියල් | ප්‍රමාණය රුපියල් | ප්‍රමාණය රුපියල් |
| 2008 කණ්ඩායම | 03 | 5,950,000 | 1,075,000 | 500,000 | 2,750,182 | 550,000.00 | 592,347.00 |
| 2009 කණ්ඩායම | 08 | - | 5,350,125 | 7,273,900 | 1,381,700 | 2,540,187.05 | 2,212,825.05 |
| 2011 කණ්ඩායම | 18 | - | - | - | 2,530,000 | 2,530,819.00 | 4,138,255.00 |
| 2012 කණ්ඩායම | 05 | - | - | - | - | - | 1,860,000.00 |
| එකතුව | **34** | **5,950,000** | **6,425,125** | **7,773,900** | **6,661,882** | **5,621,006.05** | **8,803,427.05** |

**ආ). කලාපීය / ජාතික සංවර්ධනයට සම්බන්ධ නව්‍යකරණ පර්යේෂණ ප්‍රදාන ක්‍රමයක් හඳුන්වා දීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන තුළ සුවිශේෂී පර්යේෂණ සංස්කෘතියක් වර්ධනය කිරීමට කැපවී සිටී. මෙම කර්තව්‍ය සඳහා අනෙකුත් කාර්යයන්ට අමතරව කලාපීය / ජාතික සංවර්ධනයට අදාළ උසස් නව්‍යකරණ පර්යේෂණ ක්‍රමයක් වර්ධනය කිරීමේ අරමුණින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව නව ප්‍රදාන ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත. පර්යේෂණ කාර්යයේදී මඟ පෙන්වීම් සාධක සටහන් කිරීම සඳහාත් උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහාත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත පර්යේෂණ උපදේශක කමිටුවක් ස්ථාපනය කර තිබේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ m%ධාන විෂයධාරාවන් වලට සම්බන්ධ සාමාජිකයින් මෙම කමිටුව නියෝජනය කරයි. එහි පළමු රැස්වීම 2013 අගෝස්තු 06 දින පැවැත්විණි.

2013 වර්ෂය සඳහා මෙම ප්‍රදාන ක්‍රමය යටතේ පර්යේෂණ යෝජනා 12ක් ඇගයීමට ලක් කළ අතර රු.මිලියන 53.0 (ආසන්න වශයෙන්) වටිනා යෝජනා 4 ක් පහත ආකාරයට ප්‍රදානය කරන ලදී. ( 2013 වර්ෂයේදී පළමු වාරිකය පමණක් වැය කෙරිණි.)

| **විෂය ධාරාව** | **ප්‍රදාන සංඛ්‍යාව** | **අගය (රු)** |
|---|---|---|
| වෛද්‍ය විද්‍යා | 2 | 39,771,588.50 |
| විද්‍යා | 2 | 13,140,000.00 |
| **එකතුව** | **4** | **52,911,588.50** |

**ඇ). පශ්චාත් උපාධි පර්යේෂණ ප්‍රදාන ක්‍රමය.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එය යටතේ ඇති විශ්වවිද්‍යාල පද්ධතියෙහි ස්ථිර ආචාර්යවරුන්ට දැනට පවතින ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබා දෙන අතරතුර ශාස්ත්‍රපති සහ දර්ශනශූරී උපාධි පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය සහය ලබාදීම සඳහා නව ක්‍රමයක් 2013 වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබේ. ඕනෑම විෂය ධාරාවකට අයත් ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු පරිවාස කාලයේ සිටින ආචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් ශ්‍රී ලංකාවේ හෝ දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමය (SAARC) / අග්නිදිග ආසියාතික ජාතීන්ගේ සංගමයට අයත් කලාපයේ රටවල උසස් අධ්‍යාපනය ලැබීම සඳහා මූල්‍ය සහය ලබා ගැනීමට සුදුසුකම් ලබති.

විශේෂයෙන්ම, උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩලයට කලාපීය අවශ්‍යතා සහ ගැටළු වලට අදාළව පශ්චාත් උපාධි පර්යේෂණ සිදුකිරීම මඟින් ජාතික ප්‍රතිපත්තියට අනුකූල කලාපීය සංවර්ධනය වැඩිදියුණු කිරීමටත් මෙම ප්‍රදාන ක්‍රමය මඟින් සහයෝගය ලබාදෙයි. එමෙන්ම දේශීය හෝ විදේශීය පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින, නමුත් ප්‍රමාණවත් අරමුදල් නොමැති හෙයින් පාඨමාලාව සම්පූර්ණ කිරීමේ දුෂ්කරතා වලට මුහුණ පා සිටින අයදුම්කරුවන්ට අර්ධ වශයෙන් සහයෝගය ලබාදෙයි.

විෂය ධාරාව, අධ්‍යයනයේ ස්වභාවය, හදාරනු ලබන උපාධිය සහ එය පවත්වනු ලබන රට අනුව ප්‍රදානයේ මුළු අගය වෙනස්වේ. නමුත් දර්ශනශූරී (හෝ ශාස්ත්‍රපති) උපාධිය සඳහා රු. 2,500,000/- නොඉක්මවන අතර ආචාර්ය උපාධිය සඳහා රු. 3,500,000/- නොඉක්මවයි. ව්‍යාපෘති යෝජනාවේ ගුණාත්මක භාවය, යෝජිත අධ්‍යයනයේ විද්‍යාත්මක වටිනාකම සහ එහි අදාළත්වය අනුව තරඟකාරී පදනමක් මත ප්‍රදාන ලබා දෙනු ලැබේ. රුපියල් මිලියන 65 ක් වටිනා යෝජනා 58ක් මෙම ක්‍රමය යටතේ ලැබුණු අතර ඉන් යෝජනා 42ක් කොමිෂන් සභාව විසින් අනුමත කොට ඒ සඳහා රු. මිලියන 35 ක මුදලක් 2013 වර්ෂයේදී ප්‍රදානය කරන ලදී.

**ඇ) පොදු රාජ්‍ය මණ්ඩල අධ්‍යයන ශිෂ්‍යත්ව සහ අධි ශිෂ්‍යත්ව ප්‍රදානය.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වලින් පොදු රාජ්‍ය මණ්ඩල අධ්‍යයන අධි ශිෂ්‍යත්ව සඳහා ආචාර්යවරුන් 16 දෙනෙක් නම් කරන ලද අතර ඉන් 12 ක් පොදුරාජ්‍ය මණ්ඩල සංගමය විසින් තෝරා ගන්නා ලදී. පසුගිය දෙවර්ෂය තුළ විශ්වවිද්‍යාල නියෝජනය කරන ලද සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ;

| විශ්වවිද්‍යාල | **2012** | **2013** |
|---|---|---|
| කොළඹ | 3 | 3 |
| පේරාදෙණිය | 4 | - |
| කැළණිය | - | 1 |
| ශ්‍රී ජපුර | 1 | 2 |
| මොරටුව | - | - |
| යාපනය | 1 | - |
| රුහුණු | 2 | 3 |
| විවෘත | 1 | - |
| සබරගමුව | 2 | - |
| වයඹ | - | 2 |
| රුහුණ | - | 1 |
| **එකතුව** | **14** | **12** |
| **පොදු රාජ්‍ය මණ්ඩල** | **01** | **01** |

වර්ෂ 2013 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2014/2015 පොදුරාජ්‍ය මණ්ඩල අධ්‍යයන ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව සඳහා ආචාර්යවරුන් 20 දෙනෙක් නම් කරන ලදී.

**ඇ) විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගමන් ගාස්තු සඳහා මූල්‍ය සහය**

ගත වූ වර්ෂ කිහිපය තුළ විදේශගතව පශ්චාත් උපාධි සුදුසුකම් ලැබීමට නියමිත වූ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගුවන් ගමන් ගාස්තු වශයෙන් ලබා දෙන ලද මුදල් පහත සඳහන් පරිදි වේ;

| | | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| විවි.ප්‍ර.කො.ස විසින් අනුමත කරනලද / මූල්‍ය සහය ප්‍රදානය කරන ලද ඉල්ලීම් | අභ්‍යන්තර | 30 | 22 | 33 | 34 |
| | බාහිර | 62 | 77 | 65 | 55 |
| මුදල රු. | | 4,804,417.28 | 8,248,180.38 | 7,046,661.32 | 6,754,729.63 |

සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගුවන් ගමන් ගාස්තු වශයෙන් ලබා දෙන ලද මූල්‍ය සහාය පහත සඳහන් පරිදි වේ:

| විශ්වවිද්‍යාලය | 2013 වර්ෂයේදී විවි.ප්‍ර.කො.ස විසින් අනුමත කරන ලද ඉල්ලීම් ගණන | | 2013 වර්ෂයේදී විවි.ප්‍ර.කො.ස විසින් විශ්වවිද්‍යාල වෙත ආපසු ගෙවන ලද සත්‍ය මුදල රුපියල් |
|---|---|---|---|
| | අභ්‍යන්තර | බාහිර | |
| කොළඹ විශ්වවිද්‍යාලය | 3 | 3 | 451,085.25 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 5 | 9 | 1,079,749.38 |
| යාපනය විශ්වවිද්‍යාලය | 1 | 5 | 317,584.00 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 5 | 5 | 673,910.00 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 4 | 4 | - |
| මොරටුව විශ්වවිද්‍යාලය | 2 | 8 | 1,307,351.00 |
| ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 4 | 8 | 494,550.00 |
| කැළණිය විශ්වවිද්‍යාලය | 7 | 3 | 811,410.00 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 1 | 2 | 75,450.00 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 2 | 2 | 177,520.00 |
| රජරට විශ්වවිද්‍යාලය | - | 5 | 1,226,020.00 |
| වයඹ විශ්වවිද්‍යාලය | - | 1 | - |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | - | - | 140,100.00 |
| **එකතුව** | **34** | **55** | **6,754,729.63** |

## 9. යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

නව ඉදිකිරීම් සහ ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත්පත් කර ගැනීම්, අලුතින් ස්ථාපනය කරන ලද විශ්වවිද්‍යාලවල යටිතල පසහසුකම් ව්‍යාපෘති සහ සිසුන්ගේ ශක්‍යතා වැඩිදියුණු කිරීම සඳහා රු.මිලි 8,459 ක මුළු මුදලක් 2013 වර්ෂයේදී වෙන් කරන ලදී. මහා භාණ්ඩාගාරය රු.මිලි 7,292 ක් නිර්දේශ කරන ලද නමුත් වර්ෂය ඇතුළත අරමුදල් නිදහස් කිරීමේදී මහා භාණ්ඩාගාරය විසින් පනවන ලද විවිධ සීමාවන් හේතුවෙන් 2013 වර්ෂය අවසානයේදී විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වෙත ලබා ගත හැකි වූයේ රු.මිලි 5,590 පමණි.

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වලින් සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත නව ව්‍යාපෘති යෝජනා 59ක් ලැබුණු අතර ඒවා දැඩි පරීක්ෂාවට සහ ඇගයීමට ලක්කිරීමෙන් අනතුරුව වර්ෂ අවසානය වනවිට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද්දේ යෝජනා 39* පමණි. ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුව නව ව්‍යාපෘති අතුරින්

35* සඳහා 2013 වර්ෂයේදී අනුමැතිය ලබා දුන් අතර පසුගිය වර්ෂයේදී ලද ව්‍යාපෘති යෝජනා ද ඇතුළුව වර්ෂයේදී මුළු ව්‍යාපෘති 9* ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. 2013 වර්ෂයේදී ව්‍යාපෘති 26*# භෞතික වශයෙන් ආරම්භ කරන ලද අතර විශ්වවිද්‍යාල පද්ධතියෙහි වර්ෂය අවසාන වනවිට ඇස්තමේන්තුගත අගය රු. මිලි 10,201.92 වන ඉදිකිරීම් ව්‍යාපෘති 48*# ක් සැලසුම් සහ ඉදිකිරීම් ක්‍රියාවලියෙහි පැවතිණි. ඇස්තමේන්තු ගත අගය රු.මිලි 1,551.50 වන ව්‍යාපෘති 13*# ක් සම්පූර්ණ කර සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාල පද්ධතිය වෙත භාරදෙන ලදී. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ;

| | 2010 | | 2011 | | 2012 | | 2013.12.31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු අගය (රු:මිලියන) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු අගය (රු:මිලියන) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු අගය (රු:මිලියන) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු අගය (රු:මිලියන) |
| **වි.වි.ප්‍ර.කො.ස විසින් ලබාගන්නා ලද ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව** | **39** | **12,671.06** | **31** | **5,535.40** | **20** | **3,755.83** | **59** | **12,466.54** |
| **වි.වි.ප්‍ර.කො.ස විසින් අනුමත ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව** | ***11** | **3,744.61** | ***24** | **8,069.00** | ***22** | **2,512.35** | ***39** | **8,577.34** |
| **ජාතික සැලසුම් දෙ: වෙත ලබා දෙන ව්‍යාපෘති සංඛ්‍යාව** | ***12** | **5,913.36** | ***24** | **7,762.02** | ***23** | **3,306.93** | ***39** | **8,577.34** |
| **ජාතික සැලසුම් දෙ: වෙත මගින් අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව** | ***10** | **1,499.64** | ***15** | **4,351.8** | ***07** | **3259.13** | ***35** | **6,361.21** |
| **කැබිනට් මණ්ඩලය මගින් අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව** | ***12** | **1,583.8** | ***12** | **1,317.47** | ***11** | **4,854.87** | ***49** | **10,885.66** |
| **වසර තුළදී ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව** | ***14** | **2,799.4** | **#*17** | **2,496.9** | **#*11** | **1,514.70** | **#*26** | **3,546.22** |
| **කෙරෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව (අඛණ්ඩ)** | ***60** | **13,637.95** | **#*41** | **14,662.55** | **#*44** | **13,672.40** | **#*48** | **10,201.92** |
| **අවසන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව** | ***22** | **2,780.6** | **#*12** | **2,223.45** | **#*13** | **2,778.30** | **#*13** | **1,551.5** |

* පසුගිය වර්ෂ වලදී භාරදෙන ලද ව්‍යාපෘති යෝජනාද ඇතුළුව
\# ව්‍යාපෘතියේ භෞතික තත්ත්වය පමණක් සළකා බලා









**9.1 2013 වර්ෂයේදී විශ්වවිද්‍යාල පද්ධතියෙහි නේවාසිකාගාර 30 ක් ඉදි කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. (නේවාසිකාගාර ඉදිකිරීමේ කඩිනම් ව්‍යාපෘතිය)**

| | ව්‍යාපෘති සංඛ්‍යාව | 2013 වර්ෂයේදී ප්‍රදානය කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු අගය (රුපියල් මිලියන) |
|---|---|---|---|
| නේවාසිකාගාර - I වන අදියර | **30** | **30** | **13,860.00** |
| නේවාසිකාගාර - I I වන අදියර | **26** | - | |

**9.2 2011/2012 සහ 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා අතිරේක සිසුන් ඇතුළත් කර ගැනිමට රු.මිලි 20 ට අඩු ව්‍යාපෘති**

රු.මිලි 20 ට අඩු විශේෂ ව්‍යාපෘති යටතේ විශ්වවිද්‍යාල වලට ඇතුළත් කරගත් අතිරේක සිසුන් සඳහා පහසුකම් සැපයීමට ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුව රු. මිලි 670.5 ක් වටිනා ව්‍යාපෘති 60 ක් අනුමත කරන ලදී.

## 10. තොරතුරු තාක්ෂණ සංවර්ධනය

විශ්වවිද්‍යාලයන්හි තොරතුරු තාක්‍ෂණ පාලන ක්‍රියාවලි ක්‍රියාත්මක කිරිම සංයුක්ත පාලනයේ එක් අංගයක් වන තොරතුරු තාක්‍ෂණ පාලනය, ආයතනික උපක්‍රම සහ ආයතනයේ තොරතුරු තාක්‍ෂණ සහයෝගය දැක්වීම සඳහා අවශ්‍ය සංකල්පයක් ලෙස මෙය බිහි විය. විශ්වවිද්‍යාලයන්හි තොරතුරු තාක්‍ෂණ පාලනයේ තත්වය පිළිබඳව අධ්‍යයන කිරීමට සමීක්‍ෂණයක් පවත්වන ලදී. තොරතුරු තාක්‍ෂණ පාලනය පිළිබඳ දැනුවත් භාවය ඇති කිරීම සහ සියලුම විශ්වවිද්‍යාල සඳහා තොරතුරු තාක්‍ෂණ රාමුවක් හඳුන්වා දීමේ හැකියාව සොයා බැලීම සඳහා විශ්වවිද්‍යාලවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ඉදිරිපත් කිරීම් / සාකච්ඡා මාලාවක් පවත්වා තිබේ.

**2012/2013 වර්ෂයේදී තොරතුරු තාක්‍ෂණ අරමුදල් භාවිතා කිරීම**

පහත දැක්වෙන උසස් අධ්‍යාපන ආයතනයන්හි තොරතුරු තාක්‍ෂණ යටිතල පහසුකම් සහ කාර්මික හැකියාව වැඩි දියුණු කිරිම සඳහා 2013 වර්ෂයේදී රු. මිලි 11.397 ක් වැය කරන ලදී.

| උසස් අධ්‍යාපන ආයතන | ව්‍යාපෘතිය | 2013 වර්ෂයේදී වැය කරන ලද මුදල (රු:) |
|---|---|---|
| කෘෂි තාක්ෂණික | තොරතුරු තාක්ෂණ මූලික යටිතල පහසුකම් සංවර්ධනය | 5,500,000/- |
| ගම්පහ වික්‍රමාරච්චි | පවත්නා ජාල පහසුකම් සංවර්ධනය | 4,000,000/- |
| ත්‍රිකුණාමලය මණ්ඩපය | පරිගණක පහසුකම් ඉහළ ශ්‍රේණි ගතකිරීම | 1,897,000/- |
| | එකතුව | **11,397,000/-** |

## 11. උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතිකය

තත්ත්ව සහතික ප්‍රතීතන කවුන්සිලය විෂය කමිටු 40 ක සහාය ඇතිව 2005 වර්ෂයේ සිට විෂය / පාඨමාලා සමාලෝචන 318 ක් ක්‍රියාත්මක කළ අතර විෂය මහපෙන්වීම් ලකුණු ප්‍රකාශන 43ක් තහවුරු කරන ලදී. 2013 අවසාන වනවිට මහපෙන්වීම් ප්‍රකාශන 4 ක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි. ජාතික සහ ජාත්‍යන්තර මහපෙන්වීම් ලකුණු ප්‍රකාශන 4 වලට අනුකූලව වැඩි ඉල්ලුමක් සහිත අධ්‍යයන පාඨමාලා සංශෝධනය කිරීමට විෂයමාලා සංශෝධන සිදු කරන ලදී. එමෙන්ම භාවිත සංග්‍රහ 13 ක් නිර්මාණය කරන ලදී. 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද ආයතනික සමාලෝචන සඳහා වන දෙවන සමාලෝචන චක්‍රය මඟින් ආයතනික සමාලෝචන සිදුකල යුතු විශ්වවිද්‍යාල 4 ක් හඳුනාගෙන තිබේ. මෙම කාලය තුළදී ජාතික සහ විශ්වවිද්‍යාල / පීඨ මට්ටමින් උසස් අධ්‍යාපන ආයතනයන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු 29 ක්ද පවත්වන ලදී.

**2013 *ජනවාරි මාසයේ සිට පැවැත්වුණු වැඩමුළු***

| වැඩ සටහන් | ජාතික | ජාත්‍යන්තර | වි.වි/පීඨ/අධ්‍යනාංශ/ ආයතන |
|---|---|---|---|
| **1.** විශ්වවිද්‍යාලය යන්හි අභ්‍යන්තර තත්ත්ව සහතික | - | - | 07 |
| **2.** විශ්වවිද්‍යාලයන්හි විෂය සමාලෝචන ක්‍රියාවලිය | - | - | 02 |
| **3.** ශිෂ්‍ය ප්‍රතිචාර සහ සගයුරු නිරීක්ෂණය | - | 01 | - |
| **4.** විශ්වවිද්‍යාල තත්ත්ව සහතිකයේ නව වර්ධන | - | - | 11 |
| **5.** වෙනත් තත්ත්ව සහතික වැඩමුළු | 02 | 01 | 05 |
| එකතුව | **02** | **02** | **25** |
| | **29** | | |

*විශ්වවිද්‍යාලවල පාඨමාලා ප්‍රතීතන ක්‍රියාවලියේ තත්ත්වය*

| විෂය ධාරාව | ප්‍රතීතන අත්පොත සකස් කිරීම. |
|---|---|
| 1. කෘෂි විද්‍යාවට අදාළ | සම්පූර්ණයි. |
| 2. කලා විෂයන්ට අදාළ | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 3. කළමනාකරණය | පිරික්සුම් ලැයිස්තුව සම්පූර්ණ කළ යුතුව ඇත. |
| 4. විද්‍යාව සහ මත්ස්‍ය විද්‍යා | පිරික්සුම් ලැයිස්තුව සම්පූර්ණ කළ යුතුව ඇත. |
| 5. ඉංජිනේරු, වාස්තු විද්‍යා, භූ විද්‍යාව සහ තොරතුරු තාක්ෂණය | පිරික්සුම් ලැයිස්තුව සම්පූර්ණ කළ යුතුව ඇත. |
| 6. වෛද්‍ය, දන්ත ශල්‍ය සහ සම සෞඛ්‍ය, | පිරික්සුම් ලැයිස්තුව සම්පූර්ණ කළ යුතුව ඇත. |

- තත්ත්ව සහතික නව නිර්මාණ කාණ්ඩය යටතේ "බාහිර තත්ත්ව ඇගයීම සඳහා වෙබ් අඩවි පදනම් කර ගත් නිරීක්ෂණ හා ඇගයුම් ක්‍රමය" සඳහා තරඟකරුවන් 46 ක් අතුරින් ජාත්‍යන්තර සම්මානය හිමිකර ගැනීමට තත්ත්ව සහතික ප්‍රතීතන කවුන්සිලය සමත් වූ අතර 2013 තායිවානයේ තයිපෙයි හීදී පැවැත්වුණු ආසියානු පැසිෆික් තත්ත්ව ජාල වාර්ෂික සමුළුවේදී ප්‍රථම තත්ත්ව සහතික ප්‍රතීතන ආයතනය ලෙස ද එය පිළිගන්නා ලදී.

## 12. ශිෂ්‍ය ප්‍රජාව සම්බන්ධ කටයුතු

**විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය**

රාජ්‍ය විශ්වවිද්‍යාල වල ලියාපදිංචි වූ ශිෂ්‍යයින් සඳහා මාර්ගෝපදේශකයක් වශයෙනුත් විශ්වවිද්‍යාලය සහ ශිෂ්‍යයින් අතර පවතින ගිවිසුමෙහි කොන්දේසි දක්වන ලේඛනයක් වශයෙනුත් "**විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය**" විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2013 මැයි මාසයේදී නිකුත් කරන ලදී. එමඟින් විශ්වවිද්‍යාලයන්හි යහපත් ක්‍රියාකාරීත්වය සඳහා සියලු පාර්ශවයන්ගෙන් අපේක්ෂා කරනු ලබන කැපවීම අවධාරණය කරන හෙයින් මෙම ප්‍රඥාප්තිය අධ්‍යයන, පරිපාලන සහ සහාය කාර්ය මණ්ඩලයට මෙන්ම මහජනතාවට මාර්ගෝපදේශකයක් වේ. එමෙන්ම මෙම විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය රාජ්‍ය විශ්වවිද්‍යාල වලට එහි ප්‍රධාන කාර්යය ඉටුකිරීම සහ ආයතනයේ මූලික හරයන් සහ මූලධර්ම ආරක්ෂා කර ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන සහයෝගය දැක්වීමට සහ දායකත්වය සැපයීමට ශිෂ්‍යයින් උනන්දු කරවයි.

## 13. විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍ය ආධාර ලබාදීම

### 13.1 හැඳින්වීම

විශ්වවිද්‍යාල සිසුන් මූල්‍යමය ආධාර ලබාදෙන ක්‍රම 3ක් ඇත. ඒවා නම්;

- මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය
- විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර ක්‍රමය
- පරිත්‍යාග ශිෂ්‍යත්ව ක්‍රමය

මෙම ක්‍රම තුනෙන් මහපොළ ශිෂ්‍යත්ව සහ පරිත්‍යාග ශිෂ්‍යත්ව සඳහා සිසුන් තෝරා ගැනීම වාර්ෂිකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ද විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර ක්‍රමය අදාළ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන විසින් ද සිදු කෙරේ.

**(1) මහපොළ ශිෂ්‍යත්ව**

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල මඟින් මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ කාණ්ඩ දෙකක ශිෂ්‍යත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගය සහිතව ප්‍රදානය කරනු ලැබේ. මහපොළ උසස් අධ්‍යාපන කුසලතා ශිෂ්‍යත්ව සහ මහපොළ උසස් අධ්‍යාපන සාමාන්‍ය ශිෂ්‍යත්ව වේ.

**(2) ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදාන**

ඇස්තමේන්තුගත මහපොළ / ශිෂ්‍යාධාර ලාභීන් සංඛ්‍යාව සහ දැනට පවතින ශිෂ්‍යත්ව වාරිකය පදනම් කරගෙන මහා භාණ්ඩාගාරය විසින් පිරිවැය දරන මහපොළ සහ ශිෂ්‍යාධාර සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මූල්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

| සිසුන් සඳහා වන මූල්‍ය අධාර වර්ගය | මහපොළ ශිෂ්‍යත්වය | | | ශිෂ්‍යාධාර | | | පරිත්‍යාග ශිෂ්‍යත්ව වෙනත් මූල්‍ය පරිත්‍යාග | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **2011** | **2012** | **2013** | **2011** | **2012** | **2013** | **2011** | **2012** | **2013** |
| සිසුන් සංඛ්‍යාව | 32,272 | 33,089 | 39,471 | 17,996 | 23,446 | 28,983 | 66 | 69 | 55 |
| මුළු ගෙවීම් (රු:මිලි) | 126.8 | 101.46 | 94.95 | 357.1 | 283.4 | 385.9 | 0.96 | 2.5 | 2.2 |

**3) පරිත්‍යාග ශිෂ්‍යත්ව**

ඉහත සඳහන් ශිෂ්‍යත්ව වලට අමතරව පහත සඳහන් ශිෂ්‍යත්ව ප්‍රදාන ක්‍රමද සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කෙරිණි.

**අ) මිට්ෂුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මිට්ෂුබිෂි සමාගම අතර විශ්වවිද්‍යාල සිසුන් සඳහා අරමුදල් සපයනු ලබන ශිෂ්‍යත්ව ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කෙරිණි.

මෙහිදී කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා තෝරාගත් ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍යත්ව 30 ක් පිරිනමන ලදී. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 48,000/- කි. (මාසිකව රු.4000/- බැගින් වාරික 12ක් සඳහා) මෙම ශිෂ්‍යත්වය වසරක කාලයක් සඳහා වන අතර තවත් වසරකින් දීර්ඝ කිරීමේ හැකියාව ඇත.

**ආ) පොලිස් ම.සු.ස යහසාධක යෝජනා ක්‍රමය**

2011/2012 අධ්‍යයන වර්ෂ සඳහා ඉංජිනේරු විද්‍යා, වෛද්‍ය විද්‍යා, කෘෂි විද්‍යා යන විෂයන් සඳහා මොරටුව, පේරාදෙණිය සහ වයඹ විශ්වවිද්‍යාලවලට ප්‍රවේශලත් සිසුන් සඳහා පොලිස් ම.සු.ස යහසාධක යෝජනා ක්‍රමය යටතේ අරමුදල් ලබා දෙන ශිෂ්‍යත්ව ක්‍රමය මඟින් ශිෂ්‍යත්ව 3ක් පිරිනමන ලදී.

මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 20,000/- ක් වන අතර රු. 2,000/- බැගින් වූ මාසික වාරික 10 කින් සම්පූර්ණ පාඨමාලා කාලය ආවරණය වන පරිදි ගෙවනු ලැබේ.

**(4) සුනාමි ව්‍යසනයට ලක්වූ සිසුන් සඳහා වන ශිෂ්‍යත්ව වැඩසටහන**

සුනාමි ව්‍යසනයට ලක්වූ විශ්වවිද්‍යාල සිසුන් සඳහා දේශීය / විදේශීය හිතවතුන්ගෙන් ලද පරිත්‍යාග මඟින් 2005 වර්ෂයේදී පිහිටුවන ලද ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා 2013 වර්ෂයේදී රු. 305,846/89 ක් ගෙවන ලදී.

## 13.2 ශිෂ්‍යත්ව සම්බන්ධීකරණ ප්‍රදාන

- **විශ්ව විද්‍යාල ප්‍රවේශ ලබන සිසුන් සඳහා කොමර්ෂල් බැංකු ශිෂ්‍යත්ව ක්‍රමය .**

ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල ආවරණය කරමින් වෛද්‍ය විද්‍යා සහ කළමනාකරණ පීඨවල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා කොමර්ෂල් බැංකු ශිෂ්‍යත්ව ක්‍රමය මඟින් ශිෂ්‍යත්ව පිරිනැමේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 25,000/- ක් වන අතර වාරික 10 කින් ගෙවනු ලැබේ.

ඒ අනුව 2010 වර්ෂයේ අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිටි 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශ ලත් සිසුන් 25ක් අදාළ වර්ෂය තුළදී මෙම ශිෂ්‍යත්වය පිරිනැමීම සඳහා තෝරා ගන්නා ලදී.

| | |
|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | - 2 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | - 7 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | - 4 |
| කැළණිය විශ්වවිද්‍යාලය | - 9 |
| ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | - 3 |

# 14. අතිගරු ජනාධිපතිතුමාගේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සංචාරය

අධ්‍යාපන ආයතන ඉහළ කළමනාකාරීත්වය, උප කුලපතිවරුන්, අධ්‍යක්ෂකවරුන් සහ විශ්වවිද්‍යාල ප්‍රOdනීන්ගේ සහභාගීත්වයෙන් 2013 මාර්තු 1 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශ්‍රවණාගාරයේදී පැවති උසස් අධ්‍යාපනයේ මධ්‍ය වාර්ෂික සැලැස්ම පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා අතිගරු ජනාධිපතිතුමා සහභාගී වන ලදී.



## 15. ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සහ ප්‍රගති ක්‍රියාකාරකම් අධීක්‍ෂණය කිරීම සඳහා අධ්‍යයන, පරිපාලන සහ අනෙකුත් මට්ටමේ කාර්ය මණ්ඩලය ද ඇතුළුව විශ්වවිද්‍යාල ප්‍රජාව මුණගැසීමේ රැස්වීම් මාලාවක් ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් පවත්වන ලදී. ඒවා මෙසේය;

රැස්වීම් පවත්වන ලද්දේ;

1. 2013.01.18 සහ 2013.01.19 දෙදින ජානකී හෝටලයේදී ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි අදාළ නිලධාරීන් සමඟ ක්‍රමෝපාය සැලසුම් සමාලෝචන වැඩමුළුව පැවැත්විණි.

2. 2013.01.30 වන දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේදී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ කැළණිය විශ්වවිද්‍යාලය සමඟ විදුලි සංදේශ ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සාකච්ඡාවක් අදාල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

3. 2013.01.31 දින කිරු<පන ග්‍රීන් ගාඩ්න් හෝටලයේදී උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ 2012 වර්ෂයේ ප්‍රගතිය සහ 2013 ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ සාකච්ඡා කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ මාධ්‍යවේදීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පැවැත්විණි.

4. 2013.04.02 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රමෝපාය සැලැස්මට ගැලපෙන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රමෝපාය සැලැස්ම සකස් කිරීම පිළිබඳ සාකච්ඡාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදාල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

5. 2013.05.18 දින අහුන්ගල්ල හෙරිටන්ස් හෝටලයේදී තාක්‍ෂණික විෂය ධාරාව ඔස්සේ අ.පො.ස Wසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශ සම්බන්ධ සැපයුම් සේවා සහ වෙනත් ගැටළු පිළිබඳව උසස් අධ්‍යාපන අමාත්‍යවරයා, විශ්වවිද්‍යාල පද්ධතියේ අදාල නිලධාරීන් සහ අමාත්‍යාංශ 2ක් සමඟ සාකච්ඡාවක් පැවැත්විණි.

6. 2013.05.18 හා 2013.05.19 යන දෙදින අහුන්ගල්ල හෙරිටන්ස් හිදී ක්‍රමෝපාය සැලසුම් සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම ක්‍රමෝපාය සැලසුම් සමාලෝචන වැඩමුළුවක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇති ආයතනවල අදාල නිලධාරීන් සමඟ පැවැත්විණි.

7. 2013.06.11 වන දින අතිගරු ජනාධිපති තුමා සමග පැවති රැස්වීමේදී මතු වූ කරුණක් වන සෑම විශ්වවිද්‍යාලයක් ආසන්නයෙහි ම පාසලක් සංවර්ධනය කිරීම පිළිබඳ සාකච්ඡාවක් පැවැත්විණි.

8. 2013.06.11 සහ 2013.07.02 දෙදින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේදී වෛද්‍ය පුහුණුව සඳහා ලියාපදිංචි වීමේ විභාගය පිළිබඳව ශ්‍රී ලංකා වෛද්‍ය කවුන්සිලයේ කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදාල නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පැවැත්විණි.

9. 2013.07.03 වන දින තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලයේ සාමාජිකයින් සමග තත්ත්ව සහතික සහ ප්‍රතීතන පිළිබඳ සාකච්ඡා කරන ලදී.

10. 2013.07.25 දින කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී ශ්‍රී ලංකාවේ කළමනdකරK අධ්‍යාපනය උසස් කිරීම පිළිබඳව ජාතික උපදේශක කවුන්සිලයේ අදාල නිලධාරීන් සමග සාකච්ඡාවක් පැවැත්විණි.

11. 2013.09.23 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීම් කාමරයේදී 2014 වර්ෂය සඳහ අය-වැය සකස්කිරීම පිළිබඳ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා, භාණ්ඩාගාර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති, උප කුලපතිවරුන් සහ වෙනත් අදාල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

12. 2013.10.14 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේදී “2012/2013 අධ්‍යයන වර්ෂ සඳහා නායකත්ව පුහුණු වැඩසටහන” පිළිබඳව අදාල නිලධාරීන් සමග සාකච්ඡාවක් පැවැත්විණි.

13. 2013.10.05 වන දින රේණුකා හෝටලයේදී ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ විදේශ උපදේශකයින් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිලධාරීන් සමග සාකච්ඡාව පැවැත්විණි.

14. 2013.11.04 වන දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේදී 2014 අය-වැය අනුව ඇස්තමේන්තු ගත් ප්‍රදාන වෙන් කිරීම් පිළිබඳව අදාල නිලධාරීන් සමග සාකච්ඡාව පැවැත්විණි.

15. 2013.11.05 දින තලවතුගොඩ ග්‍රෑන්ඩ් මොනාක් හෝටලයේදී රේඛීය අමාත්‍යාංශයන්හි ව්‍යාපෘති කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා කාර්යඵල අයවැය, ක්‍රියාත්මක කිරීම සහ සංශෝධනය කිරීමට අදාළව මධ්‍ය වාර්ෂික අයවැය සැලසුම සහ අයවැය අනුග්‍රහය පිළිබඳ සාකච්ඡාවක් පැවැත්විණි.

16. 2013.11.06 වන දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේදී කැළණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය පිළිබඳ සාකච්ඡා කිරීම පැවැත්විණි.

## 16 ජාතික ආයතන සහ සංවිධාන සඳහා සපයන ලද සහයෝගය.

- මාර්තු මාසයේදී සීමා වාසික පත්වීම් ලබා දීම සඳහා 2005/2006 අධ්‍යයන වර්ෂ සඳහා වෛද්‍ය උපාධි පාඨමාලාව ඇතුළත් කරගත් සිසුන්ගේ අවසන් වෛද්‍ය විද්‍යා විභාගය පදනම් කර පළාත් කුසලතා ලේඛනය රජරට විශ්වවිද්‍යාලය හැර සකස් කර සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට භාරදීම.
- ජූනි මාසයේදී සීමා වාසික පත්වීම් ලබාදීම සඳහා 2005/2006 අධ්‍යයන වර්ෂ සඳහා වෛද්‍ය උපාධි පාඨමාලාවන්ට ඇතුළත් කර ගන්නා ලද සිසුන්ගේ අවසාන (පුනර්) වෛද්‍ය විද්‍යා විභාගය පදනම් කර අවසන් කුසලතා ලේඛනය රජරට විශ්වවිද්‍යාලය ද ඇතුළත්ව සකස් කර සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට භාරදෙන ලදී.
- ඔක්තෝබර් මාසයේදී සීමාවාසික පත්වීම් ලබා දීම සඳහා 2006/2007 අධ්‍යයන වර්ෂ සඳහා වෛද්‍ය උපාධි පාඨමාලාවන්ට ඇතුළත් කරගන්නා ලද

- ආයුර්වේද පත්වීම් සඳහා 2002/2003 ප්‍රධාන සහ පුනර් ආයුර්වේද කුසලතා ලේඛන සකස් කොට ඔක්තෝම්බර් මාසයේදී ආයුර්වේද දෙපාර්තමේන්තුවට භාරදීම.
- තොරතුරු කළමනාකරණ පද්ධති අංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව සහ වෙනත් රජයේ ආයතන සඳහා ඒවායේ ප්‍රකාශයන්හි උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ තොරතුරු ඇතුළත් කිරීම සඳහා සහයෝගය ලබා දෙන ලදී.
- තොරතුරු කළමනාකරණ පද්ධති අංශය අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික අංශය ආවරණය කරමින් දිවයිනෙහි උසස් අධ්‍යාපනය සම්බන්ධ සංඛ්‍යා ලේඛන සකස් කිරීම සඳහා යුනෙස්කෝ සංඛ්‍යා ලේඛන අංශයට සහයෝගය දක්වන ලදී.

## 17 නෛතික කටයුතු

### 17.1 නව ව්‍යවස්ථා

සමාලෝචිත වර්ෂයේදි කොමිෂන් සභාවේ නීති අංශය නියමයන් 2ක් සහ ආඥාපනත් 1ක් ප්‍රකාශයට පත් කරන ලදි.

**(1) වර්ෂය තුළ කරන ලද නියමයන්**

- 2013 ජූලි මස 18 දිනැති අංක 1819/27 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය යටතේ කෙටුම්පත් කර ඇති යාපනය විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා වාණිජ්‍යය පීඨයේ නව වාණිජ්‍යය අධ්‍යයනාංශයක් ස්ථාපිත කිරීමේ නියමය.

- 2013 ජූලි 19 වන දිනැති අංක 1819/46 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය යටතේ කෙටුම්පත් කර ඇති මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨයට නව සමෝධානික නිර්මාණ අධ්‍යයන අංශයක් ස්ථාපිත කිරීමේ නියමය.

2012 පෙබරවාරි 22 දිනැති අංක 1746/11 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විශේෂ බලධාරියා බවට පත් කිරීමත් සමඟ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදාන තත්වය ලබා දීම සඳහා තවත් නියමයන් හතරක් ප්‍රකාශයට පත් කරන ලදී.

- 2013 පෙබරවාරි මස 22 වන දිනැති අංක 1798/62 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 (අ) වගන්තිය යටතේ බෞද්ධ නායකත්ව ශාස්ත්‍රවේදී කලා (විශේෂ) උපාධිය ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයට උපාධි ප්‍රදාන තත්වය ලබා දීමේ නියමය.

- 2013 මාර්තු 5 වන දිනැති අංක 1800/6 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය යටතේ උපාධි 5 ක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා 6ක් පිරිනැමීමට ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයට අයත් ජාතික ව්‍යාපාර කලමනාකාරීත්ව පාසලට උපාධි ප්‍රදාන තත්ත්වය ලබා දීමේ නියමය. (මෙම නියමය මඟින් 2009 ඔක්තෝබර් 20 දිනැති අංක 1624/11 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් නියම කළ නියමය මඟින් නිශ්ප්‍රභා වේ.)

- 2013 මාර්තු 12 දිනැති 1801/5 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 (අ) වගන්තිය යටතේ උපාධි 2 ක් පිරිනැමීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට උපාධි ප්‍රදාන තත්වය ලබා දීමේ නියමය.

- 2013 ජූලි 09 දිනැති අංක 1818/7 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය යටතේ උපාධි 3 ක් පිරිනැමීමට කොළඹ ජාත්‍යන්තර නාවික සහ ඉංජිනේරු විද්‍යාලයට උපාධි ප්‍රදාන තත්වය ලබා දීමේ නියමය.

**(2) මෙම වර්ෂයේදී සම්පාදනය කරන ලද නියමාවලීන්**

2013 දෙසැම්බර් 05 දිනැති අංක 1839/41 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියැවිය යුතු 23 වැනි වගන්තියේ 2 වන උප වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලද 2003 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (සංශෝධන) නියමාවලිය.

### 17.2 අධිකරණ කටයුතු

විශ්වවිද්‍යාල කොමිෂන් සභාවට එරෙහිව විවිධ අධිකරණ හා විනිශ්චය සභා ඉදිරියේ පවරන ලද නඩු 20 ක් පිළිබඳ සියලු කටයුතු නීති අංශය මඟින් වර්ෂය තුළදී සිදු කරන ලදී. ඒවා පහත දැක්වේ;

| | | |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | – | නඩු 08 |
| අභියාචනාධිකරණය | – | නඩු 04 |
| කම්කරු විනිශ්ච සභාව | – | නඩු 01 |
| විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය | – | නඩු 07 |

## 18. විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය මෙම වර්ෂය තුළදී 48 වතාවක් රැස්වන ලදී. වර්ෂය තුළදී විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයෙහි අලුතින් ලියාපදිංචි කරන ලද අභියාචනා ගණන 12 කි. එයින් අභියාචනා 14 ක් සඳහා නියෝග නිකුත් කරන ලද අතර ඉන් නිශ්ප්‍රභා කරන ලද අභියාචනා ගණන 7 ක් වන අතර අභියාචනා 07 ක් සඳහා අනුමැතිය ලැබුණු අතර ඉන් 01 ක් සඳහා පමණක් අවසාන නියෝග ලැබිණි. කිසිදු අභියාචනාවක් සඳහා මූලික නියෝග නිකුත් නොකරන ලදී. එක් අභියාචනාවක් පමණක් කල් තබන ලදී. මේ අතර 2013 වර්ෂය අවසානයේදී අභියාචනා 27ක් පරීක්ෂණ අවසන් නොමැතිව ඉතිරිව පැවතිණි.

විශ්වවිද්‍යාල අභියාචනා මණ්ඩලය විසින් නියෝග නිකුත් කරන ලද අභියාචනා 3 කට එරෙහිව අභියාචනාධිකරණයේද තවත් අභියාචන නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේද විභාග වෙමින් පැවතිණි.

## 19. මූල්‍ය කළමනාකරණය සහ මධ්‍යම අභ්‍යන්තර විගණනය වැඩි දියුණු කිරීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විගණන සහ පරීක්ෂණ පැවැත්වීම මධ්‍යම අභ්‍යන්තර විගණන අංශයට පවරා ඇති අතර එය විසින් පෙර වර්ෂ වලදී මෙන්ම අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් බව, චක්‍රලේඛ උපදෙස් වලට, විශ්වවිද්‍යාල පනතට බලපාන වෙනත් නීතිරීති වලට අනුකූලවීම විමසමින් සහ දෛනික මෙහෙයුම් කටයුතු වලදී ඇතිවන අවදානම් තත්ත්වයන් හඳුනාගනිමින් මෙම වර්ෂයේද අභ්‍යන්තර විගණන කටයුතු ඉදිරියට ගෙන යන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ යහපාලනය පවත්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර විගණන අංශ සමඟ සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විගණන කමිටුව මඟින් විමර්ශන කටයුතු සහ නව ප්‍රතිපත්ති යෝජනා කිරීම සහ ප්‍රතිපත්ති වෙනස් කිරීම් සිදු කරන ලදී. සියලු ප්‍රමාද දෝෂ, දුර්වලතා සහ අඩුපාඩු අදාල ආයතනවල අවදානයට යොමු කල අතර ඒවා වැඩි දියුණු කිරීමට අවශ්‍ය යෝජනා ද ඉදිරිපත් කරන ලදී.

(1) උසස් අධ්‍යාපන ආයතන මඟින් අරමුදල් කළමනාකරණය කිරීම විධිමත්ව සමාලෝචනය සඳහා විගණකාධිපති සහ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේ නිරීක්ෂණ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විගණන කටයුතු සහ විමර්ශන කමිටුවක් පිහිටුවන ලදී. එහි සභාපතිත්වය රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා දරන අතර මහා භාණ්ඩාගාරය විසින් මුදල් රෙගුලාසි වලට අනුකූලව හඳුන්වාදෙන ලද යහපාලනය සහ කළමනාකරණ කටයුතු වලට අනුකූලවීම පිළිබඳ සහතික වෙමින් අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියාවලිවල ප්‍රමාද දෝෂ, දුර්වලතා සහ අඩුපාඩු හඳුනා ගැනීමට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වෙත නිරන්තරයෙන් සහයෝගය දක්වා තිබේ.

    සමාලෝචිත වර්ෂය තුළදී කමිටුව විශ්වවිද්‍යාල 15 සහ උසස් අධ්‍යාපන ආයතන 18 පරීක්ෂණයට බඳුන් කරන ලදී;

(2) සමාලෝචිත වර්ෂය තුළදී විගණන කමිටුව 2013.03.20, 2013.06.28, 2013.09.27 සහ 2013.12.10 ආදී වශයෙන් අවස්ථා හතරකදී රැස්වන ලදී.

(3) ඊට අමතරව මහා භාණ්ඩාගාරයේ, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් නිලධාරීන්ද උසස් අධ්‍යාපන ආයතනවල නිලධාරීන්ද සමඟ ක්‍රමවත් සහ තාර්කික ප්‍රවේශයක් නොමැතිවීම හේතුවෙන් පැන නැගී ඇති ගැටළු සඳහා විසඳුම් සෙවීමට රැස්වීම් 4 ක් පවත්වන ලදී.

## 20. සමීක්ෂණ, ප්‍රකාශන සහ පර්යේෂණ අධ්‍යයන

1. “ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සංඛ්‍යාන 2012” කලාපයේ 11 වන වෙළුම 2013 ජූලි මාසයේදි ප්‍රකාශයට පත් විය.

2. “ශ්‍රී ලංකාවේ නැගී එන තෙල් සහ ගෑස් කර්මාන්තයේ ප්‍රවීණතා වර්ධනයේ සහ ශක්‍යතා වැඩි දියුණු කිරීම” පිළිබඳ වැඩමුළුවේ අන්තර්ගතය ප්‍රකාශනයක් වශයෙන් 2013 දෙසැම්බර් මාසයේදී එළිදැක්වීම.

3. 2012 වර්ෂයේ උසස් අධ්‍යාපනයේ ප්‍රධාන දර්ශක ආවරණය කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර භාවිතය සඳහා දර්ශක පත්‍රිකාවක් සකසා ප්‍රකාශයට පත් කරන ලදී.

4. විශ්වවිද්‍යාල පද්ධතියේ ගිවිසුම් උල්ලංඝනය කරමින් කාර්ය මණ්ඩලය විසින් ගෙවිය යුතු මුදල් ආපසු ලබා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග වල ප්‍රගතිය පිළිබඳ සමීක්ෂණ වාර්තාව (2012 දෙසැම්බර් 31 දිනට) කොමිෂන් සභාවට භාර දෙන ලදී.

5. 2012 වර්ෂයේදී උසස් අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන සිසුන් සඳහා නේවාසික පහසුකම් පිළිබඳ සමීක්ෂණ වාර්තාව කොමිෂන් සභාවට භාර දෙන ලදී.

## 21. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 1999 ජූනි 10 වන දින නිකුත්කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 ප්‍රකාර විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල 1999 සැප්තැම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාපනය කරන ලදී.

**පාලනය සහ කළමනාකරණය**

2013 වර්ෂයේදී විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ පාලනය සහ කළමනාකරණය වැඩිදියුණු කිරීමට සහ ශක්තිමත් කිරීමට යෝජනා විය. ඒ අනුව විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය නියාමනය කිරීම, පරිපාලනය සහ කළමනාකරණය සඳහා අණපනතක් කෙටුම්පත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමටද කලින් කලට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම සඳහා උපදේශක / විමර්ශන මණ්ඩලයක් පත්කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී. මෙම අරමුදලේ වාර්ෂික ගිණුම් සකස් කර විගණනය සඳහා විගණකාධිපති වෙත යොමු කරන ලද අතර රාජ්‍ය නීති රීති අනුව ආයෝජන සිදුකරනු ලැබේ.

විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍යමය තත්වය පහත සඳහන් පරිදි වේ;

| | | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|
| 1 | සාමාජිකත්වය | | | | | |
| | ක්‍රියාකාරීසාමාජිකයින් | **6,883** | **7,282** | **7,588** | **8,167** | 9,124 |
| | වෙනත් අක්‍රීය සාමාජිකයින් | **1,080** | **1,363** | **1,503** | **1,778** | 2,003 |
| | සාමාජිකයින් සංඛ්‍යාව | **7,963** | **8,645** | 9,091 | **9,945** | 11,127 |
| 2 | විශ්‍රාම වැටුප් ලබන සාමාජික සංඛ්‍යාව | **82** | **89** | **113** | **121** | 149 |
| 3 | අරමුදලේ ශේෂය ( රු:මිලි ) | | | | | |
| | දායකත්ව අරමුදල | **1330** | **1633** | **1958** | **2,432** | 3,079 |
| | විශ්‍රාමික අරමුදල සහ වෙන්කිරීම් | **164** | **201** | **278** | **299** | 403 |
| | අරමුදලේ වර්ධනය | **1,494** | **1,833** | **2,236** | **2,731** | 3,482 |
| 4 | සමස්ත ආයෝජන ( රු:මිලි ) | **1,392** | **1,679** | **2,000** | **2,454** | 2,937 |
| 5 | සමස්ත ආයෝජන ආදායම (රු:මිලි) | **208** | **213** | **224** | **236** | 491 |
| 6 | ආදායම් බදු (රු:මිලි) | **21** | **21** | **22** | **20** | 41 |
| 7 | ආයෝජන ආපසු ලැබීම් (%) | **15%** | **13%** | **11%** | **10%** | 17% |
| 8 | සාමාජිකයින් සඳහා ප්‍රකාශිත පොළී අනුපාතය | **13%** | **11.5%** | **8%** | **9%** | 13.50% |
| 9 | විශ්‍රාම වැටුප් ගෙවීම් (රු:මිලි) | **12** | **12** | **17** | **17** | 27 |




## 22. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

විශ්වවිද්‍යාල පද්ධතියෙහි සේවකයින් හට විශ්‍රාම වැටුප් සැලසුමක් වශයෙන් 1978 විශ්වවිද්‍යාල පනතෙහි 89 - 96 වගන්ති ප්‍රකාර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල පිහිටුවා තිබේ. මෙහි අරමුණ වන්නේ ඵලදායී කළමනාකරීත්වය තුළින් එහි සාමාජිකයින්ට විශ්‍රාම ගැනීමේදී හෝ සේවය අවසන් කිරීමේදී වඩාත් හොඳ ප්‍රතිලාභ ලබාදීමයි.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍යාමය තත්වය පහත සඳහන් පරිදි වේ;

| | | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|
| 1. | සාමාජිකත්වය | | | | | | |
| | ක්‍රියාකාරී සාමාජිකයින් | 26,143 | 27,450 | 27,368 | 27,892 | 28,291 | 30,103 |
| | අක්‍රිය සාමාජිකයින් | 5,385 | 5,348 | 5,321 | 5,288 | 5,272 | 5,251 |
| 2. | ප්‍රතිලාභ ගෙවීම් | | | | | | |
| | ප්‍රතිලාභ ගෙවන ලද ගණන | 2,544 | 2,302 | 2,847 | 2,663 | 2,349 | 2,722 |
| | ප්‍රතිලාභ ගෙවීම් (රු:මිලි) | 866.9 | 961.3 | 1,002.0 | 997.3 | 1,031.0 | 1,543.0 |
| 3. | අරමුදලේ ශේෂය ( රු:මිලි ) | 13,761.3 | 15,515.1 | 16,906.6 | 18,502.0 | 20,832.0 | 23,397.0 |
| 4. | පොදු සංචිත ( රු:මිලි ) | 162.5 | 49.4 | 74.8 | 123.7 | 391.0 | 469.0 |
| 5. | පොළී අනුපාත සැමයුම් සංචිතය (රු: මිලි) | - | - | 136.9 | 281.6 | - | - |
| 6. | වර්ෂය තුළ ලබාදුන් ණය මුදල ( රු:මිලි ) | 695.1 | 640.1 | 708.8 | 858.8 | 784.0 | 1,243.0 |
| 7. | සමස්ත ආයෝජන ( රු:මිලි ) | 9,955.6 | 11,350.5 | 12,547.0 | 13,582.0 | 15,682.0 | 16,607.0 |
| 8. | සමස්ත ආයෝජන ආදායම( රු:මිලි ) | 1,189.0 | 1,627.4 | 1,553.8 | 1,560.6 | 1,762.0 | 2,455.0 |
| 9. | ආදායම් බදු ( රු:මිලි ) | 120.7 | 162.7 | 155.3 | 124.8 | 141.0 | 193.0 |
| 10. | ආයෝජනය මත වාර්ෂික ප්‍රතිලාභ අනුපාතය (%) | 12.12% | 14.34% | 12.38% | 11.50% | 11.3% | 14.78% |
| 11. | ප්‍රකාශිත පොළිය- ආරම්භක ශේෂයේදී | 12% | 15.5% | 10.5% | 9.5% | 11.0% | 13.50% |













## 23 2013 වර්ෂයේදී නිකුත් කළ කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් ලබාදී ඇති බලතල සහ වැටුප්, බඳවා ගැනීමේ පටිපාටිය සහ සේවක සංඛ්‍යා සහ වෙනත් පරිපාලනමය කරුණු සම්බන්ධයෙන් අදාළ අනෙකුත් රාජ්‍ය ආයතන මඟින් ලබාදී ඇති මාර්ගෝපදේශන අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි කටයුතු පහසුවෙන් ක්‍රියාත්මක කරනු වස් සමාලෝචිත වර්ෂය තුළදී පහත දැක්වෙන කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි නිකුත් කර තිබේ.

එසේම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමාලෝචිත වර්ෂය තුළදී 1984 වර්ෂයේදී ප්‍රකාශයට පත් කල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය සංශෝධනය කිරීමට ආරම්භ කිරීම වැදගත් කර්තව්‍යයක් වන අතර මේ වනවිට එම කටයුතු අවසන් වෙමින් පවතී. මෙම කර්තව්‍යයේ විශාලත්වය සහ සංකීර්ණ බව හේතුවෙන් විශ්වවිද්‍යාල පද්ධතියේ විශ්‍රාමික ශ්‍රේෂ්ඨ පුද්ගලයින්ගෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාලවල සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් කිහිපදෙනෙකුගෙන් සහාය ලබා ගෙන තිබේ.

අ) කොමිෂන් සභා චක්‍රලේඛ

| චක්‍රලේඛ අංකය | විෂය | දිනය |
|---|---|---|
| 998 | 2013 විශ්වවිද්‍යාල සේවකයින්ට විශේෂ අත්තිකාරම් ගෙවීම -2013 | 03.01.2013 |
| 999 | 2013 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ දීමනා සංශෝධනය. | 04.01.2013 |
| 1000 | 2013 අයවැය යෝජනා අනුව අධ්‍යයන සහ පර්යේෂණ දීමනා | 08.01.2013 |
| 01/2013 | කථිකාචාර්ය (පරිවාස), fjHෂ්ඨ කථිකාචාර්ය II සහ I ශ්‍රේණි, (වෛද්‍ය දන්ත) සහ (වෛද්‍ය දන්ත) නොවන තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම් | 2013.01.28 |
| 02/2013 | තොරතුරු තාක්‍ෂණ පරිපාලනය සහ කළමනාකරණය (තොරතුරු තාක්‍ෂණ ප්‍රතිපත්තිය) | 2013.01.29 |
| 03/2013 | 2012 අයවැය යෝජනා අනුව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30(1) පදනම් කරගනිමින් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වැටුප් විෂමතා නිවැරදි කිරීම. | 2013.03.07 |
| 04/2013 | විශ්වවිද්‍යාල පද්ධතියේ පූර්ණ කාලීන උප නේවාසිකාගාර පාලකයින් සඳහා නිවාඩු අනුමත කිරීම් | 2013.03.19 |
| 05/2013 | ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) | 2013.04.22 |
| 06/2013 | 1942 අංක 45 දරන කම්හල් ආඥා පනත අනුව ලියාපදිංචි කිරීම | 2013.04.22 |
| 07/2013 | බාහිර දේශකවරුන් සඳහා ගාස්තු සහ ප්‍රවාහන ගාස්තු | 2013.04.24 |
| 08/2013 | ගුරුවරුන් සහ නිලධාරීන් සඳහා සප්ත වාර්ෂික නිවාඩු | 2013.05.14 |
| 09/2013 | උසස්වීම් මත ආරක්‍ෂක නියාමක (පහළ ශ්‍රේණියේ) තනතුර දරන්නන් වෙත ආරක්‍ෂක නියාමක (ඉහළ ශ්‍රේණියේ) තනතුර සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දීම | 2013.05.31 |
| 03/2013(i) | 2012 අයවැය යෝජනා අනුව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 (1) පදනම් කරගනිමින් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වැටුප් විෂමතා නිවැරදි කිරීම. | 2013.06.12 |
| 03/2013(ii) | 2012 අයවැය යෝජනා අනුව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30(1) පදනම් කරගනිමින් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වැටුප් විෂමතා නිවැරදි කිරීම. | 2013.06.27 |
| 10/2013 | විශ්වවිද්‍යාල පද්ධතියේ සේවිකාවන් වෙත ප්‍රසූත නිවාඩු සහ මව් කිරි දීමේ විවේකය ලබාදීම. | 2013.09.02 |
| 11/2013 | විධායක කාර්ය මණ්ඩලය / අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ට පශ්චාත් උපාධි / වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා අධ්‍යයන නිවාඩු | 2013.10.10 |

**අ) ආයතන චක්‍රලේඛ ලිපි**

| චක්‍රලේඛ අංකය | විෂය | දිනය |
|---|---|---|
| 01/2013 | විශ්වවිද්‍යාල ලේඛකාධිකාරි තනතුර සඳහා වාහන වෙන් කිරීම. | 2013.01.11 |
| 02/2013 | කොමිෂන් සභා චක්‍රලේඛ සඳහා කේතාංක | 2013.01.24 |
| 03/2013 | අභ්‍යන්තර කාණ්ඩ යටතේ විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යන පරිපාලනමය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම්. | 2013.03.15 |
| 04/2013 | වාර්ෂික වත්කම් සමීක්ෂණය සම්බන්ධව විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන අනුගමනය කළ යුතු පොදු මාර්ගෝපදේශ | 2013.04.10 |
| 05/2013 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ කර ගැනීම. | 2013.05.15 |
| 06/2013 | අනධ්‍යන සහ පරිපාලනමය නොවන ශ්‍රේණිවල සේවකයින්ට ආරක්ෂිත පාවහන් ලබා දීම. | 2013.05.16 |
| 07/2013 | බාහිර දේශකවරුන් සඳහා ගාස්තු සහ ප්‍රවාහන ගාස්තු | 2013.05.17 |
| 08/2013 | භාෂා ප්‍රවීනතා දීමනා ගෙවීම. | 2013.05.23 |
| 09/2013 | අධ්‍යන නිවාඩු ලබා ගැනීම සඳහා ගුරුවරුන් විසින් විශ්වවිද්‍යාල සමඟ ඇති කරගත් ගිවිසුම් උල්ලංඝනය කිරීමෙන් උපයා ගන්නා ලද ආදායම උපයෝගී කර ගැනීම. | 2013.06.05 |
| 10/2013 | පුහුණුවන්නන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම. | 2013.06.17 |
| 11/2013 | රමලාන් (රාමසාන්) කාලයේදී විශේෂ නිවාඩු ලබා ගැනීම 2013 | 2013.07.08 |
| 12/2013 | නිලධාරීන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම. | 2013.08.29 |
| 13/2013 | රාජකාරියේ නිරතව සිටියදී තුවාල ලබන විශ්වවිද්‍යාල සේවකයින් සඳහා සහන ලබා දීම. | 2013.09.13 |
| 14/2013 | රාජකාරී නිල ඇඳුම් සඳහා මැහුම් කුළී | 2013.10.01 |
| 15/2013 | පුස්තකාල සහායක III, II, I ශ්‍රේණි සහ කාර්යය සහායක / පුස්තකාල සේවා සහ ජ්‍යෙෂ්ඨ කාර්යය සහායක බඳවා ගැනීම් පටිපාටිය | 2013.12.05 |
| 16/2013 | දකුණු අප්‍රිකාවේ හිටපු ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා අභාවප්‍රාප්ත වූ දිනයෙහි ජාතික කොඩිය අඩ කුඹු කොට තැබීම. | 2013.12.09 |
| 17/2013 | පරිගණක යෙදවුම් සහකාර II ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම් පටිපාටිය | 2013.12.20 |
| 18/2013 | විශ්වවිද්‍යාල සේවකයින්ට විශේෂ අත්තිකාරම් ගෙවීම 2014 | 2013.12.30 |
| 19/2013 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 35/2013 අදාළ කර ගැනීම. | 2013.12.31 |
| 20/2013 | වැටුප් පරිමාණයේ ඉහළම පියවරෙහි නැවතී සිටින සේවකයින් සඳහා වැටුප් වර්ධක ලබා දීම. | 2013.12.31 |

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | 2013 | 2012 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපල පිරියත හා උපකරණ | 529,142,307.00 | 545,594,270.00 |
| ආයෝජන | 30,489,952.00 | 34,876,395.00 |
| | 559,632,259.00 | 580,470,665.00 |
| ජංගම වත්කම් | | |
| තොග | 2,079,049.00 | 3,668,369.00 |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් | 115,583,692.00 | 63,796,997.00 |
| ඉදිරියට කල ගෙවීම් හා කැන්පතු | 5,683,657.00 | 3,383,369.00 |
| මුදල් හා මුදල් සමාන වත්කම් | 63,462,411.00 | 6,104,707.00 |
| | 186,808,809.00 | 76,953,441.00 |
| | **746,441,068.00** | **657,424,106.00** |
| මුළු වත්කම් | | |
| ස්කන්ධය සහ වගකීම් | | |
| ඒකාබද්ධ අරමුදල | | |
| විලම්භිත ප්‍රාග්ධන ලැබීම් | 14,098,904.00 | 27,441,758.00 |
| වියදම් නොවූ ප්‍රාග්ධන ප්‍රදාන | 2,091,164.00 | 4,066,949.00 |
| ස්ථාවර වත්කම් පුනරුත්ථාපන හා වැඩි දියුණුකිරීම් ප්‍රදාන | 2,097,125.00 | 1,126,076.00 |
| වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය | 509,313,767.00 | 509,313,767.00 |
| ඉදිරියට ගෙන ආ අතිරික්තය/ඌනතාවය | (19,764,544.00) | (22,137,450.00) |
| කාර්ය මණ්ඩල සංවර්ධන සඳහා වූ වෙනත් සංචිත | 17,000,000.00 | |
| | 524,836,416.00 | 519,811,100.00 |
| ජංගම නොවන වත්කම් | | |
| පර්යේෂණ අරමුදල් | 12,150,870.00 | 18,987,239.00 |
| විශේෂ අරමුදල් | 10,278,787.00 | 9,881,435.00 |
| විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව අරමුදල් | 19,230,185.00 | 18,258,844.00 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | 36,798,930.00 | 35,696,924.00 |
| | 78,458,772.00 | 82,824,442.00 |
| ජංගම වත්කම් | | |
| වි.වි සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා කළ යුතු ගෙවීම් | 125,046,784.00 | 42,136,386.00 |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් | 17,776,713.00 | 7,892,499.00 |
| කල්බදු-ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව | | 4,386,659.00 |
| ආපසු ගෙවිය යුතු කැන්පතු | 322,383.00 | 373,018.00 |
| | 143,145,880.00 | 54,788,563.00 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **746,441,068.00** | **657,424,106.00** |

අත්සන් කරන ලද්දේ

අත්සන් කරන ලද්දේ

මහාචාර්ය එස්.එස්.එම්.කේ.කේ. හිරිබුරේගම

සභාපති

ආර්.ඒ.යූ. රණවීර

ගණකාධිකාරී

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## 2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය

| | 2013 | 2012 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| **ආදායම්** | | |
| රජයේ ප්‍රදාන | | |
| පුනරාවර්තන ප්‍රදාන | 807,826,734.00 | 1,085,874,583.00 |
| ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 19,528,951.00 | 9,490,059.00 |
| ක්‍රමක්ෂය කරන ලද ප්‍රාග්ධන ආධාර | 17,418,640.00 | 22,991,495.00 |
| දකුණු ආසියාතික විශ්වවිද්‍යාලය සඳහා ආධාර | 111,221,124.00 | 70,359,281.00 |
| දැනුම වැඩි කිරීම සහ ආයතනික සංවර්ධනය සඳහා ප්‍රාග්ධන ආධාර | 173,653,707.00 | 398,514,723.00 |
| දේපළ ණය | 17,105,414.00 | |
| **රජයේ මුළු ප්‍රදාන** | **1,146,754,571.00** | **1,587,230,141.00** |
| වෙනත් ආදායම් | 41,572,325.00 | 19,739,390.00 |
| | **1,188,326,896.00** | **1,606,969,531.00** |
| **අඩු කලා වියදම්** | | |
| සේවක වේතන | 115,982,137.00 | 112,104,960.00 |
| ගමන් වියදම් | 3,283,340.00 | 1,419,918.00 |
| සැපයුම් | 12,069,233.00 | 10,896,944.00 |
| නඩත්තු | 6,667,438.00 | 7,383,341.00 |
| ගිවිසුම්ගත සේවා සඳහා වියදම් | 31,925,647.00 | 22,421,462.00 |
| වෙනත් වර්තන වියදම් | 62,016,907.00 | 36,269,554.00 |
| පුනරුත්ථාපන වියදම් | 19,528,951.00 | 9,490,059.00 |
| ස්ථාවර වත්කම් ක්ෂයවීම් | 21,295,633.00 | 22,991,495.00 |
| ශිෂ්‍ය මූල්‍ය ආධාර | 480,847,100.00 | 384,860,380.00 |
| වි.වි/උසස් අධ්‍යාපන ආයතන සඳහා මූල්‍ය ආධාර | 416,874,831.00 | 993,956,286.00 |
| | **1,170,491,218.00** | **1,601,794,400.00** |
| **2013 වර්ෂය සඳහා අතිරික්තය / (ඌනතාවය)** | **17,835,677.00** | **5,175,131.00** |

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ

## 2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| | 2013 | 2012 |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ලැබීම් | | |
| මෙහෙයුම් අතිරික්තය / (ඌනතාවය) | 17,835,677.00 | 5,175,131.00 |
| **ගැලපීම්** | | |
| පෙර ගෙවීම් සඳහා පූර්ව වර්ෂයේ ගැලපීම් | 260,000.00 | |
| ක්ෂයවීම් | 21,295,633.00 | 22,991,495.00 |
| පාරිතෝෂිතය සඳහා වෙන් කිරීම් | 4,639,084.00 | 3,610,826.00 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය /අලාභය | (579,943.00) | 1,442,719.00 |
| පොළී වියදම් | 912,786.00 | 912,773.00 |
| ක්‍රමක්ෂය කරන ලද ප්‍රාග්ධන ආධාර | (17,418,640.00) | (22,991,495.00) |
| ක්‍රමක්ෂය කරන ලද පුනරුත්ථාපන ආධාර | (19,528,951.00) | (9,490,059.00) |
| මෙහෙයුම් අතිරික්තය / (ඌනතාවය) | **7,415,646.00** | **1,651,390.00** |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්** | | |
| තොග වල වැඩිවීම | 1,589,319.00 | 541,266.00 |
| ණයගැතියන්ගේ වැඩිවීම | (51,786,694.00) | (26,455,124.00) |
| ඉදිරියට කල ගෙවීම් වල වැඩිවීම | (2,300,288.00) | (1,143,956.00) |
| උසස් අධ්‍යාපන ආයතන වලට ගෙවියයුතු වියදම් වැඩිවීම | 82,910,398.00 | 19,969,963.00 |
| වෙළඳ ණයහිමියන්ගේ අඩුවීම | 9,884,214.00 | (792,066.00) |
| තැන්පතු අඩුවීම | (50,635.00) | (123,627.00) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් | 47,661,958.00 | (6,352,154.00) |
| පාරිතෝෂිත ගෙවීම් | (3,537,078.00) | (3,785,625.00) |
| පොළී ගෙවීම් | (912,786.00) | (912,773.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **43,212,094.00** | **11,050,553.00** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| දේපල පිරියත සහ උපකරණ මිලදී ගැනිම | (4,075,707.00) | (8,626,436.00) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් | 1,089,290.00 | |
| ස්ථාවර තැන්පතු මත ආයෝජන | 4,386,442.00 | 163,418.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,400,025.00** | **(8,463,018.00)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ආධාර ලැබීම් | 2,100,000.00 | 8,000,000.00 |
| පුනරුත්ථාපන ප්‍රදාන | 20,500,000.00 | 7,000,000.00 |
| පර්යේෂණ අරමුදල් වල වැඩිවීම | (6,836,369.00) | 1,010,832.00 |
| වාහන සඳහා කල්බදු ගෙවීම් | (4,386,738.00) | (4,386,668.00) |
| විදේශ ආධාර ව්‍යාපෘතිවලින් ලැබීම් ගෙවීම් | | (2,344,720.00) |
| විශේෂ කාර්යයන් සඳහා අරමුදල් ලැබීම් | 397,352.00 | 1,658,654.00 |
| ශිෂ්‍යත්ව අරමුදලින් ලැබීම් /(ගෙවීම්) | 971,341.00 | (75,628.00) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **12,745,586.00** | **10,862,469.00** |
| **ශුද්ධ මුදල් ප්‍රවාහය** | **57,357,706.00** | **(8,651,103.00)** |
| 2013.01.01 දිනට මුදල් ශේෂය | 6,104,707.00 | 14,755,811.00 |
| **2013.12.31 දිනට මුදල් ශේෂය සටහන 01** | **63,462,413.00** | **6,104,707.00** |

| | | |
|---|---|---|
| **සටහන 01** | | |
| ලංකා බැංකුව 2323284 | 33,710,651.00 | (89,970,556.00) |
| ලංකා බැංකුව විදේශ ව්‍යාපෘති | 277,940.00 | 277,940.00 |
| ලංකා බැංකුව විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව අරමුදල | 4,473,822.00 | 5,797,333.00 |
| ලංකා බැංකු අංක 2323284 | | |
| කෙටිකාලින තැන්පතු වල ආයෝජන | 25,000,000.00 | 90,000,000.00 |
| | **63,462,413.00** | **6,104,707.00** |

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ
## 2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රකාශය

| | විලම්බිත ප්‍රදාන | රඳවා ගැනීම් / (ඌනතාවය) | ප්‍රතිප්‍රමාණ අතිරික්තය | කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| 2011.12.31 දිනට ශේෂය | 50,116,339.00 | -29,455,544.00 | 509,313,767.00 | | 519,811,100.00 |
| සේවය හැරගිය සේවකයින්ගේ පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | | 2,142,963.00 | | | 2,142,963.00 |
| වැඩිකල ප්‍රාග්ධන ආධාර | 5,509,939.00 | | | | 5,509,939.00 |
| වත්කම් ක්ෂය වීම සඳහා ක්‍රමක්ෂය කරන ලද ප්‍රදාන | -22,991,495.00 | | | | -22,991,495.00 |
| 2012 වර්ෂය සඳහා මුළු ආදායම/අතිරික්තය /(ඌනතාව) | | 5,175,131.00 | | | 5,175,131.00 |
| 2012.12.31 දිනට ශේෂය | **32,634,783.00** | **-22,137,450.00** | **509,313,767.00** | | **519,811,100.00** |
| <u>2013 වර්ෂයේදී ස්කන්ධය වෙනස්වීම්</u> | | | | | |
| පෙර ගෙවීම් සඳහා ගැලපීම | | 260,000.00 | | | 260,000.00 |
| ස්ථාවර වත්කම් ඉවත්කිරීම් | | 1,277,229.00 | | | 1,277,229.00 |
| ප්‍රාග්ධන ආධාර ඉහල යාම | 3,071,050.00 | | | | 3,071,050.00 |
| වත්කම් ක්ෂය වීම සඳහා ක්‍රමක්ෂය කරන ලද ප්‍රදාන | -17,418,640.00 | | | | -17,418,640.00 |
| 2013 වර්ෂය සඳහා මුළු ආදායම/අතිරික්තය /(ඌනතාව) | | 17,835,677.00 | | | 17,835,677.00 |
| කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල සඳහා මාරු කළ ශේෂය | | -17,000,000.00 | | 17,000,000.00 | |
| 2013.12.31 දිනට ශේෂය | **18,287,193.00** | **19,764,544.00** | **509,313,767.00** | **17,000,000.00** | **524,836,416.00** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊසි/බී/යූජීසී/1/13/11

මබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 නොවැම්බර් 27 දින

සභාපති,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 (5) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

පිටපත් :- 1. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

2. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊසි/ඕ/යූජීසි/1/13/11

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 නොවැම්බර් 27 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12(5) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12(1), (4) සහ (7) උප වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2014 ජූලි 31 දින නිකුත් කරන ලදී.

### 1:2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1:3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2:1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2:2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 හා 2013 වර්ෂයන්හිදි ශිෂ්‍යාධාර ගෙවීම සඳහා ලබාදුන් අත්තිකාරම් රු.26,401,600 ක් 2014 ජුනි 30 දින වනවිටද පියවා නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් දරන ලද එකතුව රු.893,271 ක වියදම් නිරවුල් කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශිෂ්‍යත්ව ලාභීන්ට ගෙවීම් නොකර 2011 වර්ෂයේ සිට පැවත එන රු.64,600 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවියයුතු ශිෂ්‍යත්ව අරමුදල් ගිණුමෙ පැවතුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.17,835,677 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.5,175,131 ක් වූ බැවින් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,660,546 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීමේ ප්‍රදාන රු.10,038,892 කින් වැඩි වීම, දකුණු ආසියා විශ්වවිද්‍යාල සඳහා දායක ලෙස ලැබුණු ප්‍රදාන රු.40,861,843කින් වැඩිවීම, දේපල ණය සඳහා රු.17,105,414 ක ප්‍රදාන ලැබීම සහ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වු වියදම් රු.577,081,455 කින් අඩුවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3:2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එරෙහිව අධිකරණයන්හි හා අනෙකුත් ආයතනවල නෛතික සිද්ධීන් 86 ක් විභාග වෙමින් පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4:1 කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පසුගිය වර්ෂ 03 ක් සඳහා විශ්වවිද්‍යාලවලට බඳවා ගත් සිසුන් සංඛ්‍යාව හා දරන ලද පුනරාවර්තන වියදම් වල සාරාංශයක් පහත දැක්වේ.

| | 2010/2011 | 2011/2012 | 2012/2013 |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 142,516 | 141,411 | 144,816 |
| විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීමට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | 22,016 | 28,937 | 22,943 |
| විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලයට තෝරාගත් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස | 15 | 20 | 16 |

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| දරන ලද පුනරාවර්තන වියදම (රු.'000) | 14,972,000 | 17,587,000 | 21,655,000 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 77,657 | 73,295 | 80,380 |
| එක් ශිෂ්‍යයෙකු සඳහා සාමාන්‍ය පුනරාවර්තන වියදම (රු) | 192,796 | 239,948 | 269,407 |

- ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ සියයට 02 ක වැඩි වීමක් තිබුණද බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 21 කින් අඩු වී තිබුණු අතර එක් ශිෂ්‍යයෙකු සඳහා සාමාන්‍ය පුනරාවර්තන වියදම රු.269,407 ක් විය.

(ආ) ජාතික විශ්වවිද්‍යාල හයක් ලෝක තත්ත්වයේ විශ්වවිද්‍යාල දක්වා නඟා සිටුවීම.

2013 වර්ෂයේදී උක්ත කාර්යය සඳහා විශ්වවිද්‍යාල 6 ක් සඳහා රු. මිලියන 285 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2013 ජූලි මාසයේදී සිදු කරන ලද ජාත්‍යන්තර මූල්‍ය තත්ත්ව දර්ශකය අනුව 2012 වර්ෂය හා සාපේක්ෂව රුහුණු විශ්වවිද්‍යාලය පමණක් ජාත්‍යන්තර තත්ත්ව දර්ශකයේ ඉහළ මට්ටමක තිබුණු අතර කොළඹ, මොරටුව, ශ්‍රී ජයවර්ධනපුර, කැලණිය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාල එම දර්ශකයේ පහළ මට්ටමක තිබුණි.

### 4:2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වූ ගිවිසුම් කඩකල නිලධාරීන්ගෙන් අයවියයුතු බැඳුම්කර වටිනාකම විශ්වවිද්‍යාල 4ක් සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයට අනුව රු.273,491,143 ක් බව නිරීක්ෂණය විය. විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7.6, 7.7 හා 7.8 වගන්තිවලින් මෙකී මුදල් අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දක්වා ඇතත් ඒ සඳහා විශ්වවිද්‍යාල යොමු කරවීම හා පසු විපරම් නිරීක්ෂණය සඳහා සාර්ථක ක්‍රමවේදයක් කොමිෂන් සභාව ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) කොමිෂන් සභාව යටතේ පැවති එකතුව රු.16,612,390 ක් වූ විශේෂ අරමුදල් 4 ක ශේෂයන් සමාලෝචිත වර්ෂය තුළ එම අරමුදල්වල පරමාර්ථයන් ඉටුකර ගැනීමට යොදා නොගෙන අක්‍රියව පැවතුණි.

### 4:3 මත භේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව ගිවිසුම් කඩකිරීම් වෙනුවෙන් අය කරගත් මුදල් විශ්ව විද්‍යාල අරමුදලට බැර කළයුතු වුවත් භාණ්ඩාගාර අනුමැතියකින්ද තොරව ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ අරමුදලක් එක් එක් විශ්වවිද්‍යාල විසින් නඩත්තු කරමින් ඉන් ලැබෙන ආදායම විශ්වවිද්‍යාලවල විවිධ වියදම් සඳහා යොදා ගෙන තිබුණි. විශ්වවිද්‍යාල 13ක සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙම අරමුදල්වල එකතුව රු.593,760,767 ක් විය.

(ආ) ගිවිසුමකට එළඹීමකින් තොරව පෞද්ගලික සමාගමකින් කොමිෂන් සභාව විසින් අන්තර්ජාල පහසුකම් ලබාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ රු.1,985,324 ක මුදලක් ඒ සඳහා වැයකර තිබුණි.

(ඇ) සංග්‍රහ වියදම් හා දුරකථන වියදම් පියවීම සඳහා භාණ්ඩාගාර එකඟතාවයකින් තොරව 2014 මාර්තු 26 දිනැති අංක 06/2014 හා 2011 මැයි 24 දිනැති අංක 05/2011 දරන චක්‍රලේඛ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබුණි.

**4:4 කාර්ය මණ්ඩල පරිපාලනය**

කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 293 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 206 ක් වූයෙන් කාර්ය මණ්ඩලය 87 දෙනෙකුගේ ඌනතාවයක් නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5:1 අයවැය ලේඛනමය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී.12 දරන චක්‍රලේඛයේ 5.2.1 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර අයවැය ගත වියදම් හා තත්‍ය වියදම් අතර සියයට 21 සිට සියයට 228 දක්වා වූ පරාසයක විචලනයන් පැවතියෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**5:2 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 16 වන වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී මාස 06 ක් ඉකුත්වීමට පෙර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ සභාපතිතුමියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය

(ඇ) පිරිස් කළමනාකරණය

(ඈ) තොග පාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ **2013** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ **108(2)** වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ගන්නා ලද/ගැනීමට යෝජිත පියවර

<table>
<tr><th></th><th>යොමුව</th><th>විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු</th><th>විගණකාධිපති වෙත යොමු කරන ලද පිළිතුරු සහ නිරීක්ෂණ</th><th>ගෙන ඇති පියවර හා වර්තමාන තත්ත්වය</th></tr>
<tr><td>2.</td><td>මූල්‍ය ප්‍රකාශන</td><td></td><td></td><td></td></tr>
<tr><td>2.1</td><td>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</td><td></td><td></td><td></td></tr>
<tr><td>2.1.1</td><td>මූල්‍ය තත්ත්වය</td><td>කොමිෂන් සභාවේ 2012 හා 2013 මූල්‍ය තත්ත්වය පිළිබඳ සාරාංශයක් හා එහි වෙනස්වීම් වල ප්‍රතිශතය පහත දැක්වේ.
<table>
<tr><th>විෂයය</th><th>2013<br>රු.</th><th>2012<br>රු</th><th>වෙනස්වීමේ<br>ප්‍රතිශතය %</th></tr>
<tr><td>ආදායම</td><td>1,188,326,896</td><td>1,606,969,531</td><td>26</td></tr>
<tr><td>වියදම</td><td>1,170,491,218</td><td>1,601,794,400</td><td>27</td></tr>
<tr><td>වියදමට වැඩි ආදායම</td><td>17,835,677</td><td>5,175,131</td><td>245</td></tr>
</table>
</td><td>පහත සඳහන් ප්‍රධාන හේතු මෙම විචලනය සඳහා බලපා ඇත<br>ආදායම
<table>
<tr><th>අයිතමය</th><th>වෙනස %</th><th>හේතුව</th></tr>
<tr><td>පුනරාවර්තන ප්‍රතිපාදන</td><td>(25% )</td><td>ජීවන වියදම් දීමනාවේ සේවක අර්ථසාධක දායකත්ව හිඟ මුදල් ගෙවීම සඳහා ලබා ගන්නා ලද ප්‍රතිපාදන 73% කින් අඩුවීම මේ සඳහා මූලික හේතුව වේ.</td></tr>
<tr><td>KEID සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන</td><td>(56% )</td><td>2012 වසරේදී මෙම ප්‍රතිපාදන වි. වි. ප්‍ර. කො. සභාව මඟින් අදාල වි.විද්‍යාලවලට ලබාදුන් නමුත් 2013 වසරේදී එම ප්‍රතිපාදන සෘජුවම වි. විද්‍යාලවලට ලබාදෙන ලදි. වි.වි.ප්‍ර.කො. සභාව වෙත පැවතියේ ඉතා අඩු ප්‍රතිපාදනයකි.</td></tr>
<tr><td>දකුණු ආසියානු වි. වි. සඳහා දායකත්වය</td><td>58%</td><td>මේ සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබාදියයුතු දායක මුදල 2012 වසරේදී ඇ. ඩොලර් මිලියන 0.527ක් වූ අතර 2013 එය ඇ.ඩොලර් මිලියන 0.874 ක් වීම නිසා මේ සඳහා ඉල්ලුම් කළ ප්‍රතිපාදන වැඩිවී ඇත.</td></tr>
</table>
</td><td>2013 වර්ෂයේදී ආදායම අඩු වීම කෙරෙහි පහත සඳහන් කරුණු බලපා ඇත.<br><br>(i) හිඟ ජීවන වියදම් ගෙවීමේ කටයුතු 2012 වසරේ සිදුකල බැවින් 2013 හිඟ ජීවන විදයම් ගෙවීමේ කටයුතු සඳහා වෙන්කල ප්‍රතිපාදන ප්‍රමාණය අඩුවීම.<br><br>(ii) 2013 වසරේ සිට දැනුම වැඩිදියුණු කිරීම හා ආයතනික සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ඒ ඒ විශ්වවිද්‍යාල යටතේ අනුමත කර ක්‍රියාත්මක කරන ලදි. ඒ නිසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වූ ප්‍රතිපාදනයේ අඩුවීමක් දක්නට ලැබේ.<br><br>(iii) දකුණු ආසියානු වි.වි. දායකත්වය සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබාදියයුතු දායක මුදල 2012 වසරේදී ඇ. ඩොලර් මිලියන 0.527ක් වූ අතර 2013 එය ඇ.ඩොලර් මිලියන 0.874 කින් වැඩිවීම ප්‍රතිපාදන වැඩිවීම කෙරෙහි බලපා ඇත.</td></tr>
</table>

87

<table>
<tr><th></th><th>යොමුව</th><th>විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු</th><th>විගණකාධිපති වෙත යොමු කරන ලද පිළිතුරු සහ නිරීක්ෂණ</th><th>ගෙන ඇති පියවර හා වර්තමාන තත්වය</th></tr>
<tr><td>2.1.1</td><td>මූල්‍ය තත්වය</td><td></td><td>වියදම<br><table>
<tr><th>අයිතමය</th><th>වෙනස %</th><th>හේතුව</th></tr>
<tr><td>වි.වි.සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා මූල්‍ය සහය</td><td>(58% )</td><td>2013 වසරේදී මෙම ප්‍රතිපාදන විශ්වවිද්‍යාල වලට සෘජුවම ලබා දුන් නිසා දැනුම වැඩිදියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය සඳහා වියදම 56% කින් අඩුවීමත් ජීවන වියදම් දීමනාවට අදාලව හිඟ මුදල් ගෙවීමට අදාල වියදම 74% කින් අඩුවීමත් මෙම විචලනයට මූලිකව බලපා ඇත.</td></tr>
<tr><td>ශිෂ්‍ය මූල්‍ය සහය</td><td>25%</td><td>පසුගිය වසරට සාපේක්ෂව ශිෂ්‍යාධාර ප්‍රතිපූර්ණය කිරීම සඳහා විශ්වවිද්‍යාල වලින් ලැබුණ ඉල්ලීම 36% කින් ඉහළයාම මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.</td></tr>
<tr><td>වෙනත් පුනරාවර්තන වියදම්</td><td>71%</td><td>2013 වර්ෂය තුලදී විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයන් වෙත ලබාදෙන දේපල ණය වල පොළී ගෙවීම සඳහා දරණ ලද රු.මිලියන 17ක වියදමත් පොදු රාජ්‍ය මණ්ඩලීය ශෂ්‍යත්ව අරමුදල සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය වෙනුවෙන් ලබාදෙන රු.මිලියන 6.6 ක වියදමත් මෙම විචලනය සඳහා බලපා ඇති ප්‍රධාන සාධක වේ.</td></tr>
</table></td><td>2013 වර්ෂයේදී වියදම් විචලනයට හේතු වී ඇති කරුණු<br><br>(i) 2013 වසරේදී දැනුම වැඩිදියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය සඳහා ප්‍රතිපාදන සෘජුවම වි. විද්‍යාලවලට ලබාදීමත් හිඟ ජීවන වියදම් පියවීමේ කටයුතු 2012දී 75%ක් පමණ අවසන්කල නිසා 2013 වසරේ වියදම අඩුවී වීම.<br><br>(ii) ශිෂ්‍යාධාර ප්‍රතිපූර්ණය කිරීම සඳහා විශ්වවිද්‍යාල වලින් ලැබුණ ඉල්ලීම ඉහළයාම.<br><br>(iii) 2013 වර්ෂය තුලදී විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයන් වෙත දේපල ණය වල පොළී ගෙවීම සඳහා රු.මිලියන 17ක් ලබා දීම සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව අරමුදල සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය වෙනුවෙන් ලබාදෙන රු.මිලියන 6.6 ක් ලබා දීම.</td></tr>
</table>

88

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ගන්නා ලද/ගැනීමට යෝජිත පියවර

<table>
<tr><th></th><th>යොමුව</th><th>විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු</th><th>විගණකාධිපති වෙත යොමු කරන ලද පිළිතුරු සහ නිරීක්ෂණ</th><th>ගෙන ඇති පියවර හා වර්තමාන තත්ත්වය</th></tr>
<tr>
<td>2.1.2<br>.</td>
<td>මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය</td>
<td>කොමිෂන් සභාවේ2012 හා2013 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එහි වෙනස්වීම් වල ප්‍රතිශතය පහත දැක්වේ.
<table>
<tr><th>විෂයය</th><th>2013 රු.</th><th>2012 රු.</th><th>වෙනස් වීමේ ප්‍රතිශතය %</th></tr>
<tr><td>ස්ථාවර වත්කම්</td><td>559,632,259</td><td>580,470,665</td><td>4</td></tr>
<tr><td>ජංගම වත්කම්</td><td>186,808,809</td><td>76,953,441</td><td>143</td></tr>
| **අරමුදලේ ශුද්ධ අගය** | | **3,481,883,034** | **2,723,380,304** |

අත්සන් කළේ තිස්ස නන්දසේන
ලේකම්

අත්සන් කළේ ආර් ජ්.යු රණවීර
ගණකාධිකාරී

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | | Note | 2013 (රු.) | 2012 (රු.) |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| ආයෝජන ආදායම | | 9 | 490,871,379 | 227,837,778 |
| අඩු කළා: | ආදායම් බදු | | 41,174,151 | 20,113,517 |
| බදු පසු ශුද්ධ ආදායම | | | 449,697,228 | 207,724,261 |
| අඩු කළා: | **වියදම්** | | | |
| | විශ්‍රාම අරමුදලේ ගැලපීම | 10 | 2,895,828 | 1,755,904 |
| | මෙහෙයුම් වියදම් | 11 | 394,398 | 110,950 |
| | | | 3,290,226 | 1,866,854 |
| **වියදම් අඩුකල පසු ශුද්ධ ආදායම** | | | **446,407,001** | **205,857,407** |
| එකතු කළා: | ඉදිරියට ගෙනා රඳවා ගත් ලාභය | | 212,495,036 | 201,906,600 |
| **බෙදිය හැකි ශුද්ධ ආදායම** | | | **658,902,037** | **407,764,007** |
| අඩු කළා: | **සාමාජික පොළී** | | | |
| | දායක අරමුදල් සඳහා පොළිය | | 349,500,444 | 189,115,287 |
| | විශ්‍රාම අරමුදල් සඳහා පොළිය | | 9,998,790 | 6,153,684 |
| | | | 359,499,234 | 195,268,971 |
| **ඉදිරියට ගෙන ගිය රඳවා ගත් ලාභය** | | | **299,402,803** | **212,495,036** |

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල
2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය** | | |
| බදු හා වියදම් පසු ශුද්ධ ආදායම | 447,740,263 | 205,857,407 |
| එකතු කළා/ (අඩු කළා) : භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම්/ අ | (20,061,870) | (9,930,494) |
| විකුණූ භාණ්ඩාගාර බැඳුම්කර මත ලාභය/ අලාභය | (21,772,398) | - |
| විශ්‍රාම අරමුදලේ ගැලපීම | 2,895,828 | 1,755,905 |
| ආදායම් බදු | 41,174,151 | 20,113,517 |
| | 449,975,974 | 217,796,335 |
| කාරක ප්‍රාග්ධනය ක්‍රියාකාරී අරමුදල් ( | | |
| ලැබිය යුතු ආයෝජන ආදායම් (වැඩිවීම )/අඩුවීම | (338,438,761) | (7,776,395) |
| විවිධ ණයහිමියන්ගේ වැඩිවීම/ (අඩුවීම) | 43,175 | 33,000 |
| මෙහෙයුම් ක්‍රියකාරකම් තුළින් උත්පාදනය වූ මුදල | 111,580,388 | 210,052,940 |
| අඩුකළා: ආදායම් බදු ගෙවීම් | (8,638,868) | (15,791,126) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **102,941,520** | **194,261,814** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර තැන්පත් වල වර්ධනය | 466,000,000 | 1,540,000,000 |
| ස්ථාවර තැන්පත් වල ආයෝජනය | (958,000,000) | (2,039,828,833) |
| විකුණුම්/ කල් පිරීම්- භාණ්ඩාගාර බැඳුම්කර | 692,376,702 | 382,371,951 |
| භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම් | (617,887,684) | (321,093,216) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(417,510,982)** | **(438,550,098)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය** | | |
| දායක මුදල් ලැබීම් | 390,017,519 | 276,834,536 |
| දායක මුදල් ආපසු ගෙවීම් | (18,912,289) | (15,682,163) |
| විශ්‍රාම වැටුප් ගෙවීම් | (26,689,465) | (17,495,086) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **344,415,765** | **243,657,287** |
| මුදල් සහ මුදල් සමාන අයිතම වල ශුද්ධ වැඩිවීම | 29,846,304 | (630,997) |
| ආරම්භක මුදල් සහ මුදල් සමාන අයිතම | 6,298,524 | 6,929,521 |
| අවසාන මුදල් සහ මුදල් සමාන අයිතම | **36,144,828** | **6,298,524** |

## විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා වන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| | දායකයන්ගේ අරමුදල (රුපියල්) | විශ්‍රාමිකයන්ගේ අරමුදල (රුපියල්) | සමුච්චිත අරමුදල (රුපියල්) | එකතුව (රුපියල්) |
|---|---|---|---|---|
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,957,687,424 | 76,114,210 | 201,906,600 | 2,235,708,234 |
| 2012 වර්ෂය සඳහා අතිරික්තය | | | 10,588,436 | 10,588,436 |
| පවත්නා වර්ෂයයේ ආදායමෙන් වන හුවමාරු | | 1,755,904 | | 1,755,904 |
| සාවද්‍ය දායකත්වය මත ලැබු පොලිය | (1,136) | - | | -1,136 |
| පවත්නා වර්ෂයේ දායකත්ව අරමුදල් | 317,109,810 | | | 317,109,810 |
| සම්පූර්ණ දායක මුදල් ආපසු ලබාදීම | (17,744,027) | | | (17,744,027) |
| දායක අරමුදල/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරී | (12,145,935) | 12,145,935 | | - |
| වි.වි. අර්ථසාධක අරමුදල වෙත මාරු කිරීම් | (1,810,802) | | - | -1,810,802 |
| 2012 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම | | -17,495,086 | | -17,495,086 |
| විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොලිය | 189,115,287 | 6,153,684 | - | 195,268,971 |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 2,432,210,621 | 78,674,647 | 212,495,036 | 2,723,380 |
| 2013 වර්ෂය සඳහා අතිරික්තය | - | | 446,407,001 | 446,407,001 |
| පවත්නා වර්ෂයයේ ආදායමෙන් වන හුවමාරු | | 2,895,828 | | 2,895,828 |
| විශ්‍රාමිකයන්ට අදාල දායක මුදල් ලැබීම් | | 926,143 | | 926,143 |
| සාවද්‍ය දායකත්වයන් නිවැරදි කිරීම | (895) | | | (895) |
| පවත්නා වර්ෂයයේ දායකත්ව අරමුදල | 361,043,993 | | - | 361,043,993 |
| සම්පූර්ණ දායක මුදල් ආපසු ලබාදීම | (24,336,689) | | - | -24,336,689 |
| දායක අරමුදල/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරී | (38,122,303) | 38,122,303 | | - |
| වි.වි අර්ථසාධක අරමුදල වෙත මාරු කිරීම් | (1,743,186) | | - | -1,743,186 |
| වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම | - | -26,689,465 | | -26,689,465 |
| විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොලිය | 349,500,444 | 9,998,790 | -359,499,234 | - |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **3,078,551,984** | **103,928,247** | **299,402,803** | **3,481,883,034** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. } යූජී/බී/පීඑන්එෆ්/1/13/05

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2014 ඔක්තෝබර් 16 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගෙවියයුතු ගිණුම්

ජීවන වියදම් ඇතුලත්ව විශ්‍රාම වැටුප් ගණනය කිරිමට අමාත්‍ය මණ්ඩලය තීරණය කිරීමෙන් පසුව ඒ වෙනුවෙන් විශ්‍රාම වැටුපට බැර විය යුතු මුදල් පියවීම සඳහා 2012 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී ඇති රු.5,586,731 ක මුදල අදාල විශ්‍රාම වැටුප් ගිණුම් වලට බැර නොකර උසස් අධ්‍යාපන ආයතන වලට ගෙවිය යුතු ජීවන වියදම් දීමනා වශයෙන් සටහන් කර තිබුණි.

**2.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 97 වගන්තිය. | විශ්‍රාම වැටුප් අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරීත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි. |
| (ආ) 1999 අප්‍රේල් 09 දිනැති අංක අමප/99/0438/11/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිලධාරින් වෙනුවෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන සියයට 25 ක මුදලින් සියයට 10 ක් විශ්‍රාම අරමුදලට බැර කළ යුතු වේ. එහෙත් ඊට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 මගින් සේවායයා විසින් අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන සියයට 15 ක දායක මුදලින් 8/15 ක ප්‍රමාණයක් විශ්‍රාම අරමුදලට බැර කිරීමට කටයුතු කර තිබුණි. 2012 විගණන වාර්තාව අනුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මෙ සම්බන්ධයෙන් සාකච්ඡා කලද එම ගැටළුව සඳහා නිශ්චිත විසඳුමක් ලබාගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.446,407,001 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.205,857,407 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.240,549,594 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ආයෝජන ආදායම රු.241,972,967 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කාර්ය සාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියැදි පරීක්ෂණය අනුව සේවා කාලය අවුරුදු 20 සම්පූර්ණ නොකර සේවයෙන් ඉවත් වූ සේවකයන්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවීමේදී වසර 01 සිට 05 දක්වා කාල ප්‍රමාදයක් ගත වූ අවස්ථා 07 ක් නිරීක්ෂණය විය.

(ආ) සේවා කාලය අවුරුදු 20 සම්පූර්ණ නොකල සේවකයන්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගිණුමේ ඇති දායක මුදල නැවත ගෙවීමේ දී අවසන්වරට පොළිය ගණනය කල දිනය සහ එම මුදල හා පොළිය ගෙවීම් කරන දිනයන් අතර කාල පමාවක් පවතින බැවින් දායකයාට අහිමිවන පොළී මුදල් ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය විය.

5. <u>පද්ධති හා පාලනය</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. විශ්‍රාම වැටුප් නියාමනයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ **2013** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව | | | |
|---|---|---|---|
| විෂය | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමු කර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ | වර්තමාන තත්වය |
| **2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම<br>**2.2.1** ගෙවිය යුතු ගිණුම් | ජීවන වියදම් ඇතුලත්ව විශ්‍රාම වැටුප් ගණනය කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කිරීමෙන් පසුව ඒ වෙනුවෙන් විශ්‍රාම වැටුපට බැර විය යුතු මුදල් පියවීම සඳහා 2012 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී ඇති රු. 5,586,731 ක මුදල අදාල විශ්‍රාම වැටුප් ගිණුම් වලට බැර නොකර උසස් අධ්‍යාපන ආයතන වලට ගෙවිය යුතු ජීවන වියදම් දීමනා වශයෙන් සටහන් කර තිබුණි. | එකඟ නොවේ.<br>2006 වර්ෂයේ සිට ජීවන වියදම් දීමනාව මත විශ්‍රාම වැටුප් ගණනය කිරීමට උසාවි නඩු තීන්දුව මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.<br>ඒ අනුව විශ්‍රාම වැටුප් අරමුදලේ සමාජිකයකු වශයෙන් සිට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ නොලබා සේවයෙන් ඉවත්ව ගිය සේවකයන් හට අයත් හිඟ ජීවන වියදම් දීමනාව මත වූ විශ්‍රාම වැටුප් දායකය අදාල විශ්වවිද්‍යාල මඟින් ඔවුනට ගෙවිය යුතු වේ. ඒ අනුව රු. 5,586,731/- ක් වූ මුදල වවුචර් අංක 45 යටතේ 2014/03/20 දින විශ්වවිද්‍යාල වෙත ගෙවා ඇත. | රු. 5,586,731/- ක් වූ මුදල වවුචර් අංක 45 යටතේ 2014/03/20 දින විශ්වවිද්‍යාල වෙත ගෙවා ඇත. |
| **2.2.2** නීති රීති හා රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම<br>(අ) **1978** අංක **16** දරණ විශ්විද්‍යාල පනතේ **97** වගන්තිය. | විශ්‍රාම වැටුප් අරමුදල විධිමත් කිරීම, පාලනය කිරීම සහ එහි කළමණාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලිය සකස් කර නොතිබුණි. | එකඟ වේ.<br>කෙටුම්පත් නියමාවලියක් සකස් කොට 2014/09/04 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. | 2014/09/04 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණය යටතේ පවතී. |
| (ආ) **1999** අප්‍රේල් **09** දින හා අංක අමප/**99/0438/11/033** දරණ අමාත්‍ය මණ්ඩල තීරණය. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිළධාරීන් වෙනුවෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන 25% ක මුදලින් 10 % ක් විශ්‍රාම අරමුදලට බැර කල යුතු වේ. එහෙත් ඊට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 මඟින් සේව්‍යයා විසින් අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන 15% ක ආයක මුදලින් 8/15 ක ප්‍රමාණයක් විශ්‍රාම අරමුදලට බැර කිරීමට කටයුතු කර තිබුණි. 2012 වර්ෂයේ විගණකාධිපති වාර්තාව අනුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදිද මේ සම්බන්ධයෙන් සාකච්ඡා කලද එම ගැටළුව සඳහා නිශ්චිත විසඳුමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් දායක මුදලෙහි ප්‍රතිශතය සංශෝධනය කිරීම සම්බන්ධව වරින් වර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාර නියෝජිතයින් සමඟ සාකච්ඡා වට කීපයක් පවත්වන ලදී. ඒ අනුව සකස් කල අමාත්‍ය මණ්ඩල සංදේශය 2014/05/12 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී ඇත. | සකස් කල අමාත්‍ය මණ්ඩල සංදේශය 2014/05/12 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී ඇත. |

| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව | | | |
|---|---|---|---|
| විෂය | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමු කර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ | වර්තමාන තත්වය |
| **3.** මූල්‍ය සමාලෝචන<br>**3.1** මූල්‍ය ප්‍රතිඵල | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 446,407,001 අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු. 205,857,407 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 240,549,594 ක වැඩි වීමක් පෙන්නුම් කෙරේ. මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය කෙරෙහි ආයෝජන ආදායම රු.241,972,967 කින් ඉහල යාම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | එකඟ වේ.<br>විශ්‍රාම වැටුප් අරමුදලේ මූලික අරමුණ වන්නේ විශ්‍රාමිකයන්ට වැඩි ප්‍රතිලාභයක් ලැබෙන පරිදි පවත්වාගෙන යාම වේ. එහිදී විශ්‍රාමිකයන්ගේ දායක මුදල් ආයෝජනය කර ලැබෙන පොළී ආදායම උපයෝගී කරගෙන විශ්‍රාම වැටුපට දායක වන්නන් සහ විශ්‍රාමිකයින්ට වාර්ෂිකව වැඩි පොළියක් ලබා දීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රතිඵල සම්බන්ධයෙන් විගණකාධිපති වරයාගේ අදහස් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එකඟ වේ. |
| **4.**මෙහෙයුම් සමාලෝචනය<br>**4.1** කාර්ය සාධනය | (අ) නියැදි පරීක්ෂණය අනුව සේවා කාලය අවුරුදු 20 සම්පූර්ණ නොකර සේවයෙන් ඉවත් වූ සේවකයන්ට ඔවුනගේ විශ්‍රාම වැටුප් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවීමේදී වසර 01 සිට 05 දක්වා කාල ප්‍රමාදයක් ගත වූ අවස්ථා 07 ක් නිරීක්ෂණය විය. | එකඟ නොවේ.<br>විශ්‍රාම වැටුප් අරමුදලේ සමාජිකයකු සේවයෙන් ඉවත් වූ දිනය සහ ගෙවන ලද දිනය පදනම් කරගෙන ප්‍රමාද කාලය ගණනය කිරීම නිවැරදි නොවේ. ඒ සඳහා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය විශ්රාම වැටුප් අංශයට භාර දුන් දිනය හා එම පුද්ගලයාට අදාලව මුදල් ලබා ගැනීම සඳහා වන කුවිතාන්සිය අත්සන් කරන ලද දිනය සලකා බැලීමෙන් පසුව ප්‍රමාද කාලය ගණනය කල යුතු වේ. | ප්‍රමාදයකින් තොරව අරමුදල් නිදහස් කරනු ලැබේ. |
| | (ආ) සේවා කාලය අවුරුදු 20 සම්පූර්ණ නොකළ සේවකයන්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගිණුමේ ඇති දායක මුදල නැවත ගෙවීමේදී අවසන් වරට පොළිය ගණනය කල දිනය සහ එම මුදල හා පොළිය ගෙවීම් කරන දිනයන් අතර කාල පමාවක් පවතින බැවින් දායකයාට අහිමි වන පොළී මුදල් ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>2014 වර්ෂයේ සිට දායකයාට පොළී අහිමි නොවන පරිදි ගෙවීම් සිදු කොට ඇත. | දායකයාට පොළී අහිමි නොවන පරිදි ගෙවීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| **5.** පද්ධති හා පාලන | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. විශ්‍රාම වැටුප් නියාමනයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය. | දැනට නියමාවලියක් සකස් කරමින් පවතී. | කෙටුම්පත් නියමාවලිය නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතී. |

# විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
## 2013.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| | 2013 වර්ෂය රුපියල් | 2012 වර්ෂය රුපියල් |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දිගුකාලීන ආයෝජන | 16,607,011,906 | 15,612,171,387 |
| ණය | 4,652,632,394 | 4,174,979,575 |
| | 21,259,644,300 | 19,787,150,962 |
| **ජංගම වත්කම්** | | |
| තොග | 115,978 | 137,247 |
| ලැබිය යුතු පොලිය | 2,859,352,445 | 1,692,094,329 |
| ලැබිය යුතු දායක මුදල් | 130,020,121 | 133,563,334 |
| ලැබිය යුතු අර්ථසාධක ණය වාරික | 27,755,563 | 28,831,961 |
| වෙනත් අත්තිකාරම් | 1,000 | 1,000 |
| මුදල් හා මුදල් සමාන වත්කම | 54,459,514 | 5,107,417 |
| | 3,071,704,621 | 1,859,735,288 |
| **අඩුකලා : ජංගම වගකීම්** | | |
| බදු | 253,651,637 | 123,550,316 |
| ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ | 25,864,332 | 20,732,015 |
| ගෙවිය යුතු ජීවන වියදම් දීමනා හිඟ දායක මුදල් | 153,337,883 | 270,399,312 |
| විවිධ ණයහිමියෝ | 391,189 | 466,506 |
| | 433,245,041 | 415,148,149 |
| **ශුද්ධ ජංගම වත්කම්** | 2,638,459,580 | 1,444,587,139 |
| **මුළු ශුද්ධ වත්කම්** | 23,898,103,881 | 21,231,738,101 |
| මූල්‍යායනය වන්නේ; | | |
| සාමාජික ගිණුම් ශේෂය | 23,457,619,698 | 20,832,082,627 |
| අක්‍රිය ගිණුම් සඳහා ප්‍රතිපාදන | 3,000,000 | 3,000,000 |
| ඉල්ලුම් නොකල ප්‍රතිලාභ සංචිත | 6,903,570 | - |
| රඳවා ගත් ලාභ | 430,580,613 | 396,655,475 |
| **අරමුදලේ ශුද්ධ වටිනාකම** | 23,898,103,881 | 21,231,738,102 |

අ. කලේ තිස්ස නන්දසේන
ලේකම්

අ. කලේ උභයකුල රණවීර
ගණකාධිකාරි

## විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| | 2013 වර්ෂය රුපියල් | 2012 වර්ෂය රුපියල් |
|---|---|---|
| ආදායම් | | |
| ආයෝජන ආදායම් | 2,454,618,499 | 1,751,025,815 |
| වෙනත් ආදායම් | 41,601 | - |
| මුළු ආදායම | 2,454,660,100 | 1,751,025,815 |
| අඩුකලා : ආදායම් බදු | (193,471,607) | (140,091,507) |
| බදු පසු ආදායම | 2,261,188,493 | 1,610,934,308 |
| මෙහෙයුම් වියදම් | (184,321) | (123,770) |
| **මෙහෙයුම් ලාභය** | 2,261,004,172 | 1,610,810,538 |
| | | |
| එකතුකලා : සංචිත | | |
| පොළී අනුපාතය සමාන කිරීමේ සංචිත | - | 281,650,220 |
| අක්‍රිය ගිණුම් සඳහා වෙන්කිරීම් | - | 5,000,000 |
| ආදායමට ගැලපීම් | 20,536,806 | 9,030,091 |
| පසුගිය වසරේ රඳවාගත් ලාභය | 396,655,475 | 115,683,608 |
| බෙදාහැරීම සඳහා ශුද්ධ ලාභය | 2,678,196,453 | 2,022,174,457 |
| සාමාජික ගිණුම් සඳහා පොළිය | (2,243,823,280) | (1,623,471,262) |
| අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළිය | (3,792,561) | (2,047,720) |
| ඉදිරියට ගෙන යන රඳවාගත් ලාභ | 430,580,613 | 396,655,475 |

## විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2013 වර්ෂය රුපියල් | 2012 වර්ෂය රුපියල් |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| බදු සහ වියදම් වලට පසුව ශුද්ධ ලාභය | 2,261,004,172 | 1,610,810,538 |
| <u>ගැලපීම්</u> | | |
| භාණ්ඩාගාර බිල්පත් අව මිල/අධි මිල | (22,723,257) | - |
| කපාහල විවිධ ණයහිමියන් | (41,601) | - |
| භාණ්ඩාගාර බිල්පත් විකිණීමෙන් ලද ලාභය/පාඩුව | 28,459,430 | - |
| ආදායම් බදු | 193,471,607 | 140,091,507 |
| මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය | 2,460,170,351 | 1,750,902,045 |
| | | |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම** | | |
| තොග වෙනස්වීම | 21,269 | (43,820) |
| ලැබිය යුතු ආයෝජන ආදායම් වෙනස්වීම | (1,167,258,116) | (422,854,453) |
| ණය වෙනස්වීම | (476,576,421) | (149,255,085) |
| ගෙවිය යුතු ජීවන වියදම් දීමනා වෙනස්වීම | (117,061,429) | 270,399,312 |
| විවිධ ණයහිමියන්ගේ වෙනස්වීම | 75,317 | 41,545 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල් | 699,220,337 | 1,449,189,544 |
| වර්ෂය තුල ගෙවන ලද ආදායම් බදු | (63,370,286) | (119,650,840) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | 635,850,051 | 1,329,538,704 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර තැන්පතු කල්පිරීම් | 5,666,200,000 | 5,050,000,000 |
| ස්ථාවර තැන්පතු ආයෝජන | (7,600,000,000) | (9,971,700,000) |
| අධිමිල බැඳුම්කර කල්පිරීම | - | 4,999,384 |
| ඉතිරිකිරීමේ තැන්පතු ගිණුම් අවසන් කිරීම | (93,920) | - |
| භාණ්ඩාගාර බැඳුම්කර විකිණීම/කල්පිරීම | 5,420,831,836 | 3,280,821,087 |
| භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීම | (4,487,473,004) | (394,571,571) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | (1,000,535,088) | (2,030,451,100) |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සාමාජික මුදල් ලැබීම් | 1,948,028,708 | 1,728,199,770 |
| සාමාජික මුදල් ගෙවීම් | (1,533,991,573) | (1,035,615,478) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | 414,037,135 | 692,584,292 |
| | | |
| මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම | 49,352,097 | (8,328,104) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන වත්කම් | 5,107,417 | 13,435,521 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන වත්කම් | 54,459,514 | 5,107,417 |

## විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| | සාමාජික ශේෂය | අක්‍රිය සාමාජික ගිණුම් සඳහා වෙන් කිරීම් | ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ සංචිත | පොළී අනුපාත සමාන කිරීමේ සංචිත | රඳවා ගන්නා ලද ලාභ | එකතුව |
|---|---|---|---|---|---|---|
| **2011.12.31 දිනට ශේෂය** | 18,501,983,566 | 8,000,000 | - | 281,650,220 | 115,683,608 | 18,907,317,394 |
| වෙන්කිරීම් ප්‍රතිවර්තනය කිරීම | - | (5,000,000) | - | (281,650,220) | 286,650,220 | - |
| සාමාජික පොළී | 1,623,471,262 | - | - | - | (1,623,471,262) | - |
| 2012 වර්ෂයේ අතිරික්තය | - | - | - | - | 1,610,810,538 | 1,610,810,538 |
| වර්ෂයට අදාල සාමාජික මුදල් | 1,749,849,911 | - | - | - | - | 1,749,849,911 |
| වර්ෂයට අදාල සාමාජික මුදල් නැවත ගෙවීම් | (1,031,244,558) | - | - | - | - | (1,031,244,558) |
| ගැළපීම් | (7,698,223) | - | - | - | 9,030,091 | 1,331,868 |
| සජීව වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැනීම් | (4,279,330) | - | - | - | - | (4,279,330) |
| අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී | - | - | - | - | (2,047,720) | (2,047,720) |
| **2012.12.31 දිනට ශේෂය** | 20,832,082,628 | 3,000,000 | - | - | 396,655,475 | 21,231,738,103 |
| | | | | | | |
| වර්ෂයට අදාල සාමාජික මුදල් | 1,944,485,495 | - | - | - | - | 1,944,485,495 |
| සාමාජික පොළී | 2,243,823,280 | - | - | - | (2,243,823,280) | - |
| වර්ෂයට අදාල සාමාජික මුදල් නැවත ගෙවීම් | (1,542,881,312) | - | - | - | - | (1,542,881,312) |
| සජීව වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැනීම් | (6,416,726) | - | - | - | - | (6,416,726) |
| ගැළපීම් | (6,622,361) | - | - | - | 20,536,807 | 13,914,446 |
| වෙන්කිරීම් | (6,851,306) | - | 6,851,306 | - | - | - |
| ගැළපීම් | - | - | 52,264 | - | - | 52,264 |
| අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී | - | - | - | - | (3,792,561) | (3,792,561) |
| 2013 වර්ෂයේ අතිරික්තය | - | - | - | - | 2,261,004,172 | 2,261,004,172 |
| **2013.12.31 දිනට ශේෂය** | 23,457,619,698 | 3,000,000 | 6,903,570 | - | 430,580,613 | 23,898,103,881 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

130

මගේ අංකය / எனது இல. / My No. ඊසී/බී/යූජීඑෆ්/1/13/06

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2014 දෙසැම්බර් 8 දින

UNIVERSITY GRANTS COMMISSION 10 DEC 2014 SECRETARY (2)

UNIVERSITY GRANTS COMMISSION 09 DEC 2014 CHAIRMAN (12)

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති.

පිටපත් :- 1. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94 11 2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No.
ඊසී/බී/යූපීඑෆ්/1/13/06

මබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2014 දෙසැම්බර් 8 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ජීවන වියදම් වලට අදාළ හිඟ අර්ථසාධක අරමුදල් දායකය ප්‍රතිලාභීන්ට බැර කිරීම සඳහා 2012 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. මිලියන 500 කින් රු.මිලියන 153.3ක් හිඟ ජීවන වියදම් දීමනාව ගණනය කර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජික ගිණුම් වෙත බැර කිරීමට කටයුතු නොකර ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

### 2.2.2. ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල විසින් මෙහෙයවා තිබූ අර්ථසාධක ආයක මුදල් අර්ථසාධක අරමුදලට පැවරීමේදී නිශ්චිතව හඳුනා නොගත් ශේෂ පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් හඳුනාගත නොහැකි ශේෂවල වටිනාකම රු.6,903,570 ක් විය. මෙම ශේෂ හඳුනා ගැනීමට කටයුතු නොකර ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ සංචිත ගිණුමට මාරුකර තිබුණි.

(ආ) සේවය අවසන් කළ සාමාජිකයන් වෙත නිකුත් කරන ලද රු. 19,400,886 ක් වටිනා චෙක්පත් අවලංගු කර වර්ෂ 02 සිට වර්ෂ 12 දක්වා කාල පරාසයක් ගතවී තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 91 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට රු.23,457,619,698 ක් වූ සේවක අර්ථසාධක අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 264 | සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් මුදල ලැබූ බවට ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සියකින් තහවුරු වියයුතු වුවත්, නියැදි පරීක්ෂාවට අනුව එකතුව රු.69,796,055 ක් වූ වවුචර් පත් 16 ක අදාල කුවිතාන්සි මඟින් ගෙවීම් තහවුරු කරවා ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ශුද්ධ ආදායම රු.2,261,004,172 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ශුද්ධ ආදායම රු.1,610,810,538 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.650,193,634 ක වර්ධනය සඳහා ආයෝජන ආදායම රු.703,592,684 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සැලසුම්ගත කාර්යයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඉදිරිපත් කර ඇති අතර 2011 /2012 ක්‍රියාකාරී සැලැස්ම අනුව වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකර ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) නියමාවලි සැකසීම.

(ආ) දායක මුදල් එකතු කිරීම හා පොළී ගණනය කිරීම.

(ඇ) අරමුදලට ලැබිය යුතු මුදල් අයකර ගැනීම.

(ඈ) සාමාජික අරමුදල් නිදහස් කිරීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

## විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව

| යොමුව | විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු | විගණකාධිපති වෙත යොමු කර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ | ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2015.07.31 දිනට |
|---|---|---|---|
| **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | | | |
| **2.2.1** ගිණුම්කරණ අඩුපාඩු | ජීවන වියදම් වලට අදාළ හිඟ අර්ථසාධක අරමුදල් දායකය ප්‍රතිලාභීන්ට බැර කිරීම සඳහා 2012 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. මි. 500 කින් රු. මි. 153.3 ක් හිඟ ජීවන වියදම් දීමනාව ගණනය කර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජික ගිණුම් වෙත බැර කිරීමට කටයුතු නොකර ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මෙම හිඟ ජීවන වියදම් දීමනාව සඳහා හිඟ දායක මුදල් ගෙවීමට ලද ප්‍රතිපාදන වලින් මේ වන විට රු. මි. 153.3 ක් ඉතිරිව ඇති අතර විශ්වවිද්‍යාල වලින් අදාල ගණනය කිරීම් ලැබුණු පසු 2014 වර්ෂයේදී දායක මුදල් ගෙවා නිම කිරීමට පියවර ගෙන ඇත. | මේ වන විට අදාල ගෙවීම් කිරීම සඳහා ලේඛණ අපවෙත ලැබෙමින් පවතී. අප විසින් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වෙත අදාල ලේඛණ ගෙවීම සඳහා ඉදිරිපත් කරන ලෙස තව දුරටත් දැනුම් දීමක් කර ඇත. |
| **2.2.2** ගෙවිය යුතු ගිණුම් | (අ) විශ්වවිද්‍යාල විසින් මෙහෙයවා තිබූ අර්ථසාධක දායක මුදල් අර්ථසාධක අරමුදලට පැවරීමේදී නිශ්චිතව හඳුනා නොගත් ශේෂ පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් හඳුනා ගත නොහැකි ශේෂ වල වටිනාකම රු. 6,903,570 ක් විය. මෙම ශේෂ හඳුනා ගැනීමට කටයුතු නොකර ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ සංචිත ගිණුමට මාරුකර තිබුණි. | අර්ථසාධක අරමුදලේ හඳුනා නොගත් ශේෂය සම්බන්ධ විමර්ශන කටයුතු කිරීමට කමිටුවක් පත්කල අතර, එම කමිටුවේ නිර්දේශ මත මෙම හඳුනා නොගත් ශේෂය පහත හේතු මත "ඉල්ලුම් නොකරන ලද ප්‍රතිලාභ සංචිත " ගිණුමට මාරු කරන ලදී.<br>*විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල ආරම්භ කිරීමේදී ඒ ඒ විශ්වවිද්‍යාල වල වෙන වෙනම පැවති ශේෂයන් 1974 වර්ෂයේදී ඒකාබද්ධ කිරීමේදී හඳුනා නොගත් ශේෂයන්ගේ එකතුවකින් මෙම ශේෂය සමන්විත වේ.<br>*අදාල ශේෂයන් අර්ථසාධක අරමුදල් සාමාජිකයින්ට ගෙවීම් කිරීමේදී තව දුරටත් මෙම හඳුනා නොගත් ශේෂයට ගැලපීම් කිරීමට සිදුවීම.<br>*අර්ථසාධක අරමුදල සම්බන්ධව කාලසීමා ආඥාපනතේ විධිවිධාන බල නොපාන බැවින් (1958 අංක 15 දරණ අර්ථසාධක අරමුදල් පනතේ 17.3 වන වගන්තිය අනුව) එය ආදායමට බැර කල නොහැකි වීම. | මෙම ශේෂය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කිරීමට පත්කරන ලද කමිටුවේ නිර්දේශ මත "ඉල්ලුම් නොකරන ලද ප්‍රතිලාභ සංචිත" ගිණුමට මාරු කර ඇත. |

| යොමුව | විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු | විගණකාධිපති වෙත යොමු කර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ | ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2015.07.31 දිනට |
|---|---|---|---|
| | (ආ) සේවය අවසන් කල සාමාජිකයන් වෙත නිකුත් කරන ලද රු. 19,400,886 ක් වටිනා චෙක්පත් අවලංගු කර වර්ෂ 02 සිට වර්ෂ 12 දක්වා කාල පරාසයක් ගතවී තිබුණි. | විශ්වවිද්‍යාල පනතේ 93 වගන්තිය අනුව සේවය අවසන් කර ඇති සාමාජිකයින් වෙත ඔවුන්ට හිමි අර්ථසාධක අරමුදල ගෙවීමට කටයුතු කරනු ලැබේ.<br><br>මෙම විගණන විමසුමේ දැක්වෙන රු. මි. 20 සම්බන්ධයෙන් සිහි කැඳවීම් නිවේදන 3 ක් යැවීමෙන් පසු චෙක්පත් අවලංගු කර ගෙවියයුතු අර්ථසාධක අරමුදල් ලෙස ගිණුම් ගතකොට ඇත.<br><br>1981අංක 15 දරණ අර්ථසාධක අරමුදල් පනතේ 17.3 වන වගන්තිය අනුව අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී කාලසීමා ආඥාපනතේ විධිවිධාන බලනොපාන බැවින් හා ඉල්ලූ විට ගෙවිය යුතු බැවින් මෙම මුදල් ආදායමට ගත නොහැකිය. | විශ්වවිද්‍යාල පනතේ 93 වගන්තිය අනුව සේවය අවසන් කර ඇති සාමාජිකයින් වෙත ඔවුන්ට හිමි අර්ථසාධක අරමුදල ගෙවීමට කටයුතු කරනු ලැබේ.<br><br>මෙම විගණන විමසුමේ දැක්වෙන රු. මි. 20 සම්බන්ධයෙන් සිහි කැඳවීම් නිවේදන 3 ක් යැවීමෙන් පසු චෙක්පත් අවලංගු කර ගෙවියයුතු අර්ථසාධක අරමුදල් ලෙස ගිණුම් ගතකොට ඇත.<br><br>1981අංක 15 දරණ අර්ථසාධක අරමුදල් පනතේ 17.3 වන වගන්තිය අනුව අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී කාලසීමා ආඥාපනතේ විධිවිධාන බලනොපාන බැවින් හා ඉල්ලූ විට ගෙවිය යුතු බැවින් මෙම මුදල්ආදායමට ගත නොහැකිය. |

| යොමුව | විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ | ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2015.07.31 දිනට |
|---|---|---|---|
| 2.3<br>**<u>නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>** | (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 91 වගන්තිය<br><br>සමාලෝචිත වර්ෂය අවසානයට රු. 23,457,619,698 ක් වූ සේවක අර්ථසාධක අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි. | කෙටුම්පත් නියමාවලිය සම්පාදනය කිරීම සම්බන්ධයෙන් පහත පියවර ගෙන ඇත.<br><br>1. 2012.05.17<br>කෙටුම්පත් නියමාවලිය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.<br><br>2. 2012 ඔක්තෝම්බර්<br>නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීමට අනුව කම්කරු දෙපාර්තමේන්තුව හා විශ්වවිද්‍යාල ප්‍රතාපාදන කොමිෂන් සභාව අතර සාකච්ඡා වාර ගණනාවක් පැවැත්වීම.<br><br>3. 2013.08.15<br>කම්කරු අමාත්‍යාංශයේ අදහස්ද සහිතව සංශෝධිත කෙටුම්පත් නියමාවලිය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.<br><br>4. 2014.02.11<br>නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් ඇතුළත් කරන ලද නව සංශෝධන පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් වැඩිදුරටත් අදහස් විමසීම.<br><br>5. 2014.03.28<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදාල නිලධාරීන්ගේ අදහස් විමසීමෙන් පසු අදාල නිරීක්ෂණ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.<br><br>6. මේ සම්බන්ධයෙන් දුරකථනයෙන් විමසීම් කරන ලද අතර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දන්වන ලද්දේ, නීති කෙටුම්පත්කරු සමඟ සාකච්ඡා කර අවසන් කෙටුම්පත අපවෙත ඉදිරිපත් කරන බවයි. | නියමාවලියක් සකස් කර ඇත. |

| යොමුව | විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු | විගණකාධිපති වෙත යොමු කර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ | ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2015.07.31 දිනට |
|---|---|---|---|
| | (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 264<br><br>සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් මුදල ලැබූ බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියකින් තහවුරු වියයුතු වුවත්, නායැදි පරීක්ෂාවට අනුව එකතුව රු. 69,796,055 ක වූ වවුචර්පත් 16 ක අදාල කුවිතාන්සි මඟින් ගෙවීම් තහවුරු කරවාගෙන නොතිබුණි. | අදාල විගණන විමසුමෙහි සඳහන් ගෙවීම් අර්ථසාධක අරමුදල් ණය සම්බන්ධ වවුචර්පත් වේ. ඒ සෑම ගෙවීමක් සඳහාම කුවිතාන්සියක් එවන ලෙස විශ්වවිද්‍යාල වෙත දන්වා ඇතත් එය සිදුනොවන අවස්ථා ඇත. මේ පිළිබඳව විශ්වවිද්‍යාල වෙත දන්වා ඇති අතර, තව දුරටත් මේ සම්බන්ධව සිහි කැඳවීම් කර කුවිතාන්සි ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. තවද චෙක්පත් නිකුත් කිරීමේදී අදාල විශ්වවිද්‍යාලයෙන් ලබාගන්නා ලිපියක් මත චෙක්පත් නිකුත් කරන අතර, අදාල ලිපිය, කුවිතාන්සිය ලැබෙනතුරු වවුචරයට අමුණා ඇත. | අදාල කුවිතාන්සි විශ්වවිද්‍යාල වලින් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. |
| 3.1 මූල්‍ය ප්‍රතිඵල | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ශුද්ධ ආදායම රු. 2,261,004,172 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ශුද්ධ ආදායම රු. 1,610,810,538 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 650,193,634 ක වර්ධනය සඳහා ආයෝජන ආදායම රු. 703,592,684 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි. | එකඟ වේ | එකඟ වේ |
| 4.1 ක්‍රියාකාරී සැලැස්ම | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සැලසුම්ගත කාර්යයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඉදිරිපත් කර ඇති අතර 2011/2012 ක්‍රියාකාරී සැලැස්ම අනුව වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකර ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. | වෛද්‍ය රක්ෂණය සම්බන්ධව පත්කරන ලද කමිටුවේ වාර්තාව අනුව සියලු වෘත්තිය සමිති සමඟ සාකච්ඡා කිරීමෙන් පසු වෛද්‍ය රක්ෂණ ක්‍රමය ආරම්භ කිරීමට පියවර ගනු ලැබේ. | වෛද්‍ය රක්ෂණ ක්‍රමය සම්බන්ධයෙන් අරමුදලේ සාමාජිකයන්ගේ කැමැත්ත ලබාගැනීම සඳහා චක්‍රලේඛයක් විශ්වවිද්‍යාල වෙත නිකුත් කර ඇත. |

138

| යොමුව | විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු | විගණකාධිපති වෙත යොමු කර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ | ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2015.07.31 දිනට |
|---|---|---|---|
| 5.පද්ධති හා පාලන | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය. | | |
| | 1. නියමාවලි සැකසීම | නියමාවලිය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අවසන් අදියරේ පවතී. | නියමාවලියක් සකස්කර ඇත. |
| | 2. දායක මුදල් එකතු කිරීම හා පොළී ගණනය කිරීම | සාමාජිකයාගේ දායක මුදලින් 99.6% ක්ම නියමිත වේලාවට එකතු කරනු ලැබේ. පොළී ගණනය කිරීමද නිවැරදිව කරනු ලැබේ. | අදාල දායක මුදල් නියමිත වේලාවට එකතු කරනු ලැබේ. පොළී ගණනය කිරීමේදී නිවැරදිව කරනු ලැබේ. |
| | 3. අරමුදලට ලැබිය යුතු මුදල් අයකර ගැනීම | අරමුදලට ලැබිය යුතු සියලු මුදල් නිසි පරිදි වේලාවට අයකර ගනු ලැබේ. | අරමුදල් නිසි පරිදි වේලාවට අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| | 4. සාමාජික අරමුදල් නිදහස් කිරීම | සාමාජික අරමුදල් නිදහස් කිරීම විශ්වවිද්‍යාල පනතේ 93 වගන්තියට අනුව සිදු කරනු ලැබේ. | සාමාජික අරමුදල් නිදහස් කිරීම විශ්වවිද්‍යාල පනතේ 93 වගන්තියට අනුව සිදු කරනු ලැබේ. |

විගණකාධිපති වාර්තාව/-